# 2022 පෙබරවාරි මස 02 වන දින පෙරවරු 9.30 ට මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදි පවත්වන ලද මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 01. | නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.ලලිත් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | එෆ්.බී.නිලංක සිල්වා මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.කුමාර රාජරත්න මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.සුදර්ශනී ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුණි අද සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරිමට පෙර අපිට තාවකාලික ලේකම්වරයෙක්ව පත්කර ගන්න ඕනා. මම සභාවට නමක් යොජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, පෙබරවාරි මාසේ පැවැත්වෙන මහා සභාව වෙනුවෙන් තාවකාලික ලේකම්වරිය ලෙස ජී.එස්.එල්. පෙරේරා මහත්මිය යෝජනාකර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත තාවකාලිකව වැඩ බලන නාගරික ලේකම් ජී.එස්.එල් පෙරේරා විසින් 2022.02.02 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.</u>

2022.01.06 දින පැවති මහා සභා වාර්තාව.

<u>මහා නගර සභා මන්ත්‍රී, එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2022.01.06 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා ඉදිරිපත් කර සිටිනවා.

මහා නගර සභා මන්ත්‍රී ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා විසින් ස්ථිර කරන ලදි.

ඒ අනුව 2022.01.06 දින පැවති මහ සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02** <u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

**2(1)** ගරු මන්ත්‍රීවරුනි, අද දිනයෙදි සභාවට සහභාගි නොවන බවට ගරු මහා නගර සභා මන්ත්‍රී සුනිල් නන්දසිරි මාසකෝරාල මහතා, යූ.ඒල්.සේනක දමයන්ත සිල්වා මහතාත්, ආර් ක්‍රිෂණි ප්‍රනාන්දු මහත්මියත්, පෞද්ගලික කටයුත්ක් හේතුවෙන් නෙපැමිණෙන බව දන්වා එවා තිබෙනවා.

මහා නගර සභා මන්ත්‍රී ෆැන්සිස් ප්‍රනාන්දු මහතාත් යූ.ප්‍රසන්න මනෝජ් ප්‍රනාන්දු මහතා අද දිනයේදි අසනිප තත්වයනුත් හේතු කොටගෙන සභාවට සහභාගි නොවිම සම්බන්ධයෙන් දන්වා එවා තියෙනවා.

## 03 සභාව අමතා එවන ලද ආයවනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබිම.

### 03(01) මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනි, මොරටුව නගර සභාව තුල ප්‍රධාන ආදායමක් විධියට වරිපනම් ලබා ගන්නවා. සංවර්ධන කටයුතු සහ කම්කරුවන්ගේ සාමාන්‍යයෙන් පඩි ගෙවන ආදායමක් විධියට අතිකාල දිමනාව සඳහා වරිපනම් යොදවගන්නවා. ගරු නගරාධිපතිතුමනි, ජනවාරි මාසේ පළවෙනිදා සිට ජනවාරි 31 දක්වා සියයට ගානක වට්ටමක් ලබාදෙනවා වරිපණම් බදු ගෙවන ජනතාවට ජනවාරි 01 සිට 31 දක්වා බදුගෙවන ජනතාව විශාල ප්‍රමාණයක් මොරටුව මහා නගර සභාවේ වරිපනම් අංශයේ ක්‍රවුන්ටර්ස්වල පෝල්ම් ගැහිලා වරිපනම් බදු ගෙවන්න හිටියා. මමත් පහුගිය කාලේ ඒක දැක්කා. ගරු නගරාධිපතිතුමනි, රටේ තියෙන කොවිඩ් වසංගත රෝගයක් දැන් මේ කාලේ වෙන කොට ඕමික්ක්‍රොන් කියන කොවිඩ් රෝගය ඉතාමත් සිඝ්‍ර ලෙස ලංකාව තුල ව්‍යාප්ත වෙලා තියෙනවා. ඉතින් මම කියන්නේ වරිපණම් ගෙවන ජනතාව අපි හිතන්නේ ආදායමක් අපිට ආයතනයකට හරි සභාවකට හරි භාර දෙනවානම් එකෙනා අපි රජෙක් විධියට තමයි සලකන්න ඕන. මේ වරිපනම් ගෙවන ජනතාව අපි රජෙක් විධියට තමයි සලකන්න ඕන. එතකොට මේ මහ නගර සභාවට පෝලිම් වල ඉදලා පැයක් එකාමාරක් සමහරක් විට වරිපනම් ගෙවන ජනතාව පොලිම් වල ඉන්නවා. ඒ ඉන්න අවස්ථාවේදි අව්ව වැටෙනවා. දුරස්ථ ප්‍රමාණය තියාගෙන නැහැ. මම කියන්නේ අපි වරිපනම් ගෙවන ජනතාවට මේ සභාවෙන් සලකන ක්‍රමවේදය මදි කියන එක යාබද දෙහිවල නගර සභාව ගත්තොත් දෙහිවල නගර සභාව තුල වරිපනම් ගෙවන්න වෙනම ගොඩනැගිල්ලක් හදලා පුටු තියලා ලැස්ති කරලා ලස්සන ක්‍රමවේදයකට ගිහිල්ලා තියෙනවා. මම කියන්නේ ඒ ගොල්ලන්ට අපි සලකන්න ඕන කියන හැගිම අපි මේ අවස්ථාවේදි සභාවේ අවධානය යොමු කරන්න ඕන. ඒවගේම තමයි ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට අද මොරටුව මහා නගර සභාව තුල අපි ගත්තොත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව මේ වෙනකොට ඉතාමත් රෝගි තත්වයට පෙලෙන අංශයක් බවට පත්වෙලා තියෙනවා. අද වෙනකොට ඉංජිනේරුතුමිය නැහැ. ඒවගේම ටි.ඕ මහත්තයෙක් අද වෙනකොට අසනිපවෙලා තියෙනවා. නම් වශයෙන් කියන්න බැහැ. හය හත්දෙනෙක් මේ වෙනකොට ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ රෝගි තත්ත්වයට පත්වෙලා ගෙවල්වල ඉන්නවා ගරු නගරාධිපතිතුමනි. ඉතින් එම නිසා මම කියන්නේ, ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ඉන්න කට්ටියටත් අවධානමක් තියෙනවා සභාව තුල. ගෙදර ඉදන් හරි එ කාඩර් එක හැමදාම ගෙන්නන් නැතිව හරි ක්‍රමවේදයක් සලසන්න මොකද මේක ව්‍යාප්ත වුනොත් මුළු නගර සභාව වහන තත්ත්වයට පත්වෙන්න පුළුවන්.

#### නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා

ගරු මන්ත්‍රිතුමා, මේ රට ක්‍රියාත්මක කිරිම සඳහා අපිට එවලා තියෙනවා සෞඛ්‍ය උපදෙස් මේ උපදෙස් අනුව තුන්වෙනි එන්නත විදලා තියෙනවානම් ගෙදර මොනතරම් කොවිඩ් රෝගින්

හිටියත් ඔවුන් සේවයට වාර්තා නොකලොත් ඔහු නොපැමිණි සේවකයෙක් ලෙස සලකන්න කියලා චක්‍රලේඛන නිකුත් කරලා තියෙනවා. ඒ නිකුත් කරලා තියෙන වේලාවක ඔබතුමා ඔය කියන දේ අපිට කරන්න බැහැ. එහෙම කරාම සේවකයාට අසාධාරණයක් වෙන්නේ. ඒ නිසා සෞඛ්‍ය මාර්ගෝපදේශ සලකලා කටයුතු කරන්න ඔබතුමාට වැඩිය අපි උත්සාහ කරනවා. ආණ්ඩුව යම් කටයුත්තක් කරන්න ඉස්සෙල්ලා සේවකයෝ සියයට 25 ගෙන්නුවා 50 ගෙන්නුවා. දැන් එහෙම එකක් නැහැ තුන්වෙනි එන්නත විදලා තියෙනවා නම් ගෙදර මොන රෝගියෙක් හිටියත් ඔහු සේවයට වාර්තා නොකලොත් ඔහු සේවයට නොපැමිණි සේවකයෙක් ලෙස සලකනවා. එනිසා ඔබතුමා ඔය කියනදේ අපිට කරන්න බැහැ. ඔබතුමාත් මොරටුව මහා නගර සභාවේ කිවෙනි වරට පත්වේච්ච මන්ත්‍රී කෙනෙක්ද එ නිසා එවත් එක්ක කටයුතු කරනවා ඇරෙන්න කියන්නම් වාලේ කියන්න එපා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කිව්වේ අවධානම ගැන එවගේම අපේ ආදායම් ගණකාධිකාරතුමා අද වෙනකොට අසනිපයි. අපේ ලේකම්තුමා අසනිපයි. මම කියන්නේ අවධානමක් තියෙනවා එකට ක්‍රමයක් යොදවන්න කියලා.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අමුතුවෙන් යොදවන්න ක්‍රම නැහැ. මෙන්න මේක විතරයි ක්‍රමයකට තියෙන්නේ මේවා එක්ක අපි ඉන්න ඕනෑ. රට දුවන්න ඕනෑ. වෙන මුකුත් නැහැ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ ක්‍රමයක් පුලුවන්නම් එකට යොදවන්න. අනෙක තමයි ගරු නගරාධිපතිතුමනි, දැන් මොරටුවේ ඩෙංගු විශාල ලෙස වර්ධනයවීමක් තියෙනවා දවසින් දවස සතියෙන් සතිය මම කියන්නේ මේකට අපි ගන්න පුලුවන් සියලුම සෞඛ්‍ය කටයුතු ජනතාව වෙනුවෙන් කරන්න කියන එක මොකද ඔමික්‍රොන් කොවිඩ් රෝගය වගේ ඩෙංගු රෝගය වර්ධනය විම වුනොත් මොරටුවේ ජනතාවට සභාවක් විදියට කරන අසාධාරණයක් විදියට තමයි විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් විදියට මම හිතන්නේ. අපිට වගකීමක් තියෙනවා. එමනිසා මේකට පුලුවන්තරම් සෞඛ්‍ය අංශයේ පි.එච්.අයි මහත්වරු එවගේම අපේ ඉන්න සෞඛ්‍ය කමිටුව සම්බන්ධ කරගෙන ඉතා ඉක්මණින් කටයුත්තක් කරන්න පුළුවන්නම් හොදයි කියන එක මම මේ සභාවට කියනවා. මේ තියෙන තත්වය ඉතාම ඉක්මණින් සමථයකට පත්වේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

**03(02)** **<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පැමිණිල්ලක් තියෙනවා කරන්න අද දකුණේ මාර්ග කිහිපයක ඔබ දන්නවා අපි විසින් ජලය බැස යාම සඳහා සකස් කරන ලද ලයින් එකේ යකඩ කැලි ටික ගලවගෙන ගියා. දැන් පාර මැද්දේ වලවල් කිහිපයක් තියෙන්නේ. විශාල අනතුරක් තියෙනවා. දැන් දවස ගානේ පැමිණිලි ලැබෙනවා මිනිස්සු ඒ මාර්ගවල අවධානමට මුහුණ දෙනවා. මේක නගරාධිපතිතුමනි කල්ගතයුතු එකක් නෙමෙයි. මාස දෙකකට වැඩි කාලයක්. ඒ නිසා අද ඔබතුමා මේ අපේ ඉංජිනේරු අංශයට කථාකරලා මම හිතන්නේ ගියා මැනගෙන ආවා යම් ක්‍රියාවලියක් සිද්ධ වුනා. හැබැයි ඒ ක්‍රියාවලිය සිද්ධ වුනාට එතනට විසඳුම හම්බවෙලා නැහැ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා ජයමාල් මන්ත්‍රීතුමා එවෙලාවේ ම පොලිසි ගිහිල්ලා පොලිසියේ පැමිණිල්ලකුත් දැම්මා. දැන් දිගින් දිගටම මේ කටයුත්තේ නියැලෙන එක සම්බන්ධයෙන් පොලිසිය මේ වෙනකොට පරික්ෂණ වාර්තාත් කරනවා. නමුත්, පැහැදිලිවම ඉංජිනේරු දෙපාර්තමේන්තුවට වාර්තා කරලා තියෙනවා දැන් මේක යකඩ වලින් කරන්නේ නැතිව කොන්ක්‍රිට්වලින් කරන්න හදන්නේ. ඒ සඳහා අද සභාවට සිමෙන්තිවල ප්‍රශ්ණයක් තියෙන නිසා අපි හෙට අනිද්දා වෙනකොට මේක සම්පූර්ණයෙන් ඉවර කරන්න. ගරු මන්ත්‍රීතුමාලා තුන්දෙනෙක් නෙමෙයි හතරදෙනෙක් විතර පැමිණිලි කරලත් තියෙනවා. පොලිසියට එකක් ජයමාල් මන්ත්‍රීතුමා ප්‍රදිප් ශ්‍රියන්ත මන්ත්‍රීතුමා නම් අනිවාර්යෙන් පැමිණිලි කරා කියලා දන්නවා පොලිසියට ගිහිල්ලා. එක නිසා මම හිතන්නේ මේ වෙනකොට ඉංජිනේරු දෙපාර්තමේන්තුව දැනුවත් වෙලා තියෙනවා. කොහොම හරි ඉතා ඉක්මණට මේක යථා තත්ත්වයට පත්කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම කියන්නේ ඔබතුමා දිනයක් දිලා මොකද දන්නවා ද ක්ෂණික විසඳුම තමයි මිනිස්සුන්ට හානි වෙන එක වළක්වන එක. ඊළඟට නැවත මේවා නොවෙන්න වග බලා ගැනීම ඒ නිසා දැනට අනතුරු වෙමින් තියෙනවා. මේක මහා ලොකු වැඩක් නෙමෙයි ඉතාම පොඩි වියදමකින් අනතුර වළක්වන්න පුළුවන්. අනතුරුවලට අපි මුහුණ දිපු සභාවක් එ නිසා ඉක්මණින්ම දිනයක් දිලා කරලා දෙන්න. මහා සිමේන්ති කන්දරාවකුත් යන එකක් නෙමෙයි. මම හිතන්නේ ලෑලි 10ක් 12 ක් තමයි දාගන්න තියෙන්නේ. එ වැඩේට නියෝගයක් දීලා ඉක්මණින්ම එක කරලා දෙන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් ඔබතුමා කිව්වා කොන්ක්‍රිට්වලින් දානවා කියලා. කොන්ක්‍රිට්වලින් දාපු පියසේන මාවත පහුවෙනිදාම කඩාගෙන වැටුනා. මම හිතන්නේ කොන්ක්‍රිට් වැඩේ සාර්ථක නැහැ. අපි යකඩ වලින් දාලා කොන්ක්‍රිට් බේස් එකක් හරි දාලා එක ආරක්ෂා කරානම් හරි. අචිනි මිස් ගිහිල්ලා 19 වෙනිදා සොරෝලේට ඉස්සෙල්ලා දැම්මා. නමුත්, 20 වෙනිදා ආයේ කඩාගෙන ගියා. ඉංජිනේරුවරු ඉන්නවා, කඩාගෙන වැටෙනවාට මොකක් හරි කරලා දෙන්න නගරාධිපතිතුමා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා නිශාන්ත මන්ත්‍රීතුමාට මේ කාරණය මතු කිරිම සම්බන්ධයෙන්. මම දිගින් දිගටම එක කිව්වා අපිට සිමෙන්ති ප්‍රශ්නයක් තියෙනවා නම් යකඩ ප්‍රශ්නයක් තියෙනවානම් එක විසඳගන්නකම් මේක වහාම කරන්න ඕන වැඩක් තියෙනවා. මම වරින් වර ඉංජිනේරු අංශයට ගිහින් කිව්වා. අඩු ගානේ ලෑලි ටිකක් දාලා මිනිස්සු වැටෙන එක නවත්වන්න ඕන අපි.එක කරමු ඒක කරලා ඊට පස්සේ විසඳුමකට යමු. දැනට මොනවාහරි හඳුනගත්ත තැන්වලට ගිහිල්ලා තාවකාලිකව විසඳුමක් හරි දෙන්න. වාහන වැටෙනවා මිනිස්සු වැටෙනවා. එක නිසා කරුණාකරලා එකට මැදිහත්වෙන්න.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීවරුනි, ඉංජිනේරු අංශයෙන් අද ඔබතුමියනේ ඉන්නේ, කොමසාරිස්තුමා දැන් මේ රටේ මේක හොරකමක් සේ සලකන්නේ නැහැ. 1800 නෙමෙයි 2000ට හරි සිමෙන්ති කොට්ටේ මිලදී ගන්න වෙලා තියෙන්නේ සම්මත මිලෙන් ඔබ්බට ගිහිල්ලා හරි අපිට මේක ගන්න වෙනවා මොකද සම්මත මිලෙන් ඔබ්බට ගියා කියලා ඔඩිට් වෙනවානම් ඉතින් එ මොකක් හෝ ආයතනයකට වගකිම් වලින් බැහැර වෙන්න වෙනවා. අපිට වගකිම් වලින් බැහැර වෙන්න පුළුවන්, සම්මත මිලට ගන්න නැහැ එකනිසා බැහැ කිය කිය. එහෙම වෙන්න බැහැ. සම්මත මිලෙන් ඔබ්බට යන්න වෙනවා. ඔබ්බට ගිහිල්ලා ගන්න වෙනවා. එක රටේ තියෙන පවතින තත්ත්වය නම්. එ තත්ත්වයට මුහුණ දෙන්න ලියලාම ෆයිල් එක පටන් ගන්න. සම්මත මිලෙන් ඔබ්බට යන්න වෙනවා මේ කාර්යය කරන්න ගන්න මේ කාර්යයට අදාළ වෙන සිමෙන්ති ප්‍රමාණය ගන්න. අරගෙන ඒ කටයුත්ත කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් අපි සිමෙන්ති ගන්නේ මොකක් හරි හාඩ්වෙයාර් එකකින්ද? නගර සභාවට සිමෙන්ති ගන්න ක්‍රමවේදය මොකක්ද?

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, හාර්ඩ්වෙයාවලින් නේන්නම් සිමෙන්ති ගන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ නැද්ද සභාවෙන් සංස්ථාවට සල්ලි බැදලා ඒ යාර්ඩ් එකෙන් ගන්න. අපිට පිටරටින් කථා කරලා කියනවා නගර සභාවට වෙන් කරලා තියෙනවා සිමෙන්ති. පුළුවන්නම් ඒ හරහා සිමෙන්ති අරගෙන දෙන්න කියලා. ඒ නිසා අපිත් මොකක් හරි ක්‍රමවේදයක් තියාගන්න ඕනැ. මට ආරංචි වුනා සංස්ථාවට සල්ලා බැන්දාම අවශ්‍ය සිමෙන්ති ප්‍රමාණය පිළියන්දල යාර්ඩ් එකෙන් අපිට මිලදී ගන්න පුළුවන්. එහෙම ක්‍රමවේදයකට අපි යන්නේ නැද්ද?

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම ඒකට ගොඩක් උත්සහ කරා. ක්‍රමවේද තුනකට මම ගියා. මම ඒගොල්ලන්ට ගිහිල්ලා කිව්වාම ඒගොල්ලො දෙන්නේ නැහැ. මම කථාකරාම ඉන්ෂි ආයතනය කියන්නේ සංස්ථා සිමෙන්ති හදන ආයතනය. අපිට බොහෝ උදව් කරනවා ලංකාවේම අපිට විතරයි නොමිලේ ප්‍රවාහනය කරන්නේ අපේ අවසාන කසළ එකතුවෙන ප්‍රමාණයට ඔවුන් අපිට නොමිලේ කරන්නේ ඔවුන් විතරයි. ඒකනිසා අනෙක් හැම ආයතනයකින්ම ගෙනියන ප්‍රමාණයට ගන්නවා. අපිට විතරයි එක නොමිලේ කරන්නේ. ඒගොල්ලන්ට අපි තුන්පාරක්, කොමසාරිස්තුමා එක පාරක් මම දෙපාරකුත් ලියුම් ලිව්වා. කරුණාකරලා ඒගොල්ලන්ගේ යාර්ඩ් එක තියෙන්නේ මේ පිළියන්දල අපිට ගෙනල්ලා දෙන්න එතනින් අපි ගන්නම්. අපිට කථා කළේ නැහැ. විවිධාකාර විදියට සිමෙන්ති ගන්න උත්සාහයන් අරගෙන තියෙන්නේ. ලිපි ඕනනම් මම සභාගත කරන්නම්. දැන් ඕනනම් සභාගත කරන්නම්. ඒ උත්සහයවල් එකක්වත් අතහැරලා නෙමෙයි කථා කරන්නේ ඔක්කොම කරලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, සිමෙන්ති නැති නිසානේ අපි ඉල්ලීමක් කරන්නේ. අපි ඊළඟට සිමෙන්ති තියෙන කාලෙත් ඒ හරහා වැඬේ කරමු. ඒ ආයතනයට සම්බන්ධවෙලා වැඩ කරාම අපිට ඕන වෙලාවක සිමෙන්ති හම්බවෙනවා.

<u>**නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මේ වෙනකොට මේ ගලි ප්‍රශ්ණය හොරකම් කරපු හෙරොයින් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා ඉන්න අයගේ මොනවා හරි පොලිසියෙන් හොයාගත්ත දෙයක් තියෙනවාද? එහෙම පණිවිඩයක් අපිට ලැබිලා තියෙනවාද?

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා, පොලිසියෙන් හොයාගන්න කියන්නේ සිසිටිවි කැමරා වලින් ගන්න ඒවායෙන් හරියට අඳුන ගන්න බැහැ කියලා තමයි කියන්නේ.

**03 (03)** <u>**නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම සාමාන්‍යයෙන් මොරටුව අවට අය තමයි හොරකම් කරන්නේ. පොලිසියේ ලොකු දුර්වලකම් තියෙනවා. ඊයෙත් මම එක්කෙනෙක්ට ගැහුවා අත පණින්න අපි අල්ලා දුන්නාම පහුවෙනිදා ගෙදර ඇවිල්ලා. එවගේ ප්‍රශ්න ගොඩක් තියෙනවා. මගේ යාර්ඩ් එකේ බඩු හොරකම් කරලා. බලනකොට කුඩුකාරයා පහුවෙනිදා ගෙදර ට්‍රැක්ටරයක නැගලා යනවා. ඉතින් ඕවගේ ප්‍රශ්න තියෙනවා. ඒ ගන්න ක්‍රියා මාර්ග ඉතාම දුර්වලයි. අනික හොරා අපිම අල්ලා දුන්නොත් තමයි පොලිසියෙන් නඩු දාන්නේ. කිසිම දවසක පරික්ෂණයක් කරන්නේ නැහැ. විමර්ශනයක් කරලා හොයලා බලලා කරන්නේ නැහැ. ඒගොල්ලෝ පුටුවට වෙලා ඉන්න එක තමයි ගොඩක් නිලධාරින් කරන්නේ. එනිසා එහෙම ප්‍රශ්ණ තියෙනවා. හැබැයි ඉතින් අනෙක් පැත්තේ වැඩ ටිකනම් එවිදියට වෙනවා. එගොල්ලන්ගේ පහසුකම් ටික අදාළ තැන්වලින් ඒ ආකාරයෙන් යනවා. අද මොරටුව ප්‍රදේශය ගත්තොත් විශාල වශයෙන් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙච්ච මිනිස්සු අද තරුණයෝ විශාල පිරිසක් අයිස් කියන මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වෙලා තියෙනවා. ඔබතුමා පොඩ්ඩක් මම හිතන්නේ ඔබතුමාගේ ප්‍රදේශයට වඩා විශාල වශයෙන් ඉන්නවා අපේ ප්‍රදේශවල. මේවට කිසිම ක්‍රියාමාර්ගයක් නැහැ. අපි දේශපාලඥයන් වශයෙන් රටේ වැඩිහිටියන් වශයෙන් අද තරුණ සමාජය විශාල වශයෙන් ඇබ්බැහිවෙලා තියෙනවා. නිකම් මේ කසිප්පුකාරයෙක් අල්ලලා දානවාට වඩා ක්‍රියාමාර්ගයක් තියෙනවා ටැබ්ලට් අරවා මේවා කුඩු ඒවගේ කිසිම අඩුවක් නැහැ. උදාහරණ වශයෙන් ඒගොල්ලන්ව අල්ලා දුන්නොත් ඊට පහුවෙනිදා ගෙදර මම මේ පොලිස් දෙපාර්තමේන්තුවට නෙමෙයි නිතිපති දෙපාර්තමේන්තුවටත් මේක මම සඳහන් කරනවා. මොකද පොලිසිය සඳහන් කරනවා නිතිපතිතුමා චක්‍රලේකයක් එවලා තියෙනවා කියලා කුඩු ග්‍රෑම් 04 කට වඩා අහුවෙන්න ඕන ඇපදෙන්න. ග්‍රෑම් 05 වඩා අහුවෙන්න ඕන එක හරි

වැරදි. මම මොරටුවේ නියෝජ්‍ය නගරාධිපතිතුමා වශයෙන් රජයටත් මේක සඳහන් කරනවා ජනාධිපතිතුමාටත් සඳහන් කරනවා. මම හිතන්නේ මාධ්‍යයෙන් මේක ලියනවානම් වඩා හොඳයි. අපි දැඩි විරෝධය මේ රජයේ හා ජනාධිපතිතුමාට සඳහන් කරනවා නිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා නීතිපතිතුමා තමයි මේ චක්‍රලේඛනය එවලා තියෙන්නේ. නීතිපතිතුමාව දැනුවත් කරලා රජයක් වශයෙක් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා සඳහන් කරනවා. ගන්ජා මිටියක් අහුවුනොත් පහුවෙනිදා උසාවි දානවා කුඩු ග්‍රෑම් 04 අහුවුනාම පහුවෙනිදා නිදහස්. ඉහල අධිකරණයෙන් යන්න එන එක පහල අධිකරණයෙන් ඇප දෙනවා. මේවා නිසා තමයි මේ හොරකම විශාල වශයෙන් සිදුවෙන්නේ මේ කුඩු කට්ටිය විශාල වශයෙන් හැමදාම කාටහරි විනයක් තමයි සිදුවෙන්නේ. පොලිසියෙන් මේකට හරියට ක්‍රියාමාර්ග ගන්නවා නම් අඩු තරමේ ඒගොල්ලන්ව කදවුරු ගතකිරීමේ හැකියාවක් තියෙනවා. එකවත් සිදුවෙන්නේ නැහැ. සරත් වීරසේකර මැතිතුමා සඳහන් කරා ඔවුන්ව පුනුරුත්ථාපනය කිරිමේ වැඩසටහනක් කරන්න මොරටුවේ එකවත් හරියට සිදුවෙන්නේ නැහැ. ඒ නිසා ඒකත් මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. හොරකම් වැඩිවෙන්න හේතුව තමයි. ගරු නගරාධිපතිතුමණි, ප්‍රධාන හේතුව නිසි දඩුවම් නොලැබිම.ඉතින් නිසි දඩුවම් ලබාදෙන්න කියල මම ඉල්ලිමක් කරනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු නියෝජ්‍ය නගරාධිපතිතුමා, දැනුවත් කිරිම හොදයි. මම හිතන්නේ මාධ්‍යවේදින් විදියට මේ පිළිබදව පුළුල් ලෙස මේක ලියනවා නම් හොදයි. මම මේ සම්බන්ධයෙන් ලියපු ලියුමක් ඕනනම් මම සභාගත කරන්න කැමතියි. ජනාධිපතිතුමාට ලිව්වා මේ නිතිපති අරගෙන තියෙන තීන්දුවේ බරපතලකම හේතුව තමයි ග්‍රෑම් 05 කට වඩා කියන්නේ කන්හැන්දෙන් ගත්තොත් 5000ක් විතර පැකට් එතකොට එක 02ට අඩුකරලා තියෙනවා. 05 වැඩිකරලා තියෙනවා 02 එක. එකනිසා අල්ලන අල්ලන හැමකෙනාම එවේලේම ඇපදෙන්න මහේස්ත්‍රාත්ට පුලුවන්කම තියෙනවා. එක නිසා කරුණාකරලා 02 නෙමෙයි පුලුවන්නම් 01 කරන්න කියලා මම ලියුවා හරිගුප්තා මැතිතුමාට ලියුවා නිති අංශයට ලියලා ගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කලා. මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා. එක පැත්තකින් ගත්තාම මේ ඉන්න එච්.කියු.අයි මහත්තයා මේ වෙනකොට අයිස් අල්ලලා පත්තර වලත් පලවෙලා තියෙනවා. කුඩු ඇල්ලුවා ලොකු ප්‍රමාණයක් කරගෙන කරගෙන යනවා. එකම දේ තියෙන්නේ ග්‍රෑම් 05 වඩා ලග තියාගන්න කවුරුත් ග්‍රෑම් 02 තියෙනවා ඕන කෙනෙක්ගාව බය නැතුව තියාගෙන ඉන්නවා මේ නිතිය වෙනස් වෙන්න ඕන. එක නිසා මාධ්‍යවේදින් මේක පොල්ගෙඩි අකුරින් ලියන්න මොරටුව මහා නගර සභාව මේකට දැඩිසේ විරුද්ධයි. මෙය මේ විදියට දැනුවත් කිරිම් කරලා තියෙනවා එක නිසා මෙක ග්‍රෑම් 02 ට නෙමෙයි පවතින්නාවු නිතිය ග්‍රෑම් 02 නම් 02ට නෙමෙයි මෙය එකක් සේ අඩුකරලා ඔවුන්ව අනිවාර්යෙන්ම හයිකොට් එකෙන් ඇපගන්න පුලුවන් විදියට හැදුවා නම් මම හිතනවා මේක මීට වඩා සමාජගත විම වැලැක්වෙනවා. ඒකනිසා 02 පහ කරලා නෙමෙයි. 02 එක කරලා මේක කරානම් බෝහෝසේ වටිනවා.

**03 (04)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් කොවිඩ් පැතිරිම ඉතාමත්ම වේගයෙන් සිදුවෙමින් පවතිනවා. විශේෂයෙන්ම මොරටුව මහා නගර සභා පරිශ්‍රය තුල අපේ නිලධාරින් ඉදලා පහළ සේවකයන්

දක්වා කොවිඩ් පැතිරීම ඉතාමත් වේගවත් වෙලා තියෙනවා. හැබැයි අපි දකිනවා පහුගිය කාලේ අපි කොවිඩ් වලට දක්වපු උනන්දුව සභාව ඇතුලේ ආරක්ෂක විදිවිධාන සඳහා දක්වපු උනන්දුව මේවන විට දුර්වල වෙලා තියෙනවා කියන එකයි අපේ හැඟීම. එනිසා අපි නැවත වරක් අපි අර මුලින් පලවෙනි රැල්ලේදි හා දෙවෙනි රැල්ලේදි බරක් යෙදුවා සේවකයන්ගේ ආරක්ෂාව සඳහා. එ නිසා මම ඉල්ලීමක් කරනවා මේ මේව කරනවා නෙමෙයි එවා සෞඛ්‍ය අංශ සමග කථාකරලා ඔබතුමා තින්දු කරන්න. අපි දකිනවා අද වෙනකොට එ අපේ තිබ්බ අවධානය ගිලිහිම තුල තමයි මේක පැතිරිලා තියෙන්නේ මොරටුව මහ නගර සභාව තුල කියන එකයි අපේ හැඟීම. එනිසා එ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. සේවකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් අද දවසේ මේ සභාවට ඇවිල්ලා ඉන්න හැම මන්ත්‍රීවරයාම අවධානමක ඉන්නේ. මොකද හේතුව වෙනදා අපි එනවාට වඩා දැන් මේ සභාවේ අද එනකොට සැනිටයිසර් ටිකක්වත් ගැහුවේ නැහැ. අපේ සේවකයන්ගේ වරද නෙමෙයි. මීට වඩා අවධානය යොමු කල යුතුයි කියන එකයි අපේ හැඟීම.

ගරු නගරාධිපතිතුමනි, තව ප්‍රශ්ණයක් තියෙනවා කර්මාන්ත අංශයත් එක්ක විසඳගන්න ඕන ප්‍රශ්ණයක් ඒකේ ප්‍රධානම දේ තමයි අපි දැන් වතුර ගන්න සල්ලි බැදලා පාර කඩනවා. පාර කැඩුවට පස්සේ සමහර වේලාවට නගර සභාවෙන් ගිහිල්ලා හදනවා. සමහර තැන්වල අපි පිළිගන්න ඕන එක දෙයක් තියෙනවා. සියයට සියයක් නගර සභාවෙන් හදන්නේ නැහැ. සමහර තැන්වල ඔබතුමා අපේ බලප්‍රදේශයේ ඇවිදින කොට දකින්න ඇති පාර කඩපු තැන් තාම තියෙනවා වාහන යනකොට වැටිලා යන තැන්.ඒ කියන්නේ හදලා නැතිතැන්. සමහර තැන්වල මෙය වේලා තියෙනවා හැබැයි සමහර තැන්වල විතරයි වේලා තියෙන්නේ. අදාල පාර්ශවය එ කියන්නේ මේ මන්ත්‍රීතුමා වතුර ගන්නවානම් එයාට පුලුවන් කම තියෙනවානම් පාරේ එයා කඩපු ප්‍රමාණය හදන්න හදලා නගර සභාවට වාර්තා කරන්න. කඩපු පාර මම හැදුවා කියලා පෙන්නන්න පුලුවන්නම් නිළධාරියෙක් යවලා එක හරියට වේලා තියෙනවා කියලා වාර්තාවක් ගන්න පුලුවන්නම් අපිට පුලුවන්කම තියෙන්න ඕන මේ මුදලින් යම් ප්‍රමාණයක් මම කියන්නේ සියයට සියයක් නිදහස් කරන්න එපා. සියයටය 75ක් වත් නිදහස් කිරිමේ හැකියාව තියෙන්නට ඕන මොකද ජනතාවට සේවය කරන ආයතනයක්. ලාභ උපයන ආයතනයක් නෙමෙයි. එතකොට ජනතාව තමන්ගේ ගේ ඉස්සරහා කඩපු වල තමන් විසින් අදාල කාල සීමාවේ අපි කියමු සතියක් දෙමු. අපි නියෝගයක් දානවා සතියක් ඇතුලත මෙය වහලා පෙන්නුවොත් එහෙම නගර සභා මුදල් නැවත වරක් ඒ මුදල්වලින් යම් කිසි ප්‍රමාණයක් නිදහස් කරනවා කියලා කොන්ක්‍රීට් කරන්නත් පුලුවන් ගල් අල්ලන්නත් පුලුවන්. කාපට් විතරයි බැරි. ඒ නිසා මම මෙය ගෞරවයෙන් ඉල්ලනවා හේතුව මිනිස්සු මේ වෙනකොට දැන් මගේ හිතවතෙක් මේ වෙනකොට පාර කඩලා පාර හදලා අල්ලපු පාරේ එක්කෙනෙක්ට ගෙවලා තියෙනවා මේ පාරේ අයට ගෙවන්නැ. එහෙම ප්‍රශ්ණයක් තියෙනවා මම අද කොමසාරිස්තුමාට උදේ පැමිණිලි කරා. එනිසා මම ඉල්ලීමක් කරනවා ඔබතුමාගේ කාරුණික අවධානය යොමුකරලා එහෙම තැනකට යන්න මොකද අපි හැමෝම ජනතාවට සේවය කරන අයනේ. ගෙවන්න බැරිනම් ඉදිරි වරිපනම් වලින් කපා හරින්න ක්‍රමයක් හදන්න. එහෙම ගෙවන්න බැරිකමක් තියෙනවානම්. මම දන්නැ නිතිමය තත්වය මොකක්ද කියලා. මුදල් අරගෙන නගර සභාවට ආපසුගෙවන්න බැරි එහෙම නිතිමය තත්වයක් තියෙනවානම් එහෙම මොකක් හරි ක්‍රමවේදයක් හදන්න කියන ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි, වාචිකව දිලා තිබ්බා හොඳ උපදෙසක් මම එක අගය කරනවා සැපයුම් සම්බන්ධයෙන්. මම මේ සභාවේ ගොඩක් දෙවල් කියන්න හිටියේ හැබැයි ඔබතුමා වාචිකව කියලා තියෙන දේ මම හිතනවා යාථාර්තයක් වෙයි කියලා. එනිසා මම අද එවා කියන්න බලාපොරෝත්තු වෙන්නේ නැහැ. නැත්නම් මම අද පැය භාගයක් විතර සැපයුම් එකේ ගුණ අගුණ කියන්න හිටියේ. එනිසා එවා කියන්න ඕන නැහැ ඔබතුමා කියලා තියෙනවා අදාල අංශවලට එ සැපයුම් එකේ දේවල් කරන්න බලය විමධ්‍යගත කරන්න කියලා පණිවිඩය දිලා තියෙනවා. එය මම බොහෝම අගය කරනවා. මොකද හේතුව මේ නගර සභාවේ වැඩිම වංචාවෙන තැන එතන.එනිසා එ වචනයෙන් කියපු එක යථාර්තයක් කරන්න කියලා මම ඉල්ලනවා. මොකද හේතුව කර්මාන්ත අංශයෙන් නම් කර්මාන්ත, සෞඛ්‍ය අංශයේනම් සෞඛ්‍ය ඒ ඒ දෙපාර්තමේන්තුවලට කවුරුහරි නිළධාරියෙක් පත්කරලා සැපයුම් විමධ්‍යගත කරොත් ගරු නගරාධිපතිතුමණි මේකේ තියෙන හොරකම අඩුවෙනවා. තව එකක් මම යෝජනා කරනවා මෙහෙම දෙයක් මේ සමහර සේවකයෝ ඉන්නවා එක තැන නිළධාරින් විශේෂයෙන් සමහර නිළධාරින් ඉන්නවා එක තැන අවුරුදු ගනන් එකම තැන. එනිසා මම ඉල්ලීමක් කරනවා සභාව තුල එ එකම තැන තියන්නේ නැතිව සභාව තුල රොටේටි එකක් හදන්න පුලුවන්නම් ගරු නගරාධිපතිතුමණි, ඔබතුමා හොඳ වැඩක් කරලා තිබුණා කර්මාන්තේ හිටිය CC දාලා තිබුණා වරිපණම් අංශයට, වරිපණම් අංශයේ CC කර්මාන්තයට දාලා තිබුණා. එක මම දකිනවා සාධනිය ලක්ෂණයක්. එවගේ නගර සභාව තුල එහෙම කරන්න පුලුවන්නම් හොරකම් වංචා දූෂණ අඩුවෙනවා. එකම තැන ඉන්න කොට එ එ ක්‍රමවේදයන් වලට මිනිස්සු පුරුදුවෙනවා. සැපයුම් එකේ ඉන්න නිළධාරියා සැපයුම් එකේ ස්ථාවර වෙලා. එතකොට එයා ක්‍රමවේද හදාගන්නවා. හැබැයි එයාට යම්කිසි කාල සිමාවක් දිලා එතනින් එයාව අයින් කරලා වෙන තැනකට දැම්මා නම් ක්‍රමවේද හදන්න යන්නැ. එනිසා මම ඉල්ලීමක් කරනවා ඒ වගේ රෝටේටි එකක් හදන්න කියලා මම කියන්නේ සාධාරණ කාලයක් තියන්න එතකොට රැකියාවේ තියෙන තෘප්තියත් වැඩිවෙනවා. අලුත් තැනකට ගියාම අලුත් විදියට වැඩකරන්න පුරුදු වෙනවා. කැපැසිටි එකත් වැඩිවෙනවා. මිනිස්සු අතර තියෙන සුහදතාවයත් වැඩිවෙනවා. එක කරන්න කියන ගෞරවනිය ඉල්ලීම කරනවා.

**03 (05)** <u>**මහා නගර සභා මන්ත්‍රි - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි, කරුණු දෙකක් මට මේ අවස්ථාවේ ඉදිරිපත් කරන්න තියෙනවා. ඒකේ පලවෙනි කරුණ තමයි මා නියෝජනය කරන බොරුපන කොට්ඨාසයේ සෙත්සිරි මාවතේ මදුරුවන් බෝකරන තවානක් තියෙනවා.මම මෙය ගරු නගරාධිපතිතුමණි, ඔබතුමාටත් දැනුවත් කරා ඔබතුමාත් එකට සාධනිය පිළිතුරක් දුන්නා. එවගේම ප්‍රදේශය භාර මහජන පරික්ෂක තුමාටත් දැනුවත් කරා එතුමාත් ඒ සම්බන්ධයෙන් නිරික්ෂණයක් කරා එවගේම ප්‍රධාන මහජන පරික්ෂක තුමටත් මම දැනුවත් කරා. එතුමා එ දැනුවත් වෙච්ච මොහොතේම ක්ෂණිකව මැදිහත්වෙලා පොලිසියත් සම්බන්ධකරලා යම් ක්‍රියාමාර්ගයක් ගත්තා.නමුත් මේ වෙනකම් ගරු නගරාධිපතිතුමණි, බොරුපන පාරේ සෙත්සිරි මාවතේ තියෙනවා හිස් ඉඩමක් මේ හිස් ඉඩම කාලාන්තරයක් තිස්සේ නිරාවරනය වෙලා තියෙන්නේ පාරට එනකොට පාරට නිරාවරනය වෙලා තියෙන මේ හිස් ඉඩමට එ ප්‍රදේශවාසින් හා වෙනත් පිරිස ඒ ඉඩමට කසල ගෙනැවිත් දානවා. බොරුපන ප්‍රදේශයේ කසල ඇදිම ඉතා හොඳ මට්ටමක තියෙනවා.මම ගරු කරනවා එ කසල අදින

එ රියදුරු මහතා හා ඒ කාර්යය මණ්ඩලයට ඒගොල්ලෝ කිසිදු ප්‍රමාදයක් දක්වන්නේ නැහැ.ඒ අවශ්‍ය නියමිත දිනයන්වලට නියමිත වේලාවට එනවා.එහෙම තිබිද්දි සමහර අය විශේෂයෙන්ම බොඩ්වෙලා ඉන්න පිරිස වැඩිපුරම මේ වැඩේ කරන්නේ සහ පිටස්තර අය එතකොට මේ නිරාවරනයවෙලා තියෙන ඉඩමට විශාල වශයෙන් කැලිකසල බැහැර කරනවා. එතකොට ඒ බැහැර කලාට පස්සේ දුර්ගන්ධය මදුරුවෝ වෙනත් අපචාර සියල්ල සිද්ධ වෙනවා.නමුත්, මම උත්සාහ ගත්තා ඒ ඉඩමේ අයිතිකාරයා කවුද කියලා හොයන්න බෙලෙක් කඩේ පොලේ ව්‍යාපාරයක් කරන කෙනෙක් මම පණිවිඩ කිහිපයකුත් යැව්වා ඉක්මණින්ම කථා කරන්න මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න කලින් කියලා. නමුත් මේ වෙනකම් ගරු නගරාධිපතිතුමණි කිසිදු ප්‍රතිචාරයක් නැහැ. හැබැයි මේ ක්‍රියාවලියත් සිද්ධවෙනවා. සෞඛ්‍ය පරික්ෂකතුමන්ලා යම් මැදිහත්වීම් කරා. මැදිහත්වීම් කරනකොට පොඩ්ඩක් කොහෙන් හරි ගිනි තියනවා කුණු ටික එ ඉඩමේ. නමුත් ප්‍රශ්ණයට උත්තර හම්බවෙන්නැ. ඒ නිසා ගරු නගරාධිපතිතුමණි, මම ඉල්ලීමක් කරනවා අපි ඩෙංගු මර්ධන ව්‍යාපෘති සැහෙන්න කරනවා.නමුත් මේ විදියේ විශාල ලෙස මදුරුවන් බෝවීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය වන තැන් පිළිබඳ ඉතා ඉක්මණින්ම කටයුතුකරන්න කියලා මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු නගරාධිපතිතුමණි.ඒ වගේම මගේ

ගරු නගරාධිපතිතුමනි. දෙවෙනි කරුණ අපි කවුරුත් දන්නවා මේ මොහොතේ කොවිඩ් 19 වසංගතයේ නව ප්‍රභේදයක් වුණ ඔිමික්‍රොන් ප්‍රභේදය රට පුරාත්, ලෝකය පුරාත් විශේෂයෙන් අපේ රටට සාපෙක්ෂව ලෝකය පුරා විශාල ලෙස මෙය පැතිරෙනවා අපෙත් දැන් යම් ප්‍රමාණයක පැතිරෙමින් යනවා. ගරු නගරාධිපතිතුමණි, මේ කොවිඩ් වසංගතයට එරෙහිව රජයක් විදියට විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමා ආර්ථික වශයෙන් තියෙන සියලුම දේවලට වඩා ප්‍රමුඛතාවය දුන්නා මිනිස්සුන්ගේ ජීවිත වලට මේවෙනකොට එන්නත් කිරිම අතින් ඉහල තැනක අපේ රට තියෙනවා.අනෙක් දියුණු රටවලටත් සාපෙක්ෂව නමුත් මේ වෙනකොට ගරු නගරාධිපතිතුමණි, මේ ඔිමික්‍රොන් වයිරසය ක්‍රියාත්මක වෙනවා එන්නත් දෙකම ගත්තත් ඉතින් දැන් මේ වෙනකොට තුන්වෙනි මාතාව ලබාදිම වෙනුවෙන් රජයක් විදියට ඉතාම විශාල මහන්සියක් වෙනවා.නමුත් ගරු නගරාධිපතිතුමණි, මම පුහුගිය දවස් කිහිපයම උත්සාහ ගත්තා මොරටුව ප්‍රධාන සෞඛ්‍ය වෛදය නිළධාරි කාර්යාලය හෝ කවුරුහරි කෙනෙක් සම්බන්ධකර ගන්න විශේෂයෙන් මම නියෝජනය කරන බොරුපන එවගේම මම නියෝජනය කරන බොරුපන ප්‍රදේශයේ ඒ ගම් වාසින් වගේම විශාල ආයතන ප්‍රමාණයක් තියෙනවා සේවකයන් සියයකට දෙසියකට තුන්සියකට වඩා වැඩි ප්‍රමාණයක් ඉන්න ආයතන එතකොට ඒ ආයතන වලත් සමහර අය මගේන් ඉල්ලීමක් කරා පුලුවන් කමක් තියෙනවානම් ජංගම සේවයක් හෝ MOH එක සම්බන්ධ කරලා දෙන්න ඒ අවශ්‍ය කරන පහසුකමුත් දෙන්නම් මේ එන්නත්කරනයේ තුන්වෙනි මාතාව ලබාදෙන්න කියලා.නමුත් මම දන්නැ හේතුව මෙතන ඉන්න අනෙත් මන්ත්‍රිවරු දැනුවත්ද කියලා මම නම් දැනුවත් නැහැ බොරුපන ප්‍රදේශයේ තුන්වෙනි මාතාව දෙන විදියක් ගැනවත් ඒ වගේම මේ ආයතනවලට කථාකරන්න කිසිදු සම්බන්ධිකරනයක් අපිට හැදෙන්නැ.දුරකථන ඇමතුම්වලට ඒන්නේ නැහැ කවුරුත් ඒ නිසා ගරු නගරාධිපතිතුමණි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා විශේෂයෙන් මොකද අපිට කාටවත් බැන බැන විවෙචනය කර කර ඉන්න එකට වඩා අපි ප්‍රායෝගිකව ක්‍රියාත්මක වෙනවානම් මම දන්නවා මේ තත්වය නිසා ගරු ජනාධිපතිතුමා රජය කොවිඩ් කාර්යය සාධක බලකාය තිරණය කරලා තියෙනවා ආරක්ෂක අංශ විසින් මේ බූස්ටර් එන්නත විදිම විදිමත් කරන්න හා කඩිනම් කරන්න ක්‍රියාමාර්ගයක් අරගෙන තියෙනවා මේ සතිය ඇතුලත මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු නගරාධිපතිතුමණි, ඔබතුමා මැදිහත් වෙලා විශේෂයෙන්ම බොරුපන තෙලවල සොයිසාපුර කල්දේමුල්ල මේ කියන කොට්ඨාශයේ මොරටුව උතුරු ප්‍රදේශයේ තුන්වෙනි මාත්‍රාව ලබාගැනිම වෙනුවෙන් විශාල විදියට උනන්දුවෙන් ජනතාව

ඉන්නවා.නමුත් ඒ අයට නිශ්චිත විධිමත් තැනක් වැඩ පිළිවෙලක් හැදුන්නෑ තාම එනිසා ඔබතුමාගේ මැදිහත්වීමෙන් ඔබතුමා ඉක්මණින්ම විශේෂයෙන්ම ආරක්ෂක අංශ විසින් කරන ඒ ජංගම සේවාව අපේ මොරටුවටත් ලබාගන්න ඔබතුමා කලින් එහෙම ලබාගත්තා ඒ වගේම මේපාරත් මැදිහත් වෙන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03 (06)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම ඔක්තොබර් මස තිබුණු සභා රැස්වීම සඳහා පෙත්සමක් ඉදිරිපත් කළා. මාස 04 ක් මේ සභාව වෙනකොට ගිහිල්ලා තියෙනවා. කල් ඉකුත්වෙලා තියෙනවා. නමුත් ඒ පෙත්සම සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් මේවන තෙක් අරගෙන නැහැ කියන කාරණාව කියන්න ඕන.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම හිතන්නේ ඔබතුමාට අද දිනයේදි සම්පූර්ණ පිළිතුරු සපයන්න හිටියේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවත් ලේකම්තුමාගෙත් ඇතිවූ තත්ත්වය නිසා සියලුම පෙත්සම්වලට පිළිතුරු සපයන්න වාර්තාකරණය කරන්න දිලා තිබුනේ.ඒ සම්බන්ධයෙන් මම ඉදිරියේදි ඔබතුමා දැනුවත් කිරිම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, බොහොම ස්තුතියි. ඒ වගේම මම යෝජනාවක් මේ සභාවට ඉදිරිපත් කරා ගිය මාසේ 19 වෙනිදා ඒ යෝජනාව මීට පෙර සභාවට මම ඉදිරිපත් කරපු යෝජනාවක් තමයි මොරටුමුල්ල පන්සල පාරේ වරිපනම් අංක 41 දරණ ස්ථානයේ පටන්ගන්න වරිපනම් අංක 72/17/ඩී ස්ථානයෙන් අවසන් වන මාවත පාර සෞම්‍ය පෙදෙස ලෙස නම් කරන ලෙස සභාවට යෝජනා කරනවා කියන එක මේ පාරේ පදිංචි සියලුම පදිංචිකරුවන්ගේ අත්සන් සහිතව එ අත්සන් ලේඛනයත් ඒ යෝජනාවට අමුණලා ඒ ගොනුවේ තියෙනවා. නමුත්, අඩුපාඩුවක් වෙලා තිබුනේ වරිපනම් අංක පමණයි. පාරේ ආරම්භ කරන ස්ථානයේ වරිපනම් අංකයත් අවසන් වන ස්ථානයේ වරිපනම් අංකය විතරයි යෝජනාවට ඇතුලත් කරන්න අවශ්‍ය වුනේ. ඉතින් එක ඇතුලත් කිරිම පිණිස ලේකම් අංශයෙන් මට දැනුම් දුන්නා නැවත මේ යෝජනාව මේ ආකාරයෙන් යොමු කිරිමක් කරන්න කියලා. එකතමයි මම යෝජනාව ඉදිරිපත් කරේ. නමුත්, ඔබතුමා මට ඒ යෝජනාව සම්බන්ධව මෙහෙම ලිපියක් එවනවා. මෙම යෝජනාව සම්බන්ධව විධිමත් ලෙස යෝජනාව ලබලා දිලා නැහැ කියලා. විධිමත් නොවනවා කියන එක මොකක්ද කියලා පැහැදිලි කිරිමක් කරගන්න අවශයයි.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, පාරක නම් කිරිමක් කරද්දි පාරේ ඉන්න පිරිසගේ අත්සන් ලේඛනයක් එක්ක එවන්නට ඕන.ඔබතුමා යෝජනා එවද්දි අත්සන් ලේඛනය එවලා තිබුනේ නැහැ.අත්සන් ලේඛනය නැති නිසා එක විධිමත් වෙන්නේ නැති නිසා තමයි විධිමත් විදියට එවන්න කියලා එවලා තිබුනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පෙර යෝජනාවට අත්සන් ලේඛනය අමුණලා තිබුණා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එම යෝජනාව නම් කිරීමක් නෙමෙයි.නම් කිරීමක් නොවන යෝජනාවකට පාර හදන්න කියන යෝජනාවට මිනිස්සු අත්සන් කරන්න පුලුවන්. නම් කිරීම කියන එකට මිනිස්සු අකමැතිවෙන්න පුලුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම එක පැහැදිලිවම කිව්වේ කමියුනිකේෂන් එකේ මිස් අන්ඩර්ස්ටැන්ඩ් එකක් වෙන්න ඇති.නමුත් එකේ ඇමුණුමක් හැටියට ඉනිෂියල් පොපොසල් ඒකේ පධාන යෝජනාවට එක තිබුණා කියලා කාරණව මට ඇතුලත් කරන්න බැරිවුනා.මම ඒක සඳහන් කරලා නැවත වතාවක් ඔබතුමාට යොමුකරන්නම්.

ගරු නගරාධිපතිතුමනි, අපේ කොන්ත්‍රාත්කරුවන් විසින් කරන සංවර්ධන කටයුතු සම්බන්ධව එකේ කිසි ගැටළුවක් නැහැ .එක හොඳට කරගෙන යනවා.නමුත් අර සමහර කොන්ත්‍රාත්කරුවන් මේ වැඩ කටයුතු කරලා අවසන් වුනාම එ පාරේ ඉතුරුවෙන සුන්බුන් ටික නැත්නම් අර කුණුටික නැත්නම් මොනවාහරි ඒ කර්මාන්තයෙන් ඉතුරුවෙන ඒ දේවල් ඒ ස්ථානයේම තියලා යන තත්වයක් තියෙනවා.උදාහරණයක් ගත්තොත් ශාන්ත අන්තෝනි පාරේ බදාදා පොලවත්තේ වම් පැත්තේ පාරක් සංවර්ධනය කළා.ඉන්ටලොකින් කරලා තිබුණා එක හොඳයි.සංවර්ධනය සම්බන්ධ ප්‍රශ්ණයක් නෙමෙයි.නමුත් අර කුණු ගොඩවල් දෙක ප්‍රධාන පාරේ තැන් දෙකක ගොඩගහලා තියෙනවා.මේ සම්බන්ධව අපි ඉල්ලිමක් කරනවා පොඩ්ඩක් මේ කොන්ත්‍රාත් එක කරලා ඉවරනම් කොන්ත්‍රාත්කරුවා අවසන් නම් ඒ සියල්ල සුද්ද කරානම් මිට වඩා ලස්සනයි යන ජනතාවටත් බොහේම පහසුවක් වෙනවා.

03(07) <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඉදිබැද්ද ඩගලස් ප්‍රනාන්දු ක්‍රිඩාංගනය මේ වෙනකොට කාලයක් තිස්සේ සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන තිබෙනවා.ඉතින් එක නිසා ගරු නගරාධිපතිතුමණි ලොකු කාලයක් ගිය නිසා අද මේවෙනකොට ඉදිබැද්දේ තරුණයන්ට ක්‍රිඩා කරන්න ස්ථානයක් නොමැතිකමක් තියෙනවා.ඒවගේම තමයි අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ඉතා ඉක්මණින් මෙය සංවර්ධන කටයුතු කරලා ඉවර කරන්න කියලා මොකද නැත්නම් ඉදිබැද්දේ තරුණයන්ට අද ක්‍රිඩා කරන්න තැනක් නැහැ. මම එක වැඩිදුර කථා කරන්නේ නැහැ.ගරු නගරාධිපතිතුමා එකත් එක්කම මේ සංවර්ධන කටයුතු කිරීමේදි මම නිතරම කියපු දෙයක් තමයි ඔබතුමාටත් මේ ගවුන්ඩ් එකේ සංවර්ධන කටයුතු කරනකොට ගවුන්ඩ් එක වටා තියෙන කාණු පද්ධතිය.මේ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරනය කරන්නැතිව මොන දේ කරත් වැඩක් නැහැ.මොකද මම හැමදාම කියනවා මේ ග්‍රවුන්ඩ් එක තියෙන්නේ පහත කාණුවේ අඩිය තියෙන්නේ උඩ ඉතින් එක නිසා මේ ග්‍රවුන්ඩ් එකට වැටෙන වතුර පාර මේ කාණුවට යන්නේ නැහැ.මේ කාණුව උඩින් තියෙන නිසා.මෙය අපි හැමදාම කිව්වා මේ කාණු පද්ධතිය අලුතෙන්ම මෙය සකස් කරන්න ඕන කියන එක.නැත්නම් නගරාධිපතිතුමා මොන සංවර්ධනය කරත් වැඩක් වෙන්නේ නැහැ.ඒවගේම තමයි

සංවර්ධනය කරනකොට මේ ක්‍රීඩා පිට්ටනිය ආවරණය වන තාප්පය මේක හැමතැනම කැඩිලා පුපුරලා සමහරක් අය තමුන්ගේ නිවේස්වලට යන දොරටු තියාගෙන එක නිසා ගරු නගරාධිපතිතුමණි ක්‍රීඩා පිට්ටනියට ආසාධාරණයක් සිද්ධවෙනවා.මෙය ඉතාමත් වටිනා ක්‍රීඩා පිට්ටනියක් මේක ආරක්ෂා කරගැනිම අපේ යුතුකමක් වෙනවා ගරු නගරාධිපතිතුමණි.ඒත් එක්කම ඔබතුමාට මම ඉල්ලීමක් කරන්න කැමතියි දැනට වසරකට දෙකකට පෙර අලුත් ගොඩනැගිල්ලක් හැදුවා මම ඊයේත් ඒ ස්ථානයට ගියා.ඒකේ උඩුමහල මේ වෙනකොටත් පොලව පුපුරලා තැන් කිහිපයකම.මේක පාවිච්චි කරලා නැති හින්දා.අද මේක මම හිතන්නේ සුනඛයන්ගේ තොතැන්නක් බවට පත්වෙලා මම යනකොටත් එතන බල්ලෝ තමයි ලගින්නේ.මේක හරි අපරාධයක් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මම හිතන්නේ ඉතා ඉක්මණින් මේකට අවශ්‍ය කටයුතු කරලා ඉදිබැද්දේ ජනතාවට එ ක්‍රීඩකයන්ට භාරදෙන්න කියන ඉල්ලිම කරනවා.

ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමාට ඉදිරිපත් කරේ නැහැ මොකද ඉදිබැද්ද සේවා පටුමග මාර්ගය ඔබතුමාට ඉදිරිපත් කරපු නැති හේතුව තමයි මෙය අලුතින් ජල සැපයුම් ලබා ගැනිමේදි පාරේ කැනිම් කරනවා.මේක අලුතින් මේ මාර්ගය සංවර්ධනය කරනවා කියලා මමත් ජල සම්පාදනයත් එකතුවෙලා අපි හැම ගේකටම පොඩි කොලයක් බෙදුවා මේක කාපට් කරන්න හදන්නේ එම නිසා තමුන්නාන්සේලා අලුතින් ජලය ලබාගන්නවානම් ඉතා ඉක්මණින් ලබාගන්න කියලා.අපි මේ දැනුම් දිම කරේ 2020 ඔක්තෝබර් මාසේ.එතකොට මමත් ඇතුලුව මගේ නිවසටත් මම ගත්තේ 2020 නොවැම්බර් මාසේ.එතකොට මමත් මේ නගර සභාවට ගෙවන්න ඕන මුදල් ගෙවලා තමයි පාර කැනිම් කරලා වතුර ගත්තේ.2020 මම නොවැම්බර් ගන්නකොට ඔක්තොබර් මාසේ ඒ පාරේ පදිංචිකරුවන් 15 කට අධික පිරිසක් නව සම්බන්ධතාවයක් ලබාගත්තා.නමුත් එදා ඉඳලා මේදක්වා දැන් අවුරුදු දෙකකටත් කිට්ටු වෙලා තියෙනවා අපිට පුලුවන් කමක් ලැබිලා නැහැ මේ වෝටර් කටින් ටික වහගන්න. ගරු නගරාධිපතිතුමණි, මම කොමසාරිස්තුමාට ලිඛිතව භාරදුන්නා මෙය කරන්න කියලා.දින වකවානු මම මේතුමාට කෝල් කරලා කිව්වා.මම කර්මාන්ත කමිටුවේ සභාපතිවරයා හැටියට කිව්වා මේක දැන් අවුරුදු 02 ක් කිට්ටු වෙන්න යවනවා. මෙය ඉතා ඉක්මණින් හදලා දෙන්න කියලා.මම ඔබතුමාගෙන් ඉල්ලිම කරේ නැත්තේ මේක මුදල් ගෙවලා තමයි පාර කැණීම් කරලා තිබෙන්නේ.එක නිසා මම ඔබතුමාට ඉදිරිපත්කරේ නැහැ.මම කොමසාරිස්තුමාට ඉදිරිපත් කළා.මම කර්මාන්ත කමිටුවේදි කිව්වා.අචිනි මිස්ට කිව්වා.මෙය කවදාවත් වෙන්නැහැ නගරාධිපතිතුමණි මෙය මාර්ගය සංවර්ධනය වෙනවා කියලා අවුරුදු දෙකක් තිස්සේ මට හැමදාම මේ බොරුව කිය කිය ඉන්න බැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට මම කිව්වා එන්න කියලා මම එන්න කිව්වෙත් කැනිම් කරලා තියෙනවානම් අපේ පොතේ ලියවෙනවා අනිවාර්යෙන්ම. මේච්චර ගොඩක් කරලා තියෙනවා කියලා.ඔබතුමා මට එකත් එක්ක සසදලා දෙන්න මම ඒක කරන්නම් අපි කාපට් කරන්න දාලානේ තියෙන්නේ.එක මම කරන්නම් ඔබතුමා එකත් එක්ක වාර්තාවක් දෙන්න.

**03(08)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, මා වෙත ලැබුණු පැමිණිල්ලක් ඉදිරිපත් කරනවා. ප්‍රදේශවාසින් ආලෝකපිටිය පාර මොරටුමුල්ල මොරටුව කාලයක සිට අබලන්ව ඇති ආලෝකපිටිය පාර මොරටුමුල්ල නැගෙනහිර ග්‍රාම නිළධාරි වසමට අයත් එකකි.එය ඉතාම දරුණු ලෙස කැඩී බිඳී අබලන්ව ඇති අතර මේ ප්‍රදේශයේ ජීවත්වන ජනතාව ලෙස අප එහි ගමන් කිරිමේදී ඉතාමත් අපහසුතාවයට පත්ව සිටින බව දැනුම් දෙන අතර නගර සභාවට බදු මුදල් ගෙවන මොරටුමුල්ල ජනතාව ලෙස අපි ඉල්ලා සිටින්නේ මාර්ගය දෙපසින් ක්‍රමවත් කාණු පද්ධතියක් සහිතව මෙම මාර්ගය ප්‍රතිසංවර්ධනය කර දෙමින් අපගේ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනිම සඳහා අවශ්‍ය ගමනාගමන ක්‍රියාවලියට ඇතිවී තිබෙන ගැටලු අවම කර ගැනිමට නගර සභාවේ සහයෝගය ලබාදෙන ලෙසයි.ඇත්තටම වසර 10ක් විතර කාලයක සිට පාරේ ප්‍රතිසංස්කරන කටයුතු කිසිම දෙයක් සිදුවෙලා නැති බව තමයි ජනතාව පවසන්නේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, සමාවෙන්න ඕන. ඔය කථාකරන එක සම්පූර්ණ සාවද්‍යයි.මොකද ඔබතුමිය මන්ත්‍රීවෙලා අවුරුදු 04 යි.සොරෝල මංගල්‍යය නොයන කාලේ ඇර සොරෝලේ මංගල්‍යයට එක පාරකවත් වලක් තියන්නැ.සොරෝල මංගල්‍යය යන පාරක් ඔය අනිවාර්යයෙන්ම කරනවා.ඔබතුමිය ඔය කියන කථාව කරන්න ඕන ඔබතුමිය සැලකිල්ලට ලක්කරගන්න ඕන මම මන්ත්‍රීතුමියක් විදියට මේ කියන දේ ඇත්තද නැද්ද කියලා.එක නිසා අනිවාර්යයෙන්ම සොරෝලේ මංගල්‍යය යන පාරක් විදියට එය පාර සම්පූර්ණ ප්‍රතිසංස්කරණය කරනවා.ඔය කියන්නේ බොරුවක්.එක මේ සියලුම මන්ත්‍රීවරු දන්න දෙයක් ඔබතුමිය අමුතුවෙන් නොදන්න දෙයක් වෙන්න බැහැනේ.තිසර රසාංජන මන්ත්‍රීතුමා දැනුවත් කිරිමක් කරන්න මේ මන්ත්‍රීවරුන්ව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා අද දවසේ මොරටුමුල්ල ශාන්ත පාවුළු දේවස්ථානයට එම දේවස්ථානයේ වාර්ෂික දේව මංගල්‍යය තියෙනවා. උදේ ඉඳන් දුරකථන ඇමතුම් එනවා ලයිට් දාලා ඉල්ලා තියෙනවා නමුත්, එක ලබලා දිලා නැහැ කියලා

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමිය, ලයිට් දාන්නැනේ දැන් අපි මලගෙවල් වල ලයිට් දැමීම නැවැත්තුවා. මළගේ, මගුල්ගේ, දානේගේ, බණගේ, සොරෝලේ මංගලයය, පිංකම් වලට අදාලයි. විදුලියට ලොකු ප්‍රශ්ණයක් තියෙන නිසා අපි නැවැත්තුවා. මේ රටේ ජාතික වැඩ සටහනක් මෙයට දායක වෙන්න ඕන.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා එක හිටිහැටියේම තිරණය කරනවා ඔබතුමාගේ කැමැත්ත පරිදි. ඔබතුමා පන්සලකට දෙනවා නම් පල්ලියකටත් අනිවාර්යයෙන්ම පහසුකම් දෙන්න ඕන.ඔබතුමාගේ කැමැත්ත පරිදි ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ට ඕන විදියට විතරක් වැඩ කරන එක වැරදියි.

අපි ජනතාවගෙන් බැනුම් අහනවා නගර සභාවේ ඉදලා පල්ලියේ මංගලයයට කුණුටික පොඩ්ඩක් අස්කරලා දෙන්නේ නැහැ.දේවස්ථානයට ලයිට් ටිකක් දාලා දෙන්නේ නැහැ.ඔබතුමා වැරදි නැද්ද.ඔබතුමා තනියෙන් එහෙම තිරණය කරන එක වැරදි ගරු නගරාධිපතිතුමණි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, අනෙක් දවසේ ඔබතුමියගෙනුත් අහලා මම තිරණය ගන්නම්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, ගිය මාසේට එපිට මාසේ මම ඉදිරිපත් කලා. ලාංකිකා පෙරේරා මහත්මිය වෙනුවෙන් ඔබතුමා මට කිව්වා නිත්‍යානුකූලව ජනාධිපතිතුමා රටේ ප්‍රධාන පුරවැසියා විදියට එතුමා තිරණය කරලා තියෙනවා ජීවත්ව සිටියදි කිසිම කෙනෙකුගේ නමින් පාරක් නම් කරන්නේ නැහැ කියලා.මොරටුව මහා නගර සභාවේ දි ඔබතුමා මට ප්‍රකාශ කලා.නමුත් ගියමාසේ මම දැක්කා පානදුර නගර සභාව අනිල් භාරති මැතිතුමා නමින් පාරක් නම් කරනවා.කරුණාකරලා ඔබතුමා මට පොඩ්ඩක් පැහැදිලි කරන්න පානදුර නගර සභාව සහ මොරටුව මහා නගර සභාව අතර වෙනසක් තියෙන්න විදියක් නැහැ.රටේ එකම නිතියක් තියෙනවානම් කරුණාකරලා මට පැහැදිලි කරන්න ඔබතුමා මොකක්ද එ නිතිය සහ එතන එකක් වෙන්නයි මෙතන එකක් නොවෙන්නයි එ කාරණා දෙක අතර මම නොදන්නා නිතියක් තියෙනවානම් ඔබතුමා මට පොඩ්ඩක් පැහැදිලි කරන්න කියලා මම ඉල්ලිමක් කරන්න කැමතියි.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, එක පැත්තකින් මම හිතනවා පානදුර නගර සභාව මේක කරන්න ගන්න කොට මේ රටේ නිතිය ස්ථාපිත වෙලා නැතිව ඇති.සමහර විට යෝජනාවක් ආවාම ඔබ නොදන්නවා ඇති පාරක නමක් යෝජනා කලාට පස්සේ එ යෝජනාවට විරෝධතා කැදවන්න ඕන.එ යෝජනාවට විරෝධතා කැදෙව්වට පස්සේ එය මහ ඇමතිතුමාට යවන්න ඕන.මහ ඇමතිතුමා නැතිකොට දැන් ආණ්ඩුකාරතුමාට යවන්න ඕන.ආණුඩුකාරතුමා එයට අනුමැතිය දෙන්න ඕන මෙයට මාස 04 ක 05ක කාලයක් යනවා.ඒ තින්දුව ගිය මාසේට ඉස්සේල්ලා ආව එකක් වෙන්න ඇති අනිල් භාරතිගේ යෝජනාව.එහෙම නොවි කරලා තියෙනවානම් එක එක්සත් ජාතික පක්ෂ නගර සභාවක් තියෙන්නේ.එක අනුමත වෙන්නේ නැතිව ඇති. මම කරන්නේ නැහැ කෙහොමටවත් මොකද හේතුව මම වැඩකරන්නේ මට දිලා තියෙන නියෝගත් එක්ක මම වැඩ කටයුතු කරන්නේ.ඔය කියන කාරනේ නන්දන ගුණතිලක මැතිතුමා මම ගරු කරන සභාපතිවරයෙක් එතුමා ඕක කරලා ඇත්තේත් මිට මාස 06 පෙර කරපු යෝජනාවක් වෙන්න ඇති.යෝජනාවක් ක්‍රියාත්මක කරන්න බැහැ විරෝධතා කැදවන්න ඕන විරෝධතා අලවන්න ඕන විරෝධතා ගොනු කරන්න ඕන.අනුමැතිය ගන්න ඕන අනුමැතිය ආණ්ඩුකාරවරයාට යවන්න ඕන ඔය ඔක්කොම කරන්න බැහැ දවසින් දෙකෙන්.ඒනිසා ඔබතුමිය පිළිගන්න.

**03(09)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමණි, මට කරුණක් මතුකරගන්න තියෙනවා.පහුගිය ජනවාරි මාසේ 19 වෙනිදා ඔබතුමාගේ උපන්දිනය දවසේ අපේ සොයිසාපුර භූමියේ යම් කටයුත්තක් සිද්ධවුනා සුවතා මධ්‍යස්ථානය නමින් මධ්‍යස්ථානයක් විවෘත වුනා.ඇත්තට මම සතුටු වුනා මන්ත්‍රීවරයෙක් ලෙස එතන අපි කරපු යෝජනාව යම් ආකාරයකට ඉෂ්ඨ වෙනවාදෝ කියන විශ්වාසය මත ඉතාම සතුටුදායක ආරංචියක් ලෙසයි මම විශ්වාස කලේ.අද වෙනකොට එතන බෝඩ් එක පමණක් තියෙනවා.කිසිදු කටයුත්තක් සිදුවෙන්නේ නැහැ.මම දැනගන්න කැමතියි එකක් එතන නිශ්චිත ලෙස සිදුවෙන්නේ මොකක්ද සහ විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.අපි යෝජනාවකුත් ඉදිරිපත් කලා මේ ස්ථානයේ කාය වර්ධන මධ්‍යස්ථානයක් පවත්වන්න කියන ඉල්ලීම තිබුණා දිගින් දිගටම.මොකද තරුණයෝත් එක බලාපොරෝත්තුවෙන් හිටියා ගරු නගරාධිපතිතුමණි ඉතින් අපි ඉල්ලීමක් කරනවා එ ස්ථානයේ නිකම්ම සුවතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවාට වඩා ජනතාවට යම් තරුණයන්ට යම් කායිකව තමන්ගේ කාය වර්ධන කටයුතු කරන්න පුලුවන් අවස්ථාවක් සහිත ස්ථානයක් බවට පත්වෙනවා නම් හොඳයි කියන ඉල්ලීම තියෙනවා.පොඩි පැහැදිලි කිරිමක් කරන්න ඇත්තටම සිද්ධවෙන්නේ මොකක්ද සහ මම දැනුවත්ව තාම එක විවෘත වුනේ නැහැ.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය අමාත්‍යංශය විසින් අපිට යෝජනාවක් කලා මනුස්සයෙකුගේ රෝගීවිමට හේතු සොයා ගැනිම සදහා අදාල වෙන්නාවු ස්ථානයක් ලබා දෙන්න කියලා. එතනදි අපි විශ්වාස කලා මොරටුවේ දැවැන්ත පිරිසක් එකම තැන ජිවත්වෙන තැනක් තමයි සොයිසාපුර මහල් නිවාසය එක නිසා එක අපි තිරණය කරලා ඔවුන්ට අපි කිව්වා මෙහෙම තැනක් තියෙනවා කියලා ඔවුන් සෞඛ්‍ය අමත්‍යංශයෙන් මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නාවු විශේෂඥ දැනුම තියෙන විශේෂඥ වෛද්‍යවරයෙක් ඇතුළු කණ්ඩායමක් තිරණය කරලා දවසකට සතියකට සති දෙකකට දින දෙකක් හැමනකනාගේම තොරතුරු එකතු කරනවා. උස, උසට බර තොරතුරු එකතුකරලා ඔහුට දෙනවා පතිකාවක් එය කුමන තැනක තියෙන්න ඕනද ඔබගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවන්න කියලා. එක තමයි මෙතනින් කෙරෙන්නේ.ඊට වඩා දෙයක් මෙතනින් කෙරෙන්නේ නැහැ. එක මම හිතනවා කාය වර්ධන කට්ටල 500 ක් ස්ථාපිත කරනවාට වඩා වටින දෙයක් ඔය. අපිට නිරෝගිමත් මිනිසෙක් බිහිකර ගැනිමට පුලුවන් වෙනවානම් මුකුත් ඕන වෙන්නේ නැහැ. මෙන්න මේ කාරණය කිරිමට සෞඛ්‍ය අමාත්‍යංශයෙන් අපිට කිව්වාම අපි හිතුවා සුදුසුම තැන මෙතන කියලා. එතනදි වෙන්නේ තොරතුරු එකතුකර ගැනිම තුලින් ඔවුන්ට පණිවිඩයක් දෙනවා අත් පතිකාවක් මගින් ඔහු ඉන්න ඕන කොහෙද කියලා. මෙය තමයි එතන කෙරෙන්නේ.

**03(09)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඉස්සෙල්ලා මම අර කොන්ක්‍රීට් ස්ලැබ් ගැන කථාකරන්න ගියා කථාකරන්න හම්බවුනේ නැහැ.ගරු නගරාධිපතිතුමා, සි.එස්.සි පෙරේරා මාවතේ ස්ලැබ් එකක් කැඩිලා තියෙනවා දැන් ගොඩක් දවස් ඉදලා පොඩ්ඩක් එ ගැන හොයලා බලලා සකස් කරලා දෙන්න.කාල්ටන් ක්ලබ් එක පාර එවගේම ගරු නගරාධිපතිතුමා, මම ඉන්න කොට්ඨාශයේ ඩෙංගු ව්‍යාප්තිය බොහෝම විශාලව සිද්ධවෙනවා.ගෙවල් පරික්ෂා කරන එක වැඩිකරන්න පුලුවන්නම්

මම හිතනවා හොදයි කියලා.එවගේම අර රෝහල ඉස්සරහා තියෙන රෝහලේ තමයි දැනට ඩෙංගු ලෙඩ්ඩු වාර්තාවෙලා තියෙන්නේ.ඒ පිළිබඳ සොයා බලන ලෙස ඉල්ලා සිටිනවා.

**03(10)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ලක්ෂපතිය අපේ ක්‍රීඩා පිටියේදී ජාතික ජල සම්පාදන මණ්ඩලය සමග නගර සභාවත් සහභාගිවෙලා මල නාලිකා ව්‍යාපෘතියක් සඳහා කටයුතු සුදානම් කරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමණි නගර සභාව දන්නෙත් නැහැ අපි මහජන නියෝජිතයෝ වශයෙන් අපි දන්නේත් නැහැ. මේ දවස්වල ග්‍රාමසේවා නිළධාරියතුමිය මගින් එ බල ප්‍රදේශයේ ජනතාවත් සමග සාකච්ඡාවක් පවත්වාගෙන යනවා නමුත් එ සම්බන්ධයෙන් අපිව කිසි දැනුවත් කිරිමක් කරලා නැහැ.ගරු නගරාධිපතිතුමණි අපි ජාතික ජල සම්පාදනය මණ්ඩලය අතර තියෙන සාකච්ඡා අපි කරන්න ඕනෑ මෙය ප්‍රාදේශිය ලේකම්ගේ ඉඩමක් නෙමෙයි. අපේ සතු දේපලක හදන්නේ. නමුත් ජනතාව දැනුවත් කරන්න ඔන අපි එ සම්බන්ධව අපේ මැදිහත්විම සහ අපේ එකගතාවය මත කටයුතු කරන්න ඔන කියලා අදාල නිළධාරින්ව දැනුවත් කරන්න.

ගරු නගරාධිපතිතුමණි අපි මේ දවස්වල එන්නත්කරණය සිදුවෙමින් පවතිනවා. ගරු නගරාධිපතිතුමණි මේ තුන්වෙනි එන්නත ලබාදිම සම්බන්ධයෙන් මොරටුව බල ප්‍රදේශයේ ජනතාව නිසියාකාරව දන්නේ නැහැ.පලවෙනි මාත්‍රාව දෙවෙනි මාත්‍රාව ලබාගැනිමේදී යම් යම් ස්ථාන ස්ථාපිත කරලා තිබුණා.ඇතැම් නිළධාරින්ගේ අදුරදර්ශි දැක්මක් නිසා කමවත් වැඩපිළිවෙලක් සිදුවෙන්නේ නැහැ.එහෙම නම් කල්දේමුල්ල සොයිසාපුරේදි ගැහුවා නමුත් දැන් සොයිසාපුරේ එ ක්‍රියාදාමය සිදුවෙන්නේ නැහැ.කඩිනමින් තුන්වෙනි මාත්‍රාව ලබාදෙන්න ජනතාව කැමැත්තක් දක්වනවා. ඇතැම් පිරිසක් මාපියාවක් වශයෙන් මේ තුන්වෙනි එන්නත ලබාගැනිමෙන් යම් යම් බෙලහින තාවයට පත්වෙනවා කියලා ප්‍රචාරන කටයුත්තක් සිදුවෙනවා.ජනතාව ජිවත්වෙලා ඉන්න ඕනෑ. තමන්ගේ මදසරුබව හෝ මොකක් හෝ උපත්පාලන යම් ප්‍රතිශතයක් හඳුනාගැනිමට ජනතාව ජිවත්වෙලා ඉන්න ඕන. ඒ සම්බන්ධයෙන් කඩිනමින් මේ අදාල නිළධාරින්ව දැනුවත් කරන්න තුන්වෙනි මාත්‍රාව ලබාගැනිමට අදාල බල ප්‍රදේශයේ යම් යම් ස්ථාන ස්ථාපිත කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිවරුනි, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂකතුමා මාව දැනුවත් කිරිමක් කලා. පළාත් පාළන ආයතන මැදිහත්විම කරලා තුන්වෙනි එන්නත කරන්න කියලා අමාත්‍යංශ ලේකම්තුමා ලිපියක් එවලා තියෙනවා කියලා හෙට දිනයේ සිට අපි ක්‍රියාත්මකවෙලා මේ අදාල වෙන්නාවූ තුන්වෙනි එන්නත ලබාදිමේ කටයුතු සියලු මන්ත්‍රිවරුන්ගේ මැදිහත්භාවයත් එක්ක මේ කටයුතු කරනවා.

<u>මහ නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා ඔබතුමාගෙන් ඉල්ලනවා ආයාචනයක් ඉතාම අසීරුතාවයකට පත්වේලා ඉන්න වේලාවක් මේක. අපේ නගර සභාව දූමායනය සඳහා අයකරන මුදල වැඩි.දූමායන සඳහා අයකරන මුදල හරි වැඩි තුන්දාහක් දුන්නම පන්දාහක් ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී එල්.ඔසඳ හර්ෂණ අබේකොන්</u>

ගරු නගරාධිපතිතුමා, ඔය කියන්නේ දුම්ගැහුවම සල්ලි ගන්නවා කියලද?

<u>නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

නෑ ගරු මන්ත්‍රීතුමා දැනුවත් කිරීම කලා විෂබීජනාශක වලට විතරයි අයකරන්නේ දුම් වලට අයකිරීමක් කරන්නේ නෑ.

**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

එක තමයි මේ කියන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ වේලාවේ බොහො සේවාවන් කරන අය ඔවුන් විසින් ජනයා පීඩාවට පත් කරන ක්‍රියාවලියක් ඉතාම නරක විදියට ආරම්භ කරලා. මේ කියන්නේ ඔබතුමාගේ බොහො හොඳ හිතවතෙකුට වෙච්ච එකක්. අතට දහදහා දීලා ඇඳුම් දෙකකුත් දුන්නම පන්දාහක්ම ඉල්ලලා පොරබැදුවා ඒ නිසා එවැනි මේ තත්වය ඇති වෙන්න දෙන්න එපා. මෙවා කරන අයගේ නම් වෙනමම කියලා.

**නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ඔබතුමා වගකීම අරගෙන මේ ඔක්කොම අයව එහෙට මෙහෙට මාරු කරලා දාන්න. තියන්න එපා එක්කෙනෙක්වත් වැඩක් නෑ මෙහෙම කරලා.

**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමනි, වහාම කටයුතු කරන්න හරිම කණගටුදායක එකක් මන් දන්නවා ඔබතුමාගේ බොහොම හොඳ සම්පතම හිතවත් මහත්තයෙක් ඇඳුනුත් දීලා දහදාහ අතටත් දීලා පන්දාහ ඉල්ලලා සැහෙන්න එතන අරගලයක් කරනවා. ඒ නිසා මන් කිවුවේ මන් ආයාචනයක් කරන්නේ මේවා හොයලා බලන්න මේවා වෙන්න දෙන්න එපා. මේවා ඉතාම අන්තිම කැතයි.

**නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

එ ගැන අදම ක්‍රියාත්මක වෙනවා.

**03(11) මහා නගර සභා මන්ත්‍රී රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මම මීට මාස දෙකකට ඉස්සෙල්ලා රැස්වීමකදී මම ඉල්ලීමක් කෙරුවා අපිට ටෙලිෆොන් ඩිරෙක්ට්‍රියක් මේ මන්ත්‍රීවරුන්ගේ සහ නිළධාරින්ගේ ලබා දෙන්නයි කියලා. ගොඩක් නිළධාරින් වෙනස් වෙලා මන්ත්‍රීවරුන්ගේ ෆෝන් නම්බර් වෙනස් වෙලා කරුණා කරලා ඒ සම්බන්ධව ඔබතුමාගේ අවදානය යොමු කරලා අපට ලබන රැස්වීමටවත් ඒ ටෙලිෆොන් ඩිරෙක්ට්‍රියක් අප්ඩෙට් කරපු ටෙලිෆොන් ඩිරෙක්ට්‍රියක් ලැබෙන්න සළස්වලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

එ වගෙම නගරාධිපති තුමනි, මම ඔබතුමාගේ කාරුණික අවදානයට යොමු කරන්න ඉතාම වැදගත් කාරණයක් තියෙනවා මේ ඇවිල්ලා මධ්‍යම වෙළඳපොළ කඩකාමරයන් හි බදු කුළී මුදල් සංශෝධනය කිරීම හා බදු ගිවිසුම් අළුත් කිරීම සම්බන්ධ මම හිතන්නේ ඔබතුමා දන්නවා දැනට පැන නැගීලා තියෙන පුංචි ප්‍රශ්නයක් සම්බන්ධව. මේ සම්බන්ධව මට ලිවුමක් ලැබිලා තියෙනවා පිටපතක් අපේ කොමසාරිස්තුමාට එඩ්රස් කරලා ඔබතුමාටත් මටත් එවලා තියෙනවා එකක් සිරි ද අල්විස් මහත්මයා ජනක වොච් වර්ක්ස් එකෙන් ලියුම් දෙකක් ලැබිලා තියෙනවා. කිත්සිරි ද සිල්වා මහත්මයා පැලන් ප්‍රින්ටඞ් වෙතින් ඒ වගෙම බුද්ධීනි මහේෂිකා කියලා කෙනෙක් එකත් කොමසාරික්තුමාටත් එඩ්රස් කරලා ඔබතුමටත් මටත් කොපිස් එවලා තියෙනවා. මේකෙදී නගරාධිපතිතුමා එතුමන්ලා මට හමුවෙලා කතා කෙරුවා. එ අය කියනවා මේකේ බදු කුළිය අපි දළ වශයෙන් ප්‍රතිශතය 300% පමණ. අපි වැඩි කරලා තියෙනවා. කරුණාකරලා ඒ වැඩිකිරීම එ

ආකාරයෙන් කරන්න එපා වැඩි කිරීම කමක් නෑ නමුත් 300% මේ අවස්ථාවේදී මේ රටේ තියෙන තත්වයත් අනුව පසුගිය කාලයේ තිබුණු කොවිඩ් වසංගතයත් එක්ක තිබුණු ප්‍රශ්නත් එක්ක 300% වැඩිකිරීමක් එගොල්ලන්ට දරාගන්න අමාරුයි කියලා.

මගේ පුද්ගලික හැඟීම සහා මම ඔබතුමාට කියන්න කැමති මේක වැඩි කරමු. වැඩි කරන එකේ ප්‍රශ්නයක් නෑ. නමුත් අපි වැඩිකරනවනම් අපි දන්නවානේ එතන තියෙන ෆැසිලිටීස්. කිසිම දෙයක් නෑ ටොයිලට් ෆැසිලිටීස් නෑ. එතන මම ඊයේ එ ස්ථානයට යනකොට වොච් රෙපෙයාර් ශොප් එකට යනකොට ඒ ඇතුළු වෙන තැන තනිකර ඔක්කොම කැඩිලා. එතනින් යන්න මට අපහසු උනා ඉතින් එම නිසා අපි පහසුකම් නොදී අපි 300% වැඩි කිරීම මම හිතන්නේ සාධාරණ නෑ. අපි මේක හොඳටම හදලා ඉවර වුනාම අර ඔබතුමාගේ ප්ලෑන් එක අනුව මේක හොඳටම කරලා හොඳටම හදලා වැඩි කිරීම සාධාරණයි. ඒ නිසා මේක ගැන ඔබතුමා කරුණාකර නැවත වරක් කොමසාරිස්තුමත් ඔබතුමත් මේක ගැන ඔබතුමන්ලාගේ අවදානය යොමු කරලා මෙයට වහාම සහනයක් ලබා දෙන්න. ඒ අය වැඩි කරනවට විරුද්ධ නෑ නමුත් සාධාරණ වැඩිකිරීමක් 300% නැතුව.

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයචන හා පෙත්සම් යටතේ මොරටුවේ ජනතාවට වැදගත්වන කාරනයක් සම්බන්ධයෙන් මතක් කරනවා. ඒ තමයි ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන මොරටුව බිම් සවිය කාර්යයාලය සම්බන්ධයෙන් මම හිතන්නේ එම බිම් සවිය ක්‍රමවේදය පිළිබඳව වැඩ කටයුතු පිළිබඳව අපට යම් යම් විවේචන තියෙනවා. නමුත් මේ මොහොත වෙනකොට එක නීතියේ බාලාත්මක ලියවිල්ලක් නිසා ඒ හරහා මොරටුවේ ජනතාවට යම් සේවයක් සිද්ධ වුණා. ගරු නගරාධිපතිතුමනි, මේ මොහොත වෙනකොට මොරටුවේ බිම් සවිය කාර්යාලය ඒ සැලසුම් සකස් කිරීම මිණුම් කටයුතු අවසන් කියලා කාර්යාලය මොරටුවෙන් ඉවත් කිරීමේ කටයුත්තකට සුදානමකින් ඉන්නවා.නමුත් ගරු නගරාධිපතිතුමනි මිණුම් කටයුතු අවසන් වුනාට මන් හිතන්නේ 40%කටවත් සහතිකපත් නිකුත් කරලා නෑ. මොරටුවේ මිනිස්සුන්ට එක නිසා වහාම මැදිහත් වෙලා මොකද යම් විදියකින් මොරටුවේන් බිම් සවිය කාර්යාලය අරගෙන ගියොත් නැවත වතාවක් මිනිස්සුන්ට දෙල්කඳ හෝ වෙනත් ස්ථානයක ස්ථාපිත කරන ප්‍රධාන කාර්යාලයකට යන්න වෙනවා. දැනට මොරටුවේ බිම් සවිය කාර්යාලයටවත් ඇවිල්ලා ඒ ගැන කර ගන්න පුළුවන් මට්ටමක් නැති මිනිස්සු මොරටුවේ ජීවත් වෙනවා. එක නිසා කාරුණා කර වහාම මැදිහත් විය යුතුයි සභාවක් විදියට අපි මේ බිම් සවිය කාර්යාලය මොරටුවෙ ඒ සියළුම සහතිකපත් බෙදා දීමෙන් තුරු වත් එක පවත්වාගෙන යන්න කියන කාරනයට යොමු වෙන්න කියලා ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා.

ගරු නගරාධිපතිතුමනි, හරි අපූරු ලිපියක් දැක්කා පසුගිය දිනෙක ලංකාදීප පුවත්පතේ. ඒ තමයි එදා යුධ බිම අද ගොවි බිමක් බවට පත් වෙලා තියෙනවා කියන කාරණය. මම හිතන්නේ අපි බොහො අය පුරුදු වෙලා ඉන්නෙ අපේ රටේ හමුදාව යුද්ධකාලෙදී විතරක් අභය කරන්න. යුද්ධකාලෙදී විතරයි අපි දන්නවා බොහො අය අපේ මන්ත්‍රීවරු සභාවට අවිල්ලා දෙවනත් කරලා අපේ හමුදාව මෙහෙමයි මේ විදියයි කියලා කතා කළා. එහෙම ඉතාම හොඳ මට්ටමේ ශක්තිමත් හමුදාවක් විදියට යුද්ධය අවසන් කරපු හමුදාව අද රටේ ජාතික අවශ්‍යතාවයන් වෙනුනේ පෙනිහිටිනවා. අද මේ මොහොත වෙනකොට එදා යුද්ධය තිබ්ච්ච යාපනය, තොප්පිගල, අරනගන්විල,වෙල්ලම්කුළම වැනි ප්‍රදේශ ගරු නගරාධිපතිතුමනි ඒ ප්‍රදේශ අද ගම්මාන පිටින්ම කාබනික වගාවට යොමු කරලා විශේෂයෙන්ම හමුදාවේ සෙබළු වගේම පුනුරුත්තාපනය වෙච්ච එල් ටි ටි සමාජිකයින් විශාල ගාණක් එකතු වෙලා හමුදාව එක්දහස් අටසීයය ගාණක් එ වගේම පුනුරුත්තාපනය වෙච්ච එල් ටි ටි සමාජිකයෝ අසු හතර දෙනෙක් ආදි ප්‍රමාණයක් එකතු වෙලා ඒ මුළු ප්‍රදේශයම අපිට මාස හතරකට කලින් අපිත් එ ප්‍රදේශ හි සංචාරයක් කළා. අපි දැක්කා එ වෙනකොට ඒ මුලික කටයුතු වලට එගොල්ලෝ මුහුණ දීලා හිටියේ. නමුත් අද වෙනකොට අපි ප්‍රවෘත්තියෙන් දැක්කා අද ඒ ප්‍රදේශයම කාබනික වගාවට යොමු වෙලා මම හිතන්නේ වී

ගොවිතැන විතරක් නෙමෙයි විශේෂයෙන් පළතුරු වගාව අඹ වගේ බොග වගාවන් වලට යොමු වෙලා එ නිසා ගරු නගරාධිපතිතුමනි මම හිතන්නේ අපි විශේෂයෙන් ස්තුති වෙන්න ඕන. මම හිතන්නේ රජයේ මාධ්‍යත් මැදිහත්වෙලා කරන්න ඕන කාරණයක්. අද ලංකාදීප පුවත්පතෙන් එක ජනතාවට දැනගන්න සලස්වලා තියෙන්නේ. විශේෂයෙන්ම අපේ සහෝදර මොරටුවේ මාධ්‍ය වේදිනී රේඛා තරංගනී මහත්මිය තමයි එක පළ කරලා තිබුනේ. එතුමියටත් අපි සභාව විදියට ස්තුතිවන්ත වෙනවා. එ වගේම අපි ඉතාම ගෞරවයෙන් යුක්තව මොරටුව ජනතාව විදියට අපේ හමුදාවට විරෝදාර හමුදාව මේ කාබනික වාගාව කරන්න බෑ කියලා ගොවියෝ අතර දේශපාලන මතවාදයක් පතුරන වේලාවක අපේ හමුදාවට ඒ කාබනික වාගාවට යොමු වෙලා එක කරන්න පුළුවන් කාරණයක් විදියට නැවත නැවතත් තහවුරු කිරීම පිළිබඳ අපි නැවත නැවත මොරටුව ජනතාව විදියටත් මොරටුව මහා නගර සභාව විදියටත් ඒ කටයුත්ත අගය කරනවා.

**03(13)** <u>**මහා නගර සභා මන්ත්‍රී බී.සජිත් දූමින්ද පීරිස් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා පෙත්සම් යටතේ ඔබතුමාගේ අවදානය යොමු කරන්න කැමති ඊයේ දවසේ සහ මේ දවස් කිහිපය තුළම විශේෂයෙන් මොරටුව නගරය තුළ පදික වේදිකාව වහන නැවැත්වීම සම්බන්ධයෙන් දඩ මුදල් අය කිරීමක් සිද්ධ වෙනවා. ඒ වගේම වාහනේ රියදුරු නැත්තම් නොටිස් එකක් අලවලා යනවා දවස් 28 ඇතුළත ඇවිල්ලා පොලිස්සියට ඉදිරිපත් වෙන්න කියන එක ඒ අනුව සාමනයෙන් රුපියල් 1000ක දඩ මුදලක් තැපැල් කන්තෝරුවට ගෙවනවනම්අය කරනවා. උසාවියට ඉදිරිපත් කරොත් එහෙම 3500ක් විතර අය කරනවා. එ නිසා ගරු නගරාධිපතිතුමනි මම ඔබ තුමාගේ අවදානය යොමු කරන්නේ දිගින් දිගටම අපේ රථගාල පෙනි පෙනි තියෙන සීමාවේ ඉන්න ව්‍යාපාරිකයෝ කිහිප දෙනෙක්ටත් මේ ඊයේ එම දඩ අය කිරීමක් කළා එ නිසා මම ඔබතුමාගේ අවදානය යොමු කරනවා අපි ඉල්ලීමක් කරා මේක ඉක්මනින්ම ක්‍රියාත්මක කරන්න කියලා. මට කතාවක් මතක් වුණා මේකට කියනවා නෙවෙයි සමානයයෙන් කොසොල් රජතුමාගේ කාලේ අහලා තියෙන්නේ දන්සල් තියෙනවා දන්සල පෙනි පෙනි මිනිස්සු බඩගින්න නැතිකර ගත්තා එත් එක්කම අද මේ පදික වේදිකාව වාහන නවත්තලා රථගාල පෙනි පෙනි තියෙද්දී අපේ සමන්ලාල් නගරාධිපතිතුමාගේ කාලයේ මිනිස්සු දඩ පුරවගන්නවා කියන එක තමා මගේ අදහස වුණේ. එ නිසා මේක ක්‍රියාත්මක කරන්න ඔබතුමා එකට ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා.

ගරු නගරාධිපතිතුමනි, පහුගියකාලෙදී ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවත් නගර සභාවත් අතර අවබෝධතා ගිවිසුමක් ඇති වුණා. ඒ තමයි මේ කටුබැද්ද හරිත මංතීරුව නියාමනය කරන්න පවත්වාගෙන යන්න. එ කාලේත් හොඳට සිද්ධවුණා. මේ මැත යුගෙදී දැන් මන් හිතන්නේ ඒ සඳහා යොමු කරන පිරිසේ අඩුවක් තියෙනවාද කියලා මන් දකිනවා වෙනදාට වැඩියෙන් තණකොළ ටිකක් වැවිලා තියෙනවා ගරු නගරාධිපතිතුමනි මන් හිතන්නේ එතන වැඩ කරන සේවකයෙක් හිටියා මීට පෙරත් අවදානය යොමු කළා මම නිතරම යනකොට දකිනවා එතුමා මන් හිතන්නේ පාක්ෂිකයෙක් විදියට ගත්තම ඔබතුමාලාගේ පක්ෂයේ ජයග්‍රහනය වෙනුවෙන් කටයුතු කරපු කෙනෙක්. හැබැයි ඔහු සේවය අතින් ගත්තහම අතිවිශිෂ්ට සේවකයෙක්. එ නිසා මන් හිතන්නේ ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවට අනුයුක්තව සේවය කරපු අඟුලානේ ඉන්න චමින්ද ඔහු ඉතාමත් විශිෂ්ඨව ඒ කාර්යය කරනවා ඇඟට අරගෙන. එ නිසා මන් හිතන්නේ ඔහු ඉතාමත් ආදර්ශයක් ඒ පරිශ්‍රයට. ගරු නගරාධිපතිතුමනි, මම මීට පෙරත් මතක් කළා ඔහුගේ අර සේවා ස්ථිරත්වය හා විශේෂයෙන් ඔහුට ඉඩම් ගොඩකිරීමේ සංස්ථාවේ ඉන්න කළේ රු.40000ක් විතර පඩි හම්බවුණා. දැන් හැබැයි ඊට වඩා අඩු ප්‍රමාණයක් තමා දැන් හම්බෙන්නේ. ඔහු මට එක හරියට කියන්නේ නෑ.

ගරු නගරාධිපතිතුමනි, අපි හාට්ඔපරේෂන් එකක් කරනවනම් ඇත්තටම එක කාඩියෝලොජි කෙනෙක්ට තමයි භාර දෙන්න ඕනි. හැබැයි එක ඩෙන්ටල් සර්ජන් කෙනෙක්ට දීලා හරියන්නේ නෑ. එ නිසා මන් හිතන්නේ අද ඔහුයි ඉද්දි එක පරිපාලනය කරන්න හෝ සුදුස්සෙක් එහෙම ඉන්නකොට එක තව කෙනෙක් බලනවා ඔහුත් දක්ෂයෙක් එ නිසා මන් හිතන්නේ මේකේ

ඇත්තටම ඒ කාඩියෝ සර්ජන් ඔහු. ඒ නිසා මේක ක්‍රියාත්මක කරන්න ඔබතුමාලාගේ විස්වාසය රැක්කා වගේම ආයතනයේත් එ කියන්නේ මේ පරිශ්‍රයත් විස්වාසය රකින ඔහුට අවශ්‍ය කරන සැත්කම් කරලා මෙහෙයුම් කටයුතු කරන්න අවස්ථාව ලබා දෙන්න කියන එක තමා මගේ ඉල්ලීම. ගරු නගරාධිපතිතුමනි අවසාන වශයෙන් අවදානය යොමු කරනවා සභාවේ මතු වෙච්ච සහ අපි මතු කළයුතු කරුණක් ඒ තමයි අපේ පොදු පයිප්ප අපි ජල සැපයුම් ලබා දෙද්දී මේ මාර්ගය කඩන එක ඒ සම්බන්ධයෙන් මොරටුවේ යම් පුද්ගලයෙක් නව උත්පාදන පුරවැසියෙක් එකට නව නිර්මාණයක් කළා. ඔහු මාත් එක්ක ගියා විශේෂයෙන් ආර් ඩී එකට අයිති පාරක්ට මුදලුත් ගෙවලා ඔය පාර කඩන්නේ නැතුව ඔහු යන්ත්‍රයක් නිර්මාණය කරා. එ යන්ත්‍රය නිර්මාණය කරලා යටින් කිසි හානියක් වෙන්නේ නැති වෙන විදියට වතුර ගත්තා. අරගෙන මම එක ඉංජිනේරුතුමන්ටත් ඒ අදාළ අතිරේක ලේකම්තුමන්ටත් එක මතක් කළා. මෙය නගර සභා මට්ටමින් හරි කරන්න පුළුවන්නම් ඉතාමත් වැදගත්. ඔහුගේ තාක්ෂණය ඔහුගේ නවෝත්පාදනය අපිට මෙයට යොමු කරගන්න පුළුවන්නම් හැමදාම එක්කෝ පාර හදනවා පාර හැදුවට පස්සේ පී ආර් ඩී එකෙන් ආර් ඩී එකෙන් නගර සභාවෙන් හැදුවට පස්සේ ජල සම්පාදන මණ්ඩලයෙන් ඇවිල්ලා එක කඩනවා. ඊට පස්සේ විදුලිබල මණ්ඩලේන් ඇවිත් කඩනවා. අර සමෝදානික බවක් අපි මීට පෙරත් කිවුවා අවශ්‍යයි. එ නිසා ගරු නගරාධිපතිතුමනි මේ නවෝත්පාදනයේ තිබේන පුංචි උපකරණ වල පාවිච්චියෙන් ඔවුන්වත් සම්බන්ධ කරගෙන මේක ක්‍රියාත්මක කරන්න. එතකොට අපිට දැවැන්ත විදියටමේ කැඩෙන පාරවල් වල තියෙන පිරිවැය නැත්තම් අපිට ආවස්ථික පිරිවැයක් දරන්න වෙනවා. වෙන දෙයක් කරන්න තියෙන සල්ලි තමයි නැවත වාතාවක් මේක නිර්මාණය කරන්න පුනුරුත්තාපනය කරන්න ප්‍රතිසංස්කරය කරන්න යන්නේ. එක මේවා කරගන්න මේ පුංචි පුංචි කයිසන් වලින් හොයා ගත්තු මේ නවෝත්පාදන පුංචි උපකරණ පාවිච්චි කරන්න ඔවුන්ටත් අවස්ථාවක් ලබාදෙන්න කියා.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී එම්.මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි ඉතා කෙටියෙන් ආයාචනා පෙත්සම් යටතේ ජනතාව විසින් කරපු ඉල්ලීමක් ඉදිරිපත් කරනවා. කරුනාකරලා මම වැරදිනම් ඔබතුමා නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිනවා. ලුනාව කලපු ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙනවා. නමුත් කලපු ව්‍යාපෘතිය සිදු වුනාට එම ප්‍රදේශය ඇවිදින මංතීරුව සහ එම ප්‍රදේශය ඉතාමත් ලෙස අපවිත්‍ර වේලා තියෙනවා ප්ලාස්ටික්, පොල් කොම්බ වගේ දේවල් වැටිලා තියෙනවා ප්ලාස්ටික් බෝතල් ඇවිදෙන පුද්ගලයින්ට ඒ ප්‍රදේශ ඉතාමත් අපිරිසිදුයි ගරු නගරාධිපතිතුමනි. අපි දන්නවා ලුනාව කලපුව සඳහාත් නගර සභාවේ එක මේන්ටෙන් කරන සභාව විසින් සේවකයින් ගණනාවක් අරගෙන තියෙනවා.

<u>නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය ඔබතුමියට දැන් මේක කියන්නම ඕනි. කිවුවේ නැත්තම් ඔබතුමිය තවදුරටත් ඕක ගැන කතා කරනවා. ඇවිදින අයට ගිහිල්ලා 12ට 1ට විතර ගන්න කියන්නකෝ ෆෝටෝ එකක් පාන්දර ඇවිදින අය ඕක දකිනවා. හේතුව අපේ අය වැඩට යන්නේ 9යට. 9යට ගිහින් පවිත්‍ර කටයුතු ඔක්කෝම කරනවා. උදේ ඇවිදින අය එක දකිනවා. ආයේ හවස එක නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, හවසට ඇවිදිනකොටත්

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, හවසට ඇවිදින අයට කියන්නකෝ ඕක තියෙනවාද කියලා උදේට ඇවිදින අය ඕක කියයි. මම එක පිළිගන්නවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

නගරාධිපතිතුමනි, මමත් හවස ඇවිදලා තියෙනවා.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, මමත් මේ ඊයේ පෙරේදාත් ගියා. ඔය කියන මුකුත්ම නෑ. මම මේ බොරුවට කියනවා නෙවෙයි මම ගියා දෙපාරක් තුන්පාරක්ම බලන්න ඉතාමත්ම පිරිසිදු කරන කටයුත්ත ඔවුන් කරනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, වෙනවනම් ප්‍රශ්නයක් නෑ. මන් ඔබතුමාගේ අවදානයට යොමු කරේ මමත් දැකලා තියෙනවා. නිරික්ෂණය කරලා තියෙනවා. එපමණක් නොවේයි ගඟ ප්‍රදේශයේ ප්ලාස්ටික්, පොල් කොම්බ ගොඩක් ඇතුළත් වෙලා තියෙනවා. ප්ලාස්ටික් බෝතල් ඉතින් මේ සම්බන්ධයෙන් පරිසරයනේ කොහොමත් ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

නගරාධිපතිතුමනි, මොරටුව නගරයේ මර්ග පිරිසිදු කිරීම සඳහා නගර සභාවෙන් ක්‍රමවේදයක් තියෙනවා. කලාප වලට වෙන් කරලා නමුත් මේක ක්‍රියාත්මක වීම පිළිබඳව ඔබතුමාගේ අවදානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරන්න තියෙනවා. අපි දැකලා තියෙනවා මොරටුවේ පාරවල් ගණනාවක් තණකොළ වැවිලා සුද්ධ කරලා නෑ. ඉතින් මම දන්නවා කොවිඩ් වසංගතය තියෙනවා. සේවකයන්ගේ ගැටළු තියෙනවා ඒ මධ්‍යයේ තමා ඔබතුමා වැඩ කරන්නේ එ වුණාට ඔබතුමාගේ අවදානය යොමු කරන්න කුණු වලට අවදානය යොමු කරනවා වගේම පාරවල් සුද්ධ කරන්නත් ඒ කියන්නේ දේශපාලන බලපෑමකින් තොරව යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

<u>**නගරාධිපති ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, මේ වෙනකොට ඔය කාර්යයට අපි ආදාළ වෙන්නාවූ සියළු සැළසුම් හදලා ඉවරයි. ගරු සෞඛ්‍ය කමිටු සභාපතිතුමා ලබන සතියේ වෙනකොට අපි ආරම්භ කරනවා. කොට්ඨාශ 29යට තණකොළ කපන්නම මැෂින් 29ක් ගෙනල්ලා තියෙනවා. ඒ නිසා ඉතාමත් සාර්ථක වැඩසටහනකට අපි මුලපිරුවා. දැන් මාස 06ක වේලේ ඉඳලා දැන් යාතාර්ථයක් වෙලා තියෙන්නේ සේවකයොත් යොදවලා වැඩේ කරනවා.

**03(15)** <u>**මහා නගර සභා මන්ත්‍රී එල්.ඔසඳ හර්ෂණ අබේකොන්**</u>

ගරු නගරාධිපතිතුමනි දිගින් දිගටම අපේ මොරටුවේ ගොඩක් ප්‍රදේශවල ගිනිගැනීම් වාර්ථා වෙනවා. එ ගිනිගැනීම් එක්කම අපේ ෆයර් බ්‍රිගේඩ් එක ක්ෂනිකව ගිහිල්ලා එ ගිනිනිවීම් කටයුතු කරනවා. එ වගේම තමයි මේ වෙනකොට හමුදාවේ ඉංජිනේරු බලකායෙන් පළමු වෙඩි නොවදින රථයක් නිර්මාණය කරලා තියෙනවා. නගරාධිපතිතුමනි එ රථය විදේශයකින් ගෙනල්ලා ලක්ෂ 2995ක පමණ පිරිවැයක් දරණවා. නමුත් ලංකාවේ හමුදා සෙබළුන් විසින් මේක ලක්ෂ 150කට මේ රථය හදලා තියෙනවා. ඒ වගේම එක ඕනේම ගිනිගැනීම් ස්ථානයකට එ රථයට යන්න පුළුවන් එ වගේම පිළිස්සුනු කට්ටියව එකේ ඇතුලේ දාගෙන අරන් එන්න පුළුවන් හොඳ ක්‍රමයක් හමුදාව විසින් නිර්මාණය කරලා තියෙනවා. ඒ වගේම අපේ ගිනිගැනීමේ නාගරික

ගාරාජය එකතු වෙලා මේ වගේ සුළුවෙන් හෝ ලොකු ප්‍රදේශයක් ගිනි ගන්නවනම් මේවගේ රථයක් නිර්මාණය කරන්න තියෙනවනම් බොහෝම හොඳයි කියලා මන් විශ්වාස කරනවා. මම රථයක් හදන්න කියනවා නෙවෙයි අපි සුභාෂින්සනය කරනවා ශ්‍රී ලංකා යුද හමුදාවට මේවැනි රථයක් නිර්මාණය කිරීම සම්බන්ධව ලක්ෂ 2995කින් යුතු රථයක් ලක්ෂ 150කට සදා නිමකිරීම සම්බන්ධව.

**03(16)** <u>නියෝජ්‍ය නගරාධිපති - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීවරුන්ගේ අදහස් කිහිපයකින්ම මතුවුණා මොරටුව ප්‍රදේශයේ ඩෙංගු උවදුර බොහොම ශීඝ්‍ර ලෙස පවතින බව. විශේෂයෙන් සඳහන් කරන්න ඕනි මගේ බල ප්‍රදේශය තුළත් විශාල වශයෙන් ඩෙංගු වර්ධනය ඩෙංගු බෝවීම විශාල වශයෙන් සිදු වෙනවා. මේ වෙනකොට අපි අවශ්‍ය ක්‍රියාමාර්ගත් අරන් තියෙනවා. අපේ නගර සභාව හරහා දූමායනය යොදලා විවිධ කටයුතුත් කරනවා. නමුත් එක ප්‍රමාණවත් නෑ කියන එකත් මම විශ්වාස කරනවා. අපේ තියෙන විවිධ අපහසුතා අඩුපාඩුකම් නිසා ගරු නගරාධිපතිතුමනි ඉන්න ප්‍රමානයෙන් හරි උදාහරණයක් වශයෙන් ඩෙංගු බහුලව තියෙන පාරට අපි සතියකට වරක් ලැබෙන කාණු කාණ්ඩයම් දාලා එක සුද්ධ පවිත්‍ර කරන්න තමයි. එකත් බාගෙට කරන්නේ නගරාධිපතිතුමනි දැන් ගිය සඳුදා මගේ ප්‍රදේශයේ කරනකොට මන් එක දැම්මේ ඩෙංගු බෝවෙලා තියෙන ආශ්‍රිතවම තියෙන කාණුවට මේක කොටසයි කරලා තියෙන්නේ. හතරදෙනෙක්ද තුන්දෙනෙක්ද එනවා බාගෙට කරලා යනවා. අර එතනින් එහාට ඩෙංගු තියෙන ප්‍රදේශයේ මිනිස්සුන්ගේ හරියවත් සිද්ධවෙන්නේ නෑ. ඉතින් මෙහිදී අපේ විශල වශයෙන් අම්මා තාත්තාව හොඳට මතක්කරනවා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ අපහසුතාවයෙන් අපිව මගහරවලා දෙන්න කටයුතු කරන්න කියලා. මම මීට පෙරත් සඳහන් කරා කාණු 10ක් 12ක් තියෙන මගේ කොට්ඨාශය තුල සතියකට එකපාරක් ආවම එ ඇවිල්ලත් කාණුවක් සුද්ධකරන්නේ බාගෙට උනාම මහජනතාව බනින එක බොහොම සාධාරනයි. අපේ අම්මා තාත්තා මතක්කරන එක සාධාරණයි කියලා මන් හිතනවා. ඉතින් ඒ නිසා මේ අපහසුතාවයෙන් අපිව මගහරවලා දෙන්න. සතියකට සැරයක් එනවා නගරාධිපතිතුමා කණුවත් බාගෙට කරලා යනවා. අයේ ඒ කාණුවට ලබන සතියෙත් දැම්මම අර කාණු 9යම ඩෙංගු මන් ලඟ වීඩියෝ එවපු එවා තියෙනවා. මම ඔබතුමාට පෙන්නන්නම් ප්‍රධාන සෞඛ්‍ය පරික්ෂකතුමාට පෙන්නුවා අපි මේක මෙතනින් එහාට යන්නේ නැතුව අපේ සභාවෙන් විය යුතු කොටස තමයි ඕක සෞඛ්‍යකටයුතු සභාපතිතුමා පරිණතබාවයක් තියෙනවා. සභාපතිතුමාටත් මේ කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන නිසාත් එතුමාට අවබෝධයක් තියනවා. එතුමා සමඟින් එකතු වෙලා මේ අපහසුතාවයෙන් අපිව මගහරවලා දෙන්න කියලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීම කරනවා.

ගරු නගරාධිපතිතුමනි අපේ සජිත් මන්ත්‍රීතුමා මතක්කරා අපේ මේ වෙනකොට පොලිසිය විසින් ව්‍යාපාරක මහතුන්ව අපහසුතාවයට පත්කරන ආකාරය සම්බන්ධව දඩ කොළ දෙනවා. තමන්ගේ ව්‍යාපාරික ස්ථානය ඉදිරිපිට තමන්ගේ රථය නවත්තගන්න පහසුකමක් ඔවුන්ට දෙන්න ඕන. මොකද පේමන්ට් එක අවහිර කිරීම වැරදී නමුත් පේමන්ට් එක අඩි 20ක් 25ක් පළල තියෙනවනම් තමන්ගේ වාහනය එතන නතරකර ගන්න පුළුවන් වෙන්න ක්‍රමවේදයක් අපි හදලා දෙන්න ඕන. දේශපාලඥඥයෝ වශයෙන් මොරටුවේ බදු ගෙවන ජනතාව වෙනුවෙන් ව්‍යාපාරික මහතුන් වෙනුවෙන් අපි කතාකළ යුතුයි කියලා මන් විශ්වාස කරනවා. මොකද මීට පෙරත් මේවැනි ප්‍රශ්නය එනකොට අපි රථවාහන අංශයේ ඕ.අයි.සී. ලාට රථවාහන අංශයේ ප්‍රධාන පොලිස් නිළධාරින්ට කතා කරලා ඒ අවස්ථාව අරගලත් අවස්ථාත් තිබුණා පේමන්ට් එක අඩි 20ක් තියෙනවනම් ඒ අඩි 20 තුළ අඩි6, 5ක වාහනයක් නතර කරලා තමන්ගේ වාහනයක් නතර කරලා තමන්ගේ ව්‍යාපාරික ස්ථානය කර ගත්තට කිසිම වරදක් නෑ. මොකද ප්‍රධාන ගාලුපාර ගත්තත් පේමන්ට් එක අඩි 20ක් 25ක් තියෙන ස්ථාන තියෙනවා. අපිට එ අවස්ථාවෙදි ඔවුන් සඳහන් කරනවා ඉරක් ගහලා දෙනවා කියලා. වෙනම ඉරක් ගහලා දෙනවා කියලා. මොකද අඩි 2ක 3 පේමන්ට් තියෙන ස්ථාන තියෙනවා. අඩි 20ක් 25ක් තියෙන අන්න එ වාගේ ස්ථාන වල ව්‍යාපරික මහතුන්ට අපි මැදිහත්වෙලා එ උදව්ව කරමු. මොකද එ මිනිස්සු අපිට ගෙවන බදු මුදලින් වරිපනම්

මුදල් වලින් තමයි අපි මේ සභාව පවත්වාගෙන යන්නේ. අපි ඔවුන් වෙනුවෙන් පෙනෙන්නේ නැත්තම් ලොකු අඩුවක්. ඉතින් රටට පදිකයන්ට අපහසුතා නොවන අවස්ථාවල් තියෙනවනම් එක මැදිහත් වෙලා අපි අරන් දෙමු කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ගරු නගරාධිපතිතුමා, ඔසඳ මන්ත්‍රීතුමා මතක්කළා ගිනිවිම සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනි ගිනිවිම අංශය බොහොම හොදට යුහුසුළුව මැදැහත්වෙලා මොරටුව වැල්ල ප්‍රදේශයේ මගේ බලප්‍රදේශයේ ඉතාම දුප්පත් ගෙයක් ගිනිගත්තා. මේ ලගදී ඒ අවස්ථාවේදී මන් බෝධි පූජාවක හිටියේ බෝධි පූජාවවත් කරගන්න බැරිවුනා. කෝල් 50ක් 60ක් ආවා එ වුනාට අපි කියපුගමන් අපේ ගිනිනිවීමේ අංශය ආවා. ඇවිල්ලා එ කටයුතු කරද්දි ඔවුන්ට ලොකු අපහසුතාවයකට ලක් වුණා. මොකද රථය ගෙනියන්න බෑ ගලුපාරෙ නව රෙල්පාර ක්‍රොස් කරලා ගෙනියන්න බෑ. මොකද රේල් පාරේ වෙරළ ආසන්නයේ ගෙදර ගිනිගන්නේ එතකොට යන්න තියෙන එකම මාර්ගය තමයි මදන්ගහවත්ත පාර නමුත් මෙක යන්නත් බෑ. මේ රථය එකම හේතුව නගරාධිපතිතුමනි මේ දුප්පත් මිනිස්සු තමයි එ මිනිස්සු නිවස හදාගෙන ඊටපස්සේ වැටවලුත් ගහගෙන වහලවල් පන්නගෙන තියෙන නිසා එ රථය ගියේ රථය යනකොට තව ගෙයක් ගිනිගන්න තිබ්බා. අනේ ඒ ප්‍රදේශයේ සමහර උදවියගේ ඉල්ලීමක් තිබුණා ඒ මාර්ගය ඔවුන්ගේ නිවාස කඩන්න නෙවෙයි ඒ මාර්ගය පොඩ්ඩක් වාහනයක් පොල්අත්ත දක්වා යන්න පුළුවන් ආකාරයට බොහොම අපහසුයි ඔවුන්ට ජිවත් විමට අපහසුක් නොවන ආකාරයට කරන්න පුළුවන්. එ නිසා පොඩි දැන්විමක් දන්නලා ගරු කොමසාරිස්තුමා හරි ඉංජිනේරුතුමිය හරි එකතුවෙලා මේ අයට තමන්ගේ ප්‍රදේශයේ එ මාර්ගය අවහිර නොවන ආකාරයට කටයුතු කරන්න වැඩපිළිවෙලක් ඉල්ලීමක් වශයෙන් ඔවුන් ඉල්ලුවා. එක අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා. එහෙනම් ඒ දේ සඳහන් කරමින් මම නිහඩ වෙනවා බොහොම ස්තූතියි.

**03(17)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රගාමිණී පිරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොඩි වෙලාවක් විතරක් දෙන්න. එකක් අපි අඩුපාඩුවක් උනාම අපි කියන දෙයක් කෙරුනේ නැති උනාම අපි දොස් කියනවා වගේ හොඳක් උනාමත් එක කියන්න ඕන. ගිය සභාවේදි මන් ඉදිරිපත් කලා ගැටළු දෙකක් මහජන පැමිනිලි පෙත්සම් යටතේ සභාව එන්නත් ඉස්සේල්ලාම ඔබතුමා ක්‍රියාත්මක වෙලා අප ජලය හා අප ද්‍රව්‍ය එවිමේ කටයුතු සම්බන්ධව පී.එච්.අයි මහත්තයාව යොමු කරලා අපේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රසාදය ඔබතුමාටත් කොමසාරිස්තුමා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයටත් මේ අවස්ථාවේදි ගෞරවයෙන් පුදකර සිටිනවා. එ වගේම ගරු නගරාධිපතිතුමනි, මා හරහා ඔබතුමාට යොමු කරපු ආයාචනයක් තියෙනවා එක ඉදිරිපත් කරන්නේ විලියම් සඳර්ලන්ඩ් අංක 08/01,1 වන පටුමග, රාවතාවත්ත,මොරටුව දිනය 2022.01.28 ඔහු ඉල්ලනවා 1 වන පටුමගේ පැතිකාණුව අබලන් වීම නිසා ගොඩක් වැසි දවස් වලට ගොඩක් ප්‍රශ්න මතුවෙනවා. එ වගේම අඩුම තරමේ මහා පල්ලියට 1 වන පටුමග අරම්භයේ ඉදන් මහා පල්ලියට හැරෙන මාර්ගය දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා කාණු පද්ධතියත් සමඟ ම ඔබතුමාගේ කාරුණික අවදානයට යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(18)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපොන්සු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මේ දැක්කා නගරාධිපතිවරුන්ගේ පින්තූර එල්ලලා තියෙනවා. එක හොඳයි අර අතන ඉන්න අපේ මන්ත්‍රීතුමාගේ එක මන් දැක්කා මට එතන පොඩ්ඩක් අඳුරන්නත් බැරි උනා පොඩ්ඩක් එක හොඳයි. මෙහෙම නගරාධිපතිවරුන්ගේ පින්තූර එල්ලන එක්කම ඉල්ලා සිටිනවා නගරාධිපතිතුමනි ගරු සභාපතිවරුන්ගේත් පින්තූර ටික මේකේ එල්ලන්න පුළුවන්නම් ගොඩක් හොඳයි කියලා. මොකද අපි දන්නේ නැති අය ගොඩක් ඉන්නවා. ඉතින් එක අපිට ලොකු උදව්වක් එහෙම දැනගන්න පුළුවන්නම් ඉල්ලනවා. පුළුවන්නම් සභාපතිවරුන්ගේ පින්තූර ටික මේකේ කොහෙහරි ස්ථානයක සවිකරලා දෙන්න කියලා.

## 04. ප්‍රශ්ණ - නැත

## 05. යෝජනා

**05(1)** නගරාධිපති ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව නගරාධිපති ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු මහතා විසින් සභාවට ඉදිරිපත් කරන ලදි.

"මේ වනවිට රට තුළ පැනනැගී ඇති විදුලි අර්බුදයට පිළියමක් ලෙස පළාත් පාලන ආයතන විසින් අනුමත කල ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූල සහතික ලබා දීමට පෙර, එම ගොඩනැගිලි සඳහා සූර්ය විදුලි පද්ධතිය සවිකිරිමට එම අයදුම්කරුවන් උනන්දු කරවීම සඳහා ඔවුන් වෙත සහනදායී පොළී අනුපාතයක් යටතේ ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කර විදුලි උත්පාදන ඉහළ නැංවීමට කටයුතු කිරීම සුදුසු බවට යෝජනාව කරන්නිය."

අංක 05(01) දරණ යෝජනාව නියෝජ්‍ය නගරාධිපති ඩී. සමන්ත සිල්වා මහතා විසින් ස්ථිර කලේය.

<u>**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, අදහසක් ඉදිරිපත් කරන්නට වෙනවා හේතුව තමයි සූර්ය විදුලි පද්ධතියක් සවිකරලා තියෙනවා අපේ ගෙදර මන් පාවිච්චි කරන යුනිට් ප්‍රමාණයට වඩා හැම මාසේම විදුලි පද්ධතියට එකතු කරනවා. යුනිට් 240කට වැඩි ප්‍රමාණයක් එක ණය වාරිකයක් විදියට මම ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ලක්ෂ8ක ණයක් අරගෙන මම එක කළා. නමුත්, දැන් එක ගෙවිගෙන ගිහිල්ලා ඉතුරු වුණාට පස්සේ මන් හිතනවා විදුලි පද්ධතියට එකතුවන ප්‍රමාණය ගත්තාම හැමදාම මට රුපියල් 6000ක 7000ක මුදලක් විදුලි සමාගමෙන් මගේ ගිණුමට බැර කරනවා. ඒ නිසා හිතන්නේ අද රටේ තියෙන තත්වයත් එක්ක බැලුවම මේ අනුකූලතා සහතිකයක් ලබා ගෙන ඉතාමත් විධිමත්වන නිවසකට අපේ රජයට බලපෑමක් කරලා ඔවුන්ට ඉතාමත් සාධාරණ වන්නා වූ පොළියකට විදුලි පද්ධතිය සූර්ය බලයෙන් ලබා ගැනීම සඳහා ඔච්න්ව යොමු කිරීම සඳහා එ රජයත් එක්ක වැඩපිළිවෙලක් හදලා ඔවුන්ට එක දෙනවනම් මන් හිතන්නේ එක පැත්තකින් ගත්තහම අද මතුවෙලා තියෙන කරුනු එක්කම ගත්තාම විදුලි පද්ධතියට විදුලිය එකතු කිරීමක් අපිට කරන්නට පුළුවන් කියලා මන් විශ්වාස කරනවා. එක අත්විදලා තියෙන කෙනෙකු විදියට වසර 5ක වෙලේ ඉදලා අත්විදපු කෙනෙක් විදියට මම දන්නවා මෙහි ඉතාමත්ම හොඳ තත්වයකට ගන්න පුළුවන් මොරටුව මහා නගරසභාවේ සැලසුම් කරලා තියෙනවා ලක්ෂ 400ක් නැත්තම් ලක්ෂ300ක් වියදම්කරලා මේක කරාම අපිට ලක්ෂ 8ක ඉතිරියකුත් වෙනවා විදුලිබිලත් ගෙවලා එ නිසා අපි සකච්ඡා කරමින් යනවා එක පැත්තකින් ලාබේ පැත්තක තියලා හැබැයි තමන්ට උවමනා වෙන යුනිට් ප්‍රමාණය පවා තමන්ගේ ගෙදරින්ම නිෂ්පාදනය කර ගන්නට පුළුවන් වෙන තත්වයක් නිර්මාණය කර ගන්න සමහර මිනිස්සු කැමති කැමැත්තෙන් ඉන්නවා ඔවුන් සඳහා යුහුසුළුව මේ කටයුත්ත කරමින් සමහර වෙලාවට එකඟතාවය ලබා දෙනවනම් ඒ එකඟතාවය මත අද දිනයෙදි ගත්තාවු මේ යෝජනාවේ හරයත් එක්ක මේක රජයට ලියලා ඔවුන්ට සමාන්‍යයෙන් 7%ක විතර පොළියට අපි ගත්තට මේක 3% ක 2%ක විතර වාගේ අඩු පොළියකට ලබා දෙනවානම් මේකට සියළුදෙනා එකඟතාවයක් දක්වයි. එ එකඟතාවය මත පුළුවන් වෙයි මෙය ආදර්ශමත් විදියට පුරෝගාමීත්වයේ නගරය වන අපට පුළුවන් වෙයි මේ රටට විදුලි

පද්ධතියට විදුලිය එකතු කිරීම සඳහා වන්නා වූ එකක එකතු කිරීම නැත්තම් යුනිට් එකතු කිරීම සඳහා වන්නාවූ කාරණයට මැදිහත් වෙන්න මම හිතනවා මේ යෝජනාව යොමු කිරීම සඳහා සුදුසුම කාල පාරාසය තමයි මේ යෝජනාව ඉදිරිපත් කලේ මේ යෝජනාව කිරීම සඳහා නියෝජ්‍ය නගරාධිපතිතුමා මැදිහත් විමත් එ වාගේම මගේ ගරු සහෝදර මන්ත්‍රීවරුන්ටත් අදහස් ප්‍රකාශ කිරීමට ඇතැයි කියලා විශ්විස කරනවා

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි ඔබගේ යෝජනාව ගොඩක් කාලෝචිත යෝජනාවක් ඔබ සොලාපැනල් එක සවි කරාට පස්සේ ඒ සූර්ය විදුලිබල පද්ධතිය මමත් සවිකරා මම හිතනවා මේ වෙනකොට අවුරුද්දකට වැඩි මාත් සවිකරලා මගේත් බිංදුව වෙලා ලයිට් බිල රුපියල් 12000ක් විතර මගේ බැංකු ගිණුමට එනවා එක බොහොම හොඳයි අපි ග්‍රිඩ් එකට යුනිට් 400කට 600කට වඩා යුනිට් ප්‍රමාණයක් අපි ලබා දෙනවා අනිවාර්යයෙන් ග්‍රිඩ් එකට ලබා දෙනවා මේ යෝජනාව හොඳයි නගරාධිපතිතුමනි මේක ඔබතුමා සත්භාවයෙන් ගත් යෝජනාවක් නමුත් මේක ක්‍රියාත්මක කිරීමේදි ඔබතුමා හොඳවම දන්නවා මේක ක්‍රියාත්මක කිරීමේදී අපි ඔක්කෝම ගිවිසුම් අත්සන් කරලා සියළුම මුදල් බැදලා අපි ඒ මීටරය ලබා ගන්න යද්දි අපිට මීටරය ගන්න ලේසියෙන් බෑ මොකද ඒ එකාධිකාරි ආයාතනය විදුලිබල මණ්ඩලය මේ මීටර් දෙන්නේ නෑ ගියගමන් අපි ගිවිසුම් අත්සන් කරලා මුදල් ගෙවලා මීටරයට හැමදෙම කරලා තියෙද්දි එකපාර දෙන්නේ නෑ මීටරේ ටික කාලයක් අදිනවා නගරාධිපතිතුමනි මේක හොඳ යෝජනාවක් අනිවාර්යෙන් ඔබතුමා හොඳටම දන්නවා එදා මුදල් කම්ටුව දවසක මන් ගිහිල්ලා පැය 4ක් බලන් හිටියා මගේ මීටරේට අත්සන් කරන්න මොකද ඒ විදුලිබල මණ්ඩලේ ඉන්න ඒ නිලධාරින් පොඩ්ඩක්වත් කැමති නෑ අපි මේ වැඩේ කරනවට ඔබතුමාට මන් කිවුවා මන් එදා කිවුවා පරුෂ වචනයෙන් පවා බැනලා ආවේ මේක හොඳ යෝජනාවක් මේක මිනිස්සුන්ට තවතවත් ලන්වෙන්න විදුලිබල මණ්ඩලෙත් එක්ක කටයුතු කරන්න මේ විදුලිබල මණ්ඩලෙන් අපිට සහෝදරත්වයේ බැදීමක් තියෙන්න ඕනි මේගොල්ලෝ හොඳයි ග්‍රිඩ් එකට එකතු කරන මේකක් මේගොල්ලෝ වියදම් කරලා සූර්යබල කෝෂ සකස්කරලා තියෙන්නේ එ නිසා මේකට ඉක්මනින්ම ඇවිල්ලා මීටරේ හයිකරලා ගියට පස්සේත් අයේ එගොල්ලෝ කනේක්ෂන් එක දෙන්නේ නෑ එකට නැවතත් එ සප්ලයි කරපු කෙනාම ඕනෙලු එක හයිකරන්න මුකුත්ම නෑ නගරාධිපතිතුමනි වයර් දෙක ඇණ දෙකට දාන්න විතරයි තියෙන්නේ එකට නැවත වතාවක් ඒ අපි සෝලෝපැනල් හයිකරපු ආයතනයට කතා කරන්න ඕන ඒ ඇණ දෙක දාන්න ඔවුන්ට එකත් දාන්න බෑ එක නිසා ඔබතුමාගෙන් කරුණිකව ඉල්ලා සිටිනවා හොඳ යෝජනාවක් මේ හැම නිවසකම හැම මන්ත්‍රීවරයෙකුගේ නිවසකටම හැම ජනතාවගේ පුළුවන් නිවසකම මේක තියෙන්න ඕනි ලයිට්බිල අවම වෙනවා බිංදුව වෙනවා එක නිසා විදුලිබල මණ්ඩලෙත් එක්ක තියෙන සම්බන්ධතාවය ඇතිකරන්න අපි සභාවක් විදියට ඉදිරිපත්වෙමු කියලා මන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රාසාංජන මැන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා දැන් මෙම යෝජනාව සම්බන්ධව ජාතික වශයෙන් ප්‍රශ්නයක් තියෙනවා විදුලිබල සම්බන්ධව අද විදුලි කැපීම් සිද්ධවෙනවා. උසස් පෙළ ශිෂ්‍ය ශිෂ්‍යායාවන්ට ලොකු ප්‍රශ්න පැනනැගිලා තියෙනවා. අධ්‍යාපනය කටයුතු සඳහා මෙවැනි විශාල ප්‍රශ්නයක් මේ මොහොතෙදී රට තුළ සිදු වෙනවා එ සම්බන්ධව පක්ෂ පාට බේදයකින් තොරව අපි හැමොම යම්කිසි දායකත්වයක් යම්කිසි කරන්න පුළුවන් සහයෝගයක් ලබාදෙන්න අවශ්‍යායයි කියන දේශපාලන මතයේ අපි ඉන්නවා සහයෝගය එවාගේම ඔබතුමාත් අවස්ථානනුකූලව මෙවැනි ක්‍රියාත්මක විමක් සම්බන්ධව සාධනියව එකත් අපි පිළිගන්නවා මෙම යෝජනාව තුල ඔබතුමා මෙහෙමයි සඳහන් කරන්නේ අනුමතකල ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූල සහතිකය ලබා දීමට පෙර එතකොට එතන අපිට ප්‍රශ්නයක් තියෙනවා. අනුකූල සහතිකය ලබා දීමට පෙර අපට කෙසේද ඒ ආකාරයෙන් ජනතාවට නැත්තම් මොරටු වැසියන්ට අපි එක ලබාදීමේ ක්‍රියාදාමය කොහොමද කියන එක දැන් ඔබතුමාගේ පැහැදිලි කිරීම තුල අපි දැක්කා අනුකූලතා සහතිකය නිසි පරිදි

ලබාදීමෙන් පසු කාරනාව තමයි ඔබතුමාගේ පැහැදිලි කිරීම තුල අපිට අහුන්කම් දීමට ලැබුණේ එතන මේක නිසාම දැන් අපිට මේ යෝජනාවේ ප්‍රශ්න ගණනාවක් පැනනගිනවා මොකද අනුකූලතා සහතිකය ලබලා දෙන්න මහා නගර සභාවට මැදැහත් වීම එතකොට මහා නගර සභාවට බලය ලබා දී තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය පළාත් සභාව කියලා ආයතනයක් තියෙනවා පළාත් පාළන ආමාත්‍යාංශය තියෙනවා ගිවසුම්ගත වෙනවනම් නගර සභා ගිවසුම්ගත වෙන්න ඕනෑ ණය ලබාදෙන ආයතන සමඟ එතකොට ගිවිසුම් කොහොමද සිදුවන්නේ මෙවැනි ආයතන ගනනාවක් සමඟම එක බෙදාහදා ගන්න ඕන කාරනාවක් කියන එක අපට පැහැදිලි, එතන අපට ප්‍රශ්න කිහිපයක් පැනනගිනවා ගරු නගරාධිපතිතුමා එක සහනදායි පොළි අනුපාතයක් යටතේ ණය යෝජනා ක්‍රමය ආරම්භ කරනුයේ මහා නගර සභාවේ මුදල් වලින්ද නැතහොත් වෙනත් ආයතනයක් හෝ ගිවිසුම්ගතවද අන්න ඒ කාරණය අපිට පැහැදිලි උත්තරයක් අවශ්‍යයයි එ වාගේම එසේ සිදුවෙනවනම් මේක නිසි පරිදි අනුකූළතා සහතික නගර සභාව විසින් නිකුත් කිරීමෙන් පසුව එක තමයි ප්‍රධාන මේ යෝජනාව ඇතුලේ අපිට පැහැදිලි කර ගන්න ඕන දෙක එවැනි වෙනත් ආයතන වෙනම් එ රජයේ හෝ පළාත් පාලන ආමාත්‍යාංශයේ හෝ පළාත් පාලන සභාව සම්බන්ධ වුවක්ද නැතහොත් වෙනත් බාහිර ආයතනයක්ද? තුන්වන කාරනය මේ පිලිබඳව හෝ ඊට ආදාල සංකල්ප එ කියන්නේ කන්සෙප්ට් රිපොට් වාර්තාවක් මහා නගර සභාව භාරයේ තිබේද එය එසේනම් එය සභාගත කළ හැකිද? සූර්ය විදුලිබල පද්ධති ලබා ගැනීමට අයදුම් කිරීම සඳහා මහා නගර සභාවේ අනුකූලතා සහතිකය ඉදිරිපත් කිරීම අනිවාර්යද? මේ සියළු කරුණු ඉටු වුවායින් පසුව නගරවාසියෙකුට තම අභිලාෂය පරිදි එම සූර්යබල පද්ධතිය ඕනෑම ආයතනයකින් නගර සභාව නිර්දේශ නොකර ආයතන වලින්ද ලබා ගැනීමට හැකියාවක් තිබේද? මෙන්න මේ කාරණා ටික පැහැදිලිකර ගන්න අවශ්‍යයි එවගේම අවසාන කාරනාව හැටියට ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම අනුකූලතා සහතික ලබා දීමේ බලය මහා නගර සභාව වෙත පවරාදී ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් එය පාදක කර ගෙන ගිවිසුම්ගත කිරීමක් කරන්නේනම් එම නාගරික සංවර්ධන අධිකාරියේ අනුදැනුම මත හෝ අශිර්වාදය මත සිදුවිය යුතු නොවෙද යන කාරණාව මෙන්න මෙවත් සම්බන්ධ යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍යයයි වෙනවා මොකද අපට සූර්ය බලශක්තිය ලබා දෙන ආයතනයක් වෙනම ණය ලබා දෙන ආයතනය වෙනම ආයතනයක් නගර සභාව මැදැහත්විමක් කරනවා මෙහි කොහොමද මේ රාමුව මේකේ පෙලගැස්වීම කෙසේද සිදුවන්නේ කියන එක සම්බන්දව යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න කියන එක බලාපොරොත්තු වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම් සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ ඔසඳ මන්ත්‍රීතුමා කිවුවා වගේ මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක් ඉතාමත් හොඳයි කිසිම තර්කයක් නෑ මේක මන් හිතන්නේ අද රටේ පවතින වාතාවරනය උඩ ඉතාමත්ම හොඳ යෝජනාවක් එකේ තර්කානුකුලබාවයක් නෑ විරුද්ධත්වයක් එහෙම එකක් නැහැ. හැබැයි මෙහි ගරු නගරාධිපතිතුමනි ප්‍රශ්නයක් තියෙනවා මේ යෝජනාව හොඳයි හැබැයි දැන් සාමනයයෙන් නිවසක් හදන්නේ බහුතරය ලෝන් එකක් දාලා ලෝන් එකකට ගිහිල්ලා තමයි නිවසක් හදන්නේ එතකොට ලෝන් එකකට ගිහිල්ලා නිවසක් හදනකොට මේ නිවස හදලා ඒ නිවසේ අවසානේට අවසන කොටස ගන්න අනුකූලතා සහතිකය පෙන්නන්න ඕනි එ කියන්නේ ලෝන් එකේ අවසාන කොටසට ගන්න එතකොට ලෝන් එකේ අවසාන කොටස ගන්න අනුකූලතා සහතිකය පෙන්නන්න ගියාම නගරසභාව කිවුවම සොලාපැනල් එක හයිකරලා එන්න කියලා එතකොට ප්‍රශ්නයක් තියෙනවා මොකද හේතුව ලෝන් එකේ අවසානය ගන්නේ ඉතුරු වැඩ ටික කරගන්නත්නේ තව ලෝන් එකකට හිරවෙන්නත් ඕනි එක නිසා ගරු නගරාධිපතිතුමනි මේක ඉතාමත්ම හොඳ යෝජනාවක් සල්ලි තියෙනවනම් හොඳම යෝජනාවක් හැබැයි මෙහි මම දකින්නේ පොඩ්ඩක් සංශෝධනය වෙනවනම් මෙහි මේ අනුකූලතා සහතිකය දෙන්න අනිවාර්ය කාරණයක් හැටියට මෙය ගන්නේ නැතුව, නෑ නෑ මේක ගියාට පස්සේ එහෙම උනොත් ප්‍රශ්නයක්නේ මේක අනිවාර්ය කාරණයක් කරන්නේ නැතුව මේ යෝජනාව මේක නගරසභාව දැනුවත් කිරීමෙන් නගරසභාව මෙන්න මේකේ වටිනාකම පිලිබඳව එ ආදාල පුද්ගලයා ආදාල පාර්ෂවය දැනුවත් කිරීමෙන් කාර්යකට

යනවනම් ඇත්තටම මේක තමයි ලංකාවට තියෙන්න ඕන එක එකාගේ තෙල් ටික හිභාකන්නයි මේ අහසින් වතුර වැටෙනකම් ඉන්නයි අරවා මේවා ඕන නෑ මේක මුළු ලංකාවෙම ක්‍රියාත්මක උනානම් මම හිතන්නේ දුමින්ද දිසානයක මැතිතුමා ඉදිරියෙදි මේක ලංකාවෙම ක්‍රියාත්මක කරන්න වැඩසටහනක් හදලා තියෙනවා කියලා මාත් එක්ක කිවුවා ඉතින් ඒ නිසා මේක හොඳ යෝජනාවක් ඉතින් මේක සම්බන්දයෙන් කිසිම තර්කයක් නෑ. හැබැයි මේක අනිවාර්ය කරන්න එපා කියන එක ගෞරවයෙන් ඉල්ලනවා මොකද එහෙම උනොත් ඉදිරියට ගෙයක් හැදීමේ ප්‍රාර්ථනාව තියෙන අපි වගේ දුප්පත් මිනිස්සුන්ට ප්‍රශ්නයක් නිසා ගෞරවයෙන් ඉල්ලනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමණි කථාවක් තියෙනවා ''අඳුරට ශාපකර කර ඉන්නවාට වඩා එක පහන් සිලක් දැල්වීම අගනෙය'' කියලා. ඔබතුමා ඉදිරිපත් කරලා තියෙන මේ යෝජනාව මේ නිශ්චිත මොහොතේ ඉතාමත්ම වැදගත් ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. අපේ රට පිහිටලා තියෙන්නේ ගරු නගරාධිපතිතුමණි සමකයට ආසන්නයේ දවසේ පැය විසිහතරේන් පැය 12ක්ම ඉර එළියට නිරාවරණය වෙච්ච රටක්.එහෙම රටක අපි තාමත් ගල් අගුරු තාප බලාගාරය ඩීසල් වලින් විදුලිය ජනනය කරන්න ගිහිල්ලා ලොකු අලකලංචියක් වෙලා තියෙනවා.ගරු නගරාධිපතිතුමණි අපේ සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රිතුමා අදහස් දැක්වුවා අපේ තිසර මෙන්ඩිස් මන්ත්‍රිතුමා අදහස් දැක්වුවා.තාක්ෂණික කාරණාවක් තියෙන්න පුලුවන් සාමාන්‍යයෙන් අලුත් යෝජනාවක් අලුත් වැඩක් කරන්න යනකොට එකේ සාධනිය තත්වය කථාකරනවා වෙනුවට එකේ නිශේධනිය දේවල් තමයි වැඩිපුර ඉදිරිපත් කරන්නේ.එක රටක් විධියටත් ලෝකයක් විදියටත් එහෙමයි.ලෝකයට කුඩය හඳුන්වලා තිබුනේ චිනය. එක බ්‍රිතාන්‍යයට ගියාම බ්‍රිතාන්‍යයේ පාවිච්චිකරපු පළවෙනි මිනිසුන්ව මැරුවා.දෙවියන් වහන්සේ දෙන වැස්ස අවුව ආවරණය කරන්න දෙවියන් වහන්සේට විරුද්ධව ක්‍රියාත්මක වෙනවා කියලා කුඩය පාවිච්චිකරපු මහා බ්‍රිතාන්‍යයේ එ කාලේ තිබ්බ රාජ ආණ්ඩු ඒ අයව ගාතනය කරන තත්වයට පත්වුනා.ඉතින් ගරු නගරාධිපතිතුමණි ඒ නිසා අලුත් වැඩක් කරන කොට කාබනික පොහොර වැඩෙත් එහෙමයි.අලුත් වැඩක් කරනකොට ඒ තියෙන හොඳ දේ වෙනුවට හොඳ දේ කථාකරලා සංවර්ධනය කරනවා වෙනුවට එකේ තියෙන නිශේධනිය දේවල් කථාකරලා අවසානයේ හොඳ දේ නතර වෙනවා. එක තමයි අපේ රටටත් ලෝකයටත් සිද්ධවුනේ. එනිසා ගරු නගරාධිපතිතුමණි එකෙන් මම කියන් නැහැ අපේ මේ මන්ත්‍රිතුමන්ලා කථාකරපු දේවල් බැහැර කරනවා කියලා කියන්නේ නැහැ. සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රිතුමත් තිසර මන්ත්‍රිතුමත් කියපු දේ මම ඉල්ලා සිටින්නේ ඒ කාරණත් සැලකිල්ලට ලක්කරමින් ඒ සියල්ල මේ යෝජනාව ක්‍රියාත්මක කිරිමට බාධාවක් නොකරගෙන ඒ සියල්ල විසදගෙන මේ ක්‍රියාවලිය අපි මොරටුවෙන් හරි පටන්ගන්නවානම් නගරාධිපතිතුමණි මම විශ්වාස කරනවා එක මුලු රටටම දෙන ආදර්ශයක් කියලා.මේවෙනකොට කඩුවෙල මහ නගර සභාව කසල ජනනයෙන් කිලෝවෝට් 80ක විදුලියක් නිපදවලා එක ප්‍රධාන පද්ධතියට දෙන්න කටයුතු කරමින් යනවා.එනිසා අපි සභාවක් විදියට මේවිදියට තනි තනි ගෙවල් වල මේ සූර්යකෝෂ එවා ඉදිකරන්න අවස්ථාව මේ විදියට යම් කිසි ක්‍රියාමාර්ගයක් හරහා සිද්ධ කරනවානම් ගරු නගරාධිපතිතුමණි එකට අපි විරුද්ධවෙන්න ඔන නැහැ.එකේ තාක්ෂණික කාරණාවක් තියෙනවානම් අපිට විසදගන්න පුලුවන්. එනිසා මගේ අත් දෙකම ඔසවලා ඉතාමත් වැදගත් මේ යෝජනාවට පක්ෂවෙනවා. මොකද එක පැත්තකින් ගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යා දැක්මේ සියයට 70ක් ඉදිරි වසර 5 නැත්නම් 10 වෙනකොට පුනර්ජනනිය බලශක්තිය වෙනුවෙන් මේරට යොමු කරන්න බලාපොරෝත්තුවෙනවා.එහෙම බලාපොරෝත්තුවුනත් බරපතල විදියේ විදුලි මාපියාවක් අපේ රටේ ක්‍රියාත්මක වෙනවා.හිටපුගමන් හොඳට තියෙන විදුලි ජනනයන් කඩාගෙන

වැටෙනවා,අක්‍රියවෙනවා,හිටපුගමන් එක එක දෙවල් සිද්ධවෙනවා. එනිසා ගරු නගරාධිපතිතුමණි තම තමන්ගේ නිවෙස්වල කුඩා ජෙනරේටර් හා සමාන විදියට මේ විදියට සූර්යකෝෂවලින් තමන්ගේ නිවසේ බල ශක්තිය වෙනුවෙන් වැය කරන්න බල ශක්තිය නිපදවන්න පුලුවන්නම් අපි විශ්වාස කරනවා රටක් විදියට අපි එතනට එ අයව තවදුරටත් එගොල්ලන්ව එ වර්ධනය වෙන දිශාවට අපි කටයුතු කරනවා වෙනුවට මේවායේ තියෙන යම් යම් පුංචි පුංචි තාක්ෂණික කාරණා විතරක් ඉස්මතු කරලා හොද දේ යට කරන්න ඉඩ දෙන්න එපා කියමින් මම ඔබතුමාට සුභ පතනවා මේ යොජනාව ක්‍රියාත්මක කරලා මොරටුව ඇතුලේ එ ආදර්ශය රටට ලබාදෙන්න ඔබතුමාගන්න වැයමට ස්තුතිය පල කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, සුරේෂ් මන්ත්‍රීතුමා කියන විදියට මේක ක්‍රියාත්මක නොකරන්න අවශ්‍ය දෙවල් නෙමෙයි අපි කිව්වේ.මේ යෝජනාව කියවනකොට මට දැනිච්ච හැගීම තමයි මම කිව්වේ. එක කියන්න මට අයිතියක් තියෙනවා. මොකද හේතුව මේ යෝජනාවේ තියෙන්නේ මේවන විට රටතුල පවතින විදුලි අර්බුදයට විසඳුමක් ලෙස පළාත් පාලන ආයතන විසින් අනුමත කරපු ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතික ලබාදිමට පෙර එම ගොඩනැගිලි සඳහා සූර්යබලය සූර්ය විදුලි බල පද්ධතිය සවි කිරිමට එම අයදුම්කරුවන් උනන්දුකරවිම සඳහා ඔවුන් වෙත සහනදායි පොලි අනුපාතයක් යටතේ ණය යෝජනා ක්‍රමයක් ආරම්භකර විදුලි උත්පාදනය ඉහල නැංවිමට කටයුතුකිරිම සුදුසු බව යෝජනා කරන්නිය. මේ යෝජනාව සම්බන්ධයෙන් තර්කයක් නැහැ. හැබැයි මෙතන අපිට අපහැදිලි තැනක් තියෙනවා මේකේ තියෙනවා. ගරු නගරාධිපතිතුමණි, අනුකූලතා සහතිකයක් ලබා දිමට පෙර එතකොට ඔබතුමා පැහැදිලිකරලා නැහැ අනිවාර්ය කරනවාද නැද්ද කියන එක. පැහැදිලි කරලා නැහැ මෙතන එනිසා තමයි අපි කිව්වේ මේක අනිවාර්යය කරන්න එපා. හැබැයි මේ යොජනාව හොදයි.මෙයට උත්තේජනයක් දෙන්න පුලුවන්නම් මොටිවේෂන් එකක් දෙන්න පුලුවන්නම් අභිප්‍රේරණයක් කරන්න පුලුවන්නම් එක වඩා හොදයි නගර සභාව මැදිහත්වෙලා ඉතාමත්ම හොදයි. හැබැයි මම ගෞරවයෙන් ඉල්ලනවා අනුකූලතා සහතිකය දිම සඳහා අනිවාර්යය අංගයක් බවට පත්කරගන්න එපා කියලා ගෞරවනිය ඉල්ලිමයි කරන්නේ අභිප්‍රේරණය ඉතාම හොදයි සියයට සියයක් කැමතියි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මේවැනි වු යෝජනාවක් සභාවක් හමුවේ තැබිමක් තුලදි වචනයක් හෝ කථා නොකර සිටියෝත් අඩුපාඩුවක් යැයයි සිතුවා. එකයි මම මේ පිළිබදව කථාකරන්න හිතුවේ. මේහිදි මම දකින සුවිශේෂිම කරුණ තමයි නිවසක් හදාගෙන අනුකූලතා සහතිකය ලබා ගත්තත් අවසානයේදි සූර්ය බල පද්ධතියක් සවිකරගැනිමට යෑමේදි මුදල් තත්වය මත තමයි යම් කිසිකෙනෙක් අපහසුතාවයට පත්වෙන්නේ.මෙහිදි මම දකිනවා සුවිශේෂි ණය යෝජනා ක්‍රමයක් යටතේ මුදල් අවශ්‍යතාව සපුරාලිම සඳහා ඔබවිසින් ක්‍රියාත්මක කරන්න යන්නා වු එ වැඩ පිළිවෙල නිසා ජනතාව ගොඩක් උනන්දුවෙයි. මේ සඳහා යොමුවෙන්න.මොකද මාත් පෞද්ගලිකව දන්නවා මගේ ගෙදර පරිහරණය කරන විදුලි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් මගේ පද්ධතිය හරහා නිෂ්පාදනය කරලා ජාතික පද්ධතියට ලබාදෙනවා එමඟින් මම නිහතමාණි සතුටක් ලබනවා. ඒවගේම තමන් විසින් රටට යමක් දෙනවා කියලා සතුටුවෙන්න පුලුවන්. ජනතාව ගොඩක් බලාගෙන ඉන්නවා නමුත් ඔවුන්ට මේ මුදල් මත තියෙන ප්‍රශ්ණය නිසා තමයි මේ

ක්‍රමවේදයට යන්නේ නැත්තේ.මෙහිදී මම තව ඔබගෙන් ඉල්ලීමක් කරනවා.අනුකූලතා සහතිකය ලබාගන්න එන අයට පමණක් නෙමෙයි තවත් මොරටුවේ ජනතාව කැමැත්තේන් ඉන්නවානම් මේ සූර්ය බල පද්ධතිය තමාගේ නිවසේ සවිකරලා ජාතික පද්ධතියට හා තමාටත් ආර්ථික වශයෙන් ලාභයක් ලබාගන්න රටට ලාභයක් ලබාදෙන්න කැමති අය ඉන්නවානම් ඔවුන්ටත් මෙම ණය යොජනා ක්‍රමය යටතේම දිරිගැන්වීමක් විදියට සුවිශේෂී ව්‍යාපෘතියක් විදියට අපි මොරටුවෙන් ආරම්භකරලා අපි එය රටට ආදර්ශයක් ලබාදෙන්න යොමුකරගමු කියන ඉල්ලීම කරමින් මෙම යොජනාවට අත්දෙකම නෙමෙයි අත් සියයක් හරි උත්සලා අපි අපේ කැමැත්ත පලකරන්න ඉතාමත් කැමැත්තෙන් ඉන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී – එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, සුරේෂ් ගරු මන්ත්‍රීතුමා කිව්ව අදහස්වලට මම ගොඩක් දෙවල් වලට එකගවෙනවා. මා මෙතනදී එකගනොවෙන එකම දෙයක් තමයි. මේවන විට කියන එක මේක ගරු නගරාධිපතිතුමණි මෙහි ඉතාමත් වැදගත් යෝජනාවක්. මේක මේවන විට නෙමෙයි එදත් තිබුණා. අදත් තියෙනවා. මතුවටත් තියෙනවා.මේක කාලෝචිත යෝජනාවක් නෙමෙයි මේක අකාලික යෝජනාවක්. ඇත්තටම ඉතාම වටිනාකමක් තියෙන යෝජනාවක් ගරු නගරාධිපතිතුමණි.මේක ඔබතුමා ඉතාමත් අර්ථවත් ලෙස සදහන් කරලා තියෙනවා. මම හිතන්නේ මන්ත්‍රීවරු තේරුම් ගැනිමේ වරදක් තියෙනවා.අනුකූලතා සහතිකය ලබාගැනිමට පෙර කියන එක.ගරු නගරාධිපතිතුමණි කෙනෙක් නිවසක් හැදුවට පස්සේ අපි එකට සූර්යකෝෂ සවිකරන්න කියලා උනන්දු කරන කොට එයා සමහරවිට අව්ව වැටෙන ආකාරයට නෙමෙයි නිවස හදලා තියෙන්නේ.අපි ගේ හදනකොට එයාව උනන්දුකරනකොට එ පුද්ගලයා උනන්දුවෙනවා ගරු නගරාධිපතිතුමණි හිරු එළිය වැටෙන විදියට අපි නිවසක් ඉදිකරපුවාම සමහරවිට එ නිවසට හිරු එළිය වැටෙන්නැහැ.ගහකට මුවාවෙන්න පුලුවන් නැත්නම් එ කෙනා ගහක් හිටුවන්න පුලුවන් මෙතන ඉතින් අවසානේදී එයා මේක සදහා උනන්දු නොවෙන්න පුලුවන්.සූර්ය බල ශක්තිය ලබාගැනිමට එතකොට ආයෝජනය කරන මුදලේ කිසි තේරුමක් නැහැ.හැබැයි අනුකූලතා සහතිකයට පෙර අපි මේක ගැන එයාව උනන්දු කරන කොට එයා එ සදහා අවශ්‍ය වටාපිටාව එ සියලු දේ හදාගන්නවා.නැගෙනහිරයි බස්නාහිරයි නම් අපිට හිරුඑළිය ගන්න පුලුවන් අපි ගිණිකොනට වහලේ ඇන්ගල් එක දාලා හරියන් නැහැනේ. එතකොට එ ආයෝජනයෙන් කිසිම තේරුමක් නැතිව යනවා. ඉතින් ඒකේ උපරිම ප්‍රයෝජනය ගන්න ඒ කෙනාව දැනුවත් කරලා තාක්ෂණික දැනුමක් දුන්නාම ඉතාමත් හොදින් පෙලබෙනවා. ඒ ආයෝජනය කරන එකෙන් ලොකු වටිනාකමක් තියෙනවා. ඇත්තටම ගරු නගරාධිපතිතුමණි හොද යොජනාවක් මෙය සිදුවිය යුතුයි. මා තවත් මේකට එකතුකරන්න කැමතියි අපිට පුලුවන්නම් අනුකූලතා සහතිකය ගන්නට පෙර මොකද අපේ තුන්සිය හැටපස් දවසේම අව්ව තියෙනවා තුන්සිය හැටපස් දවසේම සුළඟ තියෙනවා අපි බොහෝදුරට නිවසක් හැදුවාම හිරු එළිය නිවසට එන විදියට නෙමෙයි හදන්නේ. අනුකූලතා සහතිකය ලබා දුන්නත් නැවත කාලේකදි ජනේල වහනවා එ ගෙදරට හිරු එළිය එන්නේ නැහැ.එවගේම නිවසේ ස්ලැබ් එක දානවා නිසි උස ප්‍රමාණයක් නැහැ.ලැබෙන හිරු රශ්මිය නිසා ගෙයි රස්නය වැඩි වුනාම පැය විසිහතරේම ගෙයි ෆැන් එක දානවා.ඉතින් මේක ජාතික විදුලියට ඉතාමත් මහත් බරක් ආර්ථිකයට මහත් බරක්.ගරු නගරාධිපතිතුමණි ඉතාමත් හොද යෝජනාවක් සියලුදෙනාගේ සුභ පැතුම් පුදකරමින් මම කියනවා මේක ඉදිරියට හොද තාක්ෂණික මණ්ඩලයක් මේවෙනුවෙන් පත්කරලා මේක ඉදිරියටම කරගෙන යා යුතුයි කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමණි ඔබතුමාගේ යෝජනාව ගැන යමක් ප්‍රකාශ කිරිමට කැමතියි.තිසර මන්ත්‍රිතුමා කියපු දේට මම යමක් එකතු කරන්නම්. මේක ඉතාම කාලින යෝජනාවක්.ලංකාවේ අවශ්‍යතාවයක් ඔබතුමා හදුනාගෙන එ සම්බන්ධයෙන් ඔබතුමා මේක ඉදිරිපත් කරලා තියෙනවා.නමුත් මේ යෝජනාව කියවන කොට මට හැගිගියේ නගරාධිපතිතුමණි මේකේ ගලපලා තියෙන විදියට ප්‍රතිබන්ධනය කරන්න බැරි කරුණු ගනනාවක් මේකේ ඇතුලේ සඳහන් වෙනවා කියලා මට හැගියනවා.ඔබතුමාගේ අරමුණ සූර්යබල ශක්තිය ප්‍රවර්ධනය කිරිම නම් මොරටුව ප්‍රදේශයේ මම ඔබතුමාගෙන් ඉල්ලිමක් කරන්න කැමතියි සූර්ය බල ශක්තිය ප්‍රවර්ධනය කිරිමට නගර සභාව හරහා වෙනම ව්‍යාපෘතියක් කරන්න කියලා.එතකොට මිනිස්සුනට සූර්යබල ශක්තිය මාරුවෙන්න එ සම්බන්ධයෙන් වෙනම දැනුවත් කිරිමේ ව්‍යාපෘතියක් කරන්න කියලා මම ඔබතුමාට යෝජනා කරනවා.මොකද අපි දන්නවා සූර්ය බල ශක්තිය ලබාගන්නනම් එකට අදාල වු පිරැක් විසිට් තියෙනවා මම කියන්න කැමතියි සෝලා පැනල් එකක් ගත්තෝත් පැනල් එකෙන් වොට් 420ක් නිපදවනවා.බර ප්‍රමාණය කිලෝග්රෑම් 24 ක් විතරවෙනවා අවම වශයෙන් නිවසකට වොට්200 ක් වත් දාන්න ඕන මේ පැනල් 5 ක්වත් ගෙදර හදන්න ඕන.කිලෝ 120 ක විතර ප්‍රමාණයක පැනල් තමන්ගේ වහලේ හයි කරන්න ඕන.එතකොට නිවසක් මේ සම්බන්ධයෙන් හරියට හදලා තියෙනවාද ඔන්න ඔයවගේ දේවල් සම්බන්ධයෙන් ජනතාව මුල් අවස්ථාවේ දැනුවත් කරන්න ඕන.බිල්ඩින් එකක් ගෙදර ප්ලැන් කරනවානම් එතකොට ප්ලැනින් ස්ටෙජ් එකෙත් අපි ජනතාව දැනුවත් කිරිමේ අවශ්‍යතාවයක් තියෙනවා.වහලට ලැබෙන ආලෝකය ප්‍රමාණය ගොඩනැගිල්ලේ පිහිටිම ගහකොල ප්‍රමාණය මොන ආයතනයක් හරහාද සෝලා පැනල් ගන්නේ.රේජිස්ටඩ් ආයතන තියෙනවා එතකොට පබ්ලික් යුටිලිටිස් කර්මිෂන් එක හරහා මේක ලියාපදිංචි වෙනවාද කොහොමද ග්‍රිඩ් එකට කන්ට්‍රිබියුට් කරන්නේ.මෙන්න මෙවගේ කරුණු ගණනාවක් තියෙනවා. ණය ලබාදිමට අමතරව සපුරාලිය යුතු කරුණු ගණනාවක් තියෙනවා. එ සම්බන්ධයෙන් මුල් අවස්ථාවේදි ජනතාව දැනුවත් කිරිමේ අවශ්‍යතාවයක් තියෙනවා.මම යෝජනා කරන්න කැමතියි ඔබතුමාගේ යෝජනාවට සංශෝදනයක් ලෙස මේක මුල් අවස්ථාවේ කරන්නේ කියලා.අනුකූලතා සහතිකය දෙන අවස්ථාවේ නොව එතකොට නගරාධිපතිතුමණි මේ යෝජනාව කියවන කෙනෙකුට හැගියනවා අනුකූලතා සහතිකය ලබාගැනිමට මේක අනිවාර්යය සාධකයක් වෙන්න පුලුවන්ද? මෙතන කියන්නේ උනන්දුව නමුත් අවසානයේ දන්නවා නගර සභාවේ යම් යම් දෙවල් වෙන හැටි එහෙම බැලුවාම අවසානයේ ජනතාවට හැගියන්න පුලුවන් දැන් නගරසභාවේ අනුකූලතා සහතිකය ගන්නනම් සූර්ය බල ශක්තිය ගන්න අනිවාර්යය වෙනවාද කියලා. ඉතින් මේ හරහා අනවශ්‍ය පැත්තකට මෙය යන්නත් පුලුවන්.ඉතින් මේන්න මේ සියලු දේනිසා තමයි අපි ඔබතුමාට ඉදිරිපත් කරන්න කැමතියි හේතුව ණයක් අරගෙන ගෙයක් හදනවානම් අවසාන ලොන් එකේ සියයට විස්ස දෙන්නනම් අනුකූලතා සහතිකය ගන්න ඕන.එතනත් ගැටලුවක් තියෙනවා ගරු නගරාධිපතිතුමණි.ඉතින් මෙන්න මේ සියලු දේවල්ම සලකලා බලලා අනික් එක සූර්ය කොෂයක් දාන එක මිනිස්සුන්ගේ ප්‍රසනල් චොයිස් එකක් තමුන්ගේ ආර්ථික මට්ටමත් බලපානවා.එක මිනිස්සුන්ගේ තිරණයක්.ඉතින් එකට නගර සභාවක් හැටියට අපිට බලපැම් කරන්න බැහැ.අපිට ඉල්ලිමක් තමයි කරන්න පුලුවන්.ඉතින් මම ඔබතුමාගෙන් සියලු කරුණු සලකලා බලලා ඔබතුමාගේ යෝජනාවට සත්භාවයෙන් කියන්න කැමතියි මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අරමුණ සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කිරිමනම් එ සම්බන්ධයෙන් වෙනම ව්‍යාපෘතියක් යටතේ ජනතාව දැනුවත් කිරිමේ ව්‍යපෘතියක් කරන්න කියලා. මේක අනුකූලතා සහතිකයට ගැටගහන්නේ නැතිව.එහෙම කියලා ඔබතුමාගේ යෝජනාව කාලිනයි කියලා කියනවා. එපමණක් නෙමෙයි රටේ පවතින විදුලි අර්බුදයට මූලික හේතුව වර්තමාන රජයේ ඩොලර් අර්බුදය. එ ඩොලර් අර්බුදය සහ මිස් මැනේජ්මන්ට් එක තමයි තියෙන මූලික අර්බුදය.එ අර්බුදයට රජයක් හැටියට විසදුම ලබා දිය යුතුයි.අඩුම ගානේ විදුලිය කපනවානම් ජනතාවට එ සම්බන්ධයෙන් පෙර දැනුවත් කිරිමක් කරන්න.ඇමතිතුමා කියනවා

කපන්නේ නැහැ කියලා පිසියුඑල් එකේ සභාපතිතුමා කියනවා කපනවා කියලා. රටේ ආයතන අතර කිසිම සම්බන්ධතාවයක් නැහැ.ජනතාවට දැනුවත් කිරිමක් කරන්නේ නැහැ.ඊයේ දිනයේදි අපි දැක්කා අවස්ථා ගණනාවකදි පෙර දැනුම් දිමක් නැතිව විදුලිය කප්පාදු කරනවා.එතකොට ව්‍යාපාර කරන ජනතාව, බිස්නස් රන්කරන ජනතාව, වැඩකරන ජනතාව ඉතාමත් අපහසුතාවයට පත්වෙනවා.මේන්න මේ සම්බන්ධයෙන් වගකිම භාරගන්න ඕන.පුටුවල ඉන්න පුද්ගලයෝ වගකිම භාරගන්න ඕන.හැමදේටම නිදහසට කරුණු කියලා ඒවා සාධාරණිය කරනය කිරිම නෙමෙයි.ජනතාව අපහසුතාවයට පත්නොකිරිමට තමයි මිනිස්සුන්ව පුටුවලට පත්කරන්නේ.එ අවස්ථාවලදි මම ඉල්ලිමක් කරන්න කැමතියි අඩුම ගානේ ඩොලර් අර්බුදය මේ ප්‍රශ්ණය තියෙනවානම් පවර් කට් එකක් කරනවානම් ජනතාව කලින් දැනුවත් කරන්න කියලා. එපමණක් නෙමෙයි මේක ඉතා සෝචනිය කරුණක් 2022 වර්ෂය වෙලා පැය විසිහතරක් ජනතාවට විදුලිය දේන්න බැහැ කියන්නේ ඇත්තටම ලොකු ගැටලුවක්.රටේ ලොකු දැවෙන ප්‍රශ්ණයක්.ඉකොනොමික් මිස්මැනේජ්මන්ට් මේක දේශපාලන අර්බුදයක්.මේ සියලු දේවල්වලට විසදුම් ලබාදිය යුතුයි.ඔබතුමා ඉතාම වගකිමෙන් වැඩකටයුතු කරන පුද්ගලයෙක් ඉතින් ඔබතුමාගේ යෝජනාවට අපි කියනවා මේක සංශෝධනය වියයුතුයි.මේක ඉතාම කාලින යෝජනාවක් නමුත් මම කිව්වා වගේ කරුණු ගණනාවක් එකතු කරලා තියෙනවා. එනිසා මේක සංශෝදනය විය යුතුයි කියලා මම යොජනා කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ඔබතුමන් විසින් ඉදිරිපත් කරන සාධනිය ඉතාම වටින කියන යෝජනාව පිළිබද එකගතාවය පලකරමින්ම මතක්කරන්න ඕන මම හිතන්නේ මම මතුකරන්න හිටපු කාරණයට කලින් කියන්නට ඕන අපේ ලිහිණි මන්ත්‍රිතුමිය කථා කරලා කිව්වා එතුමියගේ කථාව ඇතුලේ හොද කථා ටිකකුත් තිබුණා නැතුවාම නොවෙයි හැබැයි එතුමියට මතක් කරන්න ඕන එතුමිය කියනවා මේක සුර්ය පැනල් 4 ක් හයි කරන්න ඕන අවම වශයෙන් එකට කිලෝ 20 ක් විතර බර දරන්න පුලුවන් වහලට කිලෝ 120 කියන්නේ සාමානයයෙන් බර තියෙන පුද්ගලයෝ දෙදෙනෙක්ගේ බර සාමාන්‍යයෙන් වහලේ සිට් දාන්නත් දෙන්නෙක් නගිනවා.එ නිසා සාමාන්‍ය වහලකට ඔබතුමියගේ අදහස බැහැර කරනවා නෙමෙයි.හැබැයි ඉතින් මතු කරපු කාරණය පුරුෂයෝ දෙන්නෙක්ගේ බර. හැබැයි ඔබතුමිය කියනවා වර්තමාන විදුලි අර්බුදයට හේතුව මේ රජයේ කළමණාකරණය පිළිබද ප්‍රශ්ණය හා ඩොලර් ප්‍රශ්ණය. හැබැයි එක ගැන අපි කථාකරන්න යන්නේ නැහැ.එහි යම් බලපැමක් යම් වගකිමක් රජය විදියට භාරගන්න ඕන.හැබැයි අමතක කරන්න එපා ඔබතුමියලාගේ ආණ්ඩුවේ විදුලිබල ඇමතිවරයා කලුවර ජයසුරිය බවට පත්වෙලා හිටියා කාලයක්.මේ පැයක් දෙකක් නෙමෙයි පැය විසිහතරක් විදුලිය කපපු රටක් මේක.හැබැයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ පාලන කාල ඇතුලේ අපේ සජිත් මන්ත්‍රිතුමා පපුවට මෙහෙම තට්ටුකරලා කියයි එහෙම සැලසුමක් තිබුණා එ ආණ්ඩුව ඇතුලේ බලාගාර හදන්න හැබැයි යහපාලන ආණ්ඩුව ආවට පස්සේ එවා නැවැත්තුවා එවයේ ප්‍රතිඵලය තමයි අද බුක්තිවිදින්න වෙලා තියෙන්නේ.මම මේ යෝජනාව සම්බන්ධව මතුකරන කාරණය තමයි ගරු නගරාධිපතිතුමනි අපිට පුලුවන් විශේෂයෙන්ම මහල් නිවාස සංකිර්ණ ඉදිකිරිමේදි රජයේ හෝ විශේෂයෙන්ම අද පෞද්ගලික ආයතන මගින් මහල් නිවාස සංකිර්ණ ඉදිකිරිමේදි මේවාට වැඩි බලපැමක් කරන්න.එවගේම දැනට ඉදිකරලා තියෙන මහල් නිවාස සංකිර්ණවල වුනත් මේ කාරණාව සාධනිය ලෙස යොදාගන්න පුලුවන්.එක නිසා එවෙනුවෙනුත් යම් වැඩපිළිවෙලක් ආරම්භ කරන්න මේ යොජනාවට එකතු කරන්න කියන ඉල්ලිම කරමින් ඔබතුමාගේ මේ සාධනිය යෝජනාවට අපේ එකගතාවය පලකරමින් සුභපතනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, අද දවසේ කථාකරන සූර්යබල ශක්තිය හෝ පුනර්ජනනිය බලශක්තිය කියන මේ බල ශක්තියේ සූර්යබල ශක්ති ප්‍රභවය පිළිබඳව අපි කථාකරනවානම් අමතක කරන්න බැරිචරිතයක් තියෙනවා එතමයි 2010 සැප්තැම්බර මස 15 වෙනිදා ලංකාවේ පලවෙනි සූර්ය සංග්‍රාමය සිද්ධවෙනවා බි. එම්. මහිපාල මහත්තයා. බි. එම්. මහිපාල මහත්තයා තමන්ගේ පෞද්ගලික මුදලින් තමන්ගේ ව්‍යාපාරික ස්ථානයෙත් ඒවගේම නිවසෙත් ඒ සූර්යකෝෂ ස්ථාපනය කරනවා.එ පෞද්ගලික වියදමින්.ඒ පලමු උත්සවයට මම සම්බන්ධවුන කෙනෙක් විදියට අද එහි ඵලය විශේෂයෙන් අද සමාජගතවෙලා තියෙනවා ගරු නගරාධිපතිතුමණි.විශේෂයෙන් මහිපාල මහත්තයා තමන්ගේ ව්‍යාපාරික ස්ථානයේ නිවසේ සකස්කරන වෙලාවේ ලංකාවේ සාමාන්‍යයෙන් විදුලි ඉල්ලුම 2010 වසරේ බලද්දි 2021 දි විදුලි බල ඉල්ලුම බවට පත්වෙලා තියෙන්නේ මෙගාවොට් 6500ක් රාත්‍රි කාලයේ විතරක්.හැබැයි අද වෙනකොට ඊයේ දවස වෙනකොට 2750කට අඩුකරගන්න පුලුවන් වුනේ මේ මහිපාල මහත්තයා තිබ්බ පියවරක් විදියට විශේෂයෙන්ම අපේ විදුලිබල හා බලශක්ති අමාත්‍ය චම්පික රණවක ඇමතිතුමා ඉන්න කාලේ පලවෙනියාට ස්වකැමැත්තෙන් තමන්ගේ වියදමින් එක ඉටු කලා මහිපාල මහත්තයා.එ අනුව අද ගරු නගරාධිපතිතුමණි ගෙවල් 30000ක මේ විදුලිය ස්ථාපනය වෙලා තියෙනවා.අදවෙනකොට මේ සූර්ය බලශක්තියෙන් මේ ග්‍රිඩ් එකට මෙගාවොට් 1500ක් ලබාදෙන්න.හැබැයි අදවෙනකොට සූර්ය බලශක්තියෙන් මේ ග්‍රිඩ් එකට එකතුවෙලා තියෙන්නෙ මෙගාවොට් 480යි තවත් අපිට රේක්ටයක් තියෙනවා 1020ක එ අනුව අපිට සූර්ය බලශක්තියෙන් බලාපොරෝත්තුවෙච්ච මට්ටමට ගෙනියන්න පුලුවන්.අනෙක් පැත්තෙන් ගරු නගරාධිපතිතුමණි කටයුත්ත යන අතරවාරයේ ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි. අපිට පුලුවන් කමක් තියෙනවා අනෙක් පැත්තෙන් විශේෂයෙන් විදුලිය අපිට පුලුවන් විදුලිය ඉල්ලුම කළමනාකරනය කරගන්න.මේ සුනිත්‍ය බලශක්ති අධිකාරියේ හිටියා මහාචාර්යය ඕ කේ දිසානායකත් සුගතපාල මහත්තයාත් මතක් කරන්න ඕන.එ අනුව මහාචාර්යය ඒ කේ දිසානායකත් එවගේම අනෙක් පැත්තෙන් සුගතපාල මහත්තයාත් විශේෂයෙන් ව්‍යාපාරික ස්ථානයේන ස්ථානයට ගිහිල්ලා එ කාලේ තිබ්බේ ටන්ස්ටන් එ ටන්ස්ටන් වෙනුවට සිඑෆ්එල් බල්බ් හා විශේෂයෙන් එල් ඉ ඩි බල්බ් ප්‍රවර්ධනය කරන්න ඔවුන් ආයතනවලට ගියා.එ අනුව අද විදුලි ඉල්ලුම අඩුවෙන්නත් යම් විදියකින් මේකාරණාව හේතුවුනා. එ සුනිත්‍ය බලශක්ති අධිකාරිය හිටපු සභාපතිවරයාත් එවගේම අධ්‍යක්ෂක ජනරාල්වරයාත් කරපු කටයුත්ත එවගේම අවධානය යොමුකරන්න කැමතියි ඊලග සංකල්පය තමයි එ අනුව අද අපිට නැවතවතාවක් ටන්ස්ටන් වලින් තොරව අපිට යන්න පුලුවන් කමක් තියෙනවානම් එ ආයතනවල LED සහ එවගේම විදුලි ඉල්ලුම කළමණාකරනය කරගන්න එ කටයුත්තට නැවත වතාවක් යන්න ඕන.මේවෙලාවේ මම කෙසේවෙතත් මතක් කරන්න ඕන අපේ පරිසර අමාත්‍යාංශය යටතේ සිදුවුනා. එවගේ ම අපේ උදයගම්මන්පිල ඇමතිතුමා ඒ කාලේ කෘෂිකර්ම ගොවිජන සංවර්ධන වාරිමාර්ග ඇමතිතුමා වෙලා ඉන්න කොට එතුමා නිවෙස්වල විදුලිය කළමණාකරනය කරන්න අපේ ව්‍යාපෘතිය යටතේ විශේෂයෙන් එතුමා බල්බ් නොමිලේ ලබා දුන්නා.එ බලශක්ති කළමණාකරන වැඩසටහනේ දේශන කරන්න ගමින් ගමට ගියේ මම එයින් රු3000 ක මුදලක් එක දේශනයක් සඳහා මට ගෙව්වා.එ අනුව එයින් ඇතිවෙච්ච මුදල් 128000ක් එකතු කරලා තමයි ලුනාව රෝහලේ මාතෘ සායනය ඉදිකරන්න එ මුදල් පාවිච්චිකරේ.මේවෙලාවේ ගෞරවයක් විදියට මම සිහිපත් කරන්න කැමතියි. සාමාන්‍යයෙන් අපි යුනිට් එකක් කියලා කියන්නේ පැයකදි පාවිච්චිවෙන කිලෝවොට් එකක ප්‍රමාණය යුනිට් 1000ක් එකතුවුනාම හැදෙනවා කිලෝවොට් එකක් කිලෝවොට් 1000ක් එකතුවුනාම හැදෙනවා මෙගාවොට් එකක් මෙගාවොට් 1000ක් එකතුවුනාම හැදෙනවා ජිගාවොට් එකක් ජිගාවොට් 1000ක් එකතුවුනාම හැදෙනවා ටෙරා වොට් එකක් ගරු නගරාධිපතිතුමණි අපි කොහොමද ඉල්ලුම සම්පාදනය කරනනේ කිව්වාම අපේ පහුගිය කාලේ ව්‍යාපෘතිතුල මොරටුවේ අපේ මේ පරිශ්‍රය සුනිත්‍ය පරිශ්‍රයක් පවට පත්කලයුතුයි.ඒවගේම අපේ තියෙන ව්‍යාපාරික ස්ථාන අපි සුනිත්‍ය ස්ථාන බවට පත්කරන්න ඕන. සාමාන්‍ය ගෙවල්වල නෙමෙයි එ අවශ්‍ය කරන ලබාදෙන්න පුලුවන් විදුලි ඉල්ලුම වෙච්ච 1020 ඇතුලත අපිට පුලුවන්නම් මේ පරිශ්‍රය ඇතුලත එක කරන්න අපි කරලා තියෙනවා.ගරු නගරාධිපතිතුමණි අපිට මතකයි අපි මේ කටුබැද්ද හරිත මන්ත්‍රිරුව කිලෝවොට් විශාල ප්‍රමාණයක් ලබාදෙන ස්ථානයක්

බවට පත්කරන්න පුලුවන් වුනා. මහා නගර හා බස්නාහිර සංවර්ධන ආමාත්‍යාංශය යටතේ එවගේම මේ ඉදිරියේ තියෙන අපේ පුරන්අප්පු චතුරස්‍රයේ උඩ තියෙන එ වගේම කටුබැද්දේ හදන අලුත් මාකට් එක මාකට් සිටි එකට එක ස්ථාපිත කරලා තියෙනවා.මම හිතන්නේ අපේ ප්‍රධාන ස්ථාන වලට ව්‍යපෘති යෝජනාව එක තමයි ප්‍රධාන දේ අපිට ආයෝජනය කරන්න පුලුවන් ප්‍රධාන මර්මස්ථාන විදුලිය වැඩියෙන් යන තැන්වලට තමයි මේක ආයෝජනය කරන්න ඕන.එ අනුව තමයි අපිට විදුලිය කළමනාකරනය කරගන්න පුලුවන් ජලවිදුලි බලාගාරයක් බවට පත්කරගන්න පුලුවන් එක.එනිසා අපි අදවෙනකොට අපි අපේ කාර්යභාරය ප්‍රායෝගිකව කරලා තියෙනවා.ඊළග එක තමයි කොට්ටාව ට්‍රාන්ස්පොට් හබ්එකේ විතරක් තියෙනවා මෙගාවොට් භාගයක් ඒ කියන්නේ කිලෝවොට් 500 ක ප්‍රමාණයක්.අදවෙනකොට ලක්ෂ දොලහාමාරක් එයින් ඉතුරුවෙනවා.එවගේම කිලෝවොට් 200 ක විතර ප්‍රමාණයකින් අපිට ස්ථාපිත කරන්න පුලුවන් වුනොත් ලක්ෂ පහක මුදලක් ඉතිරිකරගන්න පුලුවන්.එ නිසා මේකට ආයෝජනය කරන්න පුලුවන් මිනිස්සු ඉන්නවා.එ තමයි ව්‍යාපාරික තමන්ට තියෙන මූල්‍ය ප්‍රාග්ධනය යොමුකරන්න පුලුවන් ආකාරය අනුව එ ව්‍යාපාරික ක්‍රේෂත්‍රයේ අයට අපි මේක නියමකරන්න ඕන. එ අනුව අනුකූලතා සහතිකයේ අපි දුප්පත් මනුස්සයාට හෝ ඒවගේම මැදි ආදායම් මිනිස්සු එ සදහා ආයෝජනය කරනවාට වඩා මේ 1020 වෙච්ච එ සුනිත්‍ය බල ශක්තිය නිර්මාණය කරන්න මේ පරිශ්‍රය තුලත් ඒවගේම අනෙක් පැත්තෙන් වයාපාරික ස්ථාන වලටත්දිරිදිම තමයි කලයුත්තේ. එනිසා ප්‍රධාන වශයෙන් එක ඉටුවෙන්න ඕන. එනිසා අපි ආයතන පැත්තෙන් එ 2010 මහිපාල මහත්තයා තිබ්බ පියවර අද ඉදිරියෙන් ඉදිරයට ගිහිල්ලා තියෙනවා එ නිසා අද එකේ එල මොරටුව නගර සභාවටත් ගෙන්න පුලුවන් කමක් ලැබුණා. එ උදාහරණ තමයි මම කිව්වේ හරිත මන්ත්‍රිරුව කටුබැද්ද ඒවගේම අපේ තියෙන සුපර් සිටි එක අලුතින් ඉදිවෙන ඒවගේම ඉදිරියෙන් තියෙන ස්ථාන ඒවගේම අපේ සියලුම නිර්මාණ අපේ ව්‍යාපෘති සදහා අපි හැමදෙයක්ම කළමණාකරනය කරා.එ අනුව මහිපාල මහත්තයා තිබ්බ පිම්ම අපි දුප්පත් මිනිස්සුන්ට නෙමෙයි අපිට යමක් කමක් කරගන්න පුලුවන් පිරිස් සදහා එක දිරිගන්වලා අභිප්‍රේරණය කරලා මේක සිදුකරන්න ඕන කියන අදහස තමයි තියෙන්නේ.එ නිසා විශේෂයෙන් මේ කටයුත්ත කරද්දි අපේ පැත්තෙන් යම් සහයෝගයක් තියෙනවානම් සහයෝගයක් දෙන්න සුදානම් ප්‍රායෝගිකව අපේ ආයතන තුල කරලා අපි පෙන්වලා තියෙනවා එවගේම විශේෂයෙන් එ සංශෝදනය සිදුකරමින් එ අවශ්‍ය කරන ව්‍යාපාරික ස්ථාන ඒවගේම විශේෂයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වේවා නගරසභා පරිශ්‍ර වේවා. මේ තුල ක්‍රියාත්මක කලොත් එ ඉල්ලුම කළමණාකරනය කරන්න පුලුවන් අනෙක් එක තමයි ගරු නගරාධිපතිතුමණි ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි අනෙක් එක තමයි ජල විදුලි බලාගාර සංකල්පය එතමයි පහුගිය කාලේ අපි විදුලිය යුනිට් ප්‍රමාණය 1950 තමයි ලංකාවේ පලවෙනි විදුලි බලාගාරය හැදෙන්නේ ලක්ෂපාන. ඒ අනුව ඒ ලක්ෂපානෙන් විතරක් අපිට දෙන්න පුලුවන් යුනිට් 10වඩා අඩුවෙන් හැමොම පාවිච්චිකරන්න ලංකාවට හැබැයි අපි හදන ඩීසල් බලාගාර හෝ වෙනත් බලාගාර මත ක්‍රියාත්මක වෙන්නෙ ඉල්ලුම වැඩි විම නිසා මම ඔබතුමාගේ අවධානය යොමුකරන්න කැමතියි මේකට සමගාමිව විශේෂයෙන් ජල විදුලි බලාගාර කියන සංකල්පය අපිට ගෙදර විදුලි බිල යම් කෙනෙක් යුනිට් ප්‍රමාණයට වඩා අඩුකරනවානම් එක මැනලා ඔවුන්ගේ බිල අපි නොමිලේ ලබා දුන්නා අවුරුද්දක් එ අනුව අපිට පුලුවන් කමක් ලැබුණා ඉල්ලුම කළමණාකරනය කරගන්න. එ අනුව තමයි කවදාවත් අපි ඔබතුමා අපේ ආයතන වල වාහන වලට තෙල් ගහන්නෑ. අපි යන්නේ බස් එකේ. එ අනුව විදුලි බල මණ්ඩලය පාඩුවෙනවා කියන්නේ කළමණාකරනයේ දෝෂයක් මේ කළමණාකරණය කරගන්න අපි එ සංකල්පය මතක් කරා වගේ පාඩු ලබපු ආමාත්‍යාංශ කෝටි 4000 ක් පාඩුවක් අපිට ලබාදෙන කොට තිබ්බේ.ඒ 4000 පියවලා කෝටි 2400 ක ලාභයක් ලබන්න පුලුවන් වුනා. හැම විටකම චම්පික රණවක ආමාත්‍යවරයා විදුලි බල මණ්ඩලය තෙල් සංස්ථාව ලබාගන්න විට ලාභයි. ඒ  කළමණාකරණයේ මේ සංකල්පය යටතේ කරපු නිසා. එ නිසා මම හිතන්නේ ඔබතුමාටත් මේ කටයුත්ත කරන්න සංශෝදන සහිතව සහයෝගය ලබාදෙනවා. එනිසා එදා ඕස්ට්‍රේලියා වේ ඉයන් රඩ්ට ඒවගේම අනෙක් පැත්තෙන් ගත්තාම මාග්‍රට් ත්‍රැචර්ට මේ විදුලි සම්බන්ධ ක්ෂෙත්‍රත් එක්ක හැප්පෙච්ච නිසා තමයි මේ යකඩ ගැහැණිය කියන නම වැටුනේ. ඒ නිසා මේ හැංචෝ පැංචෝ අපිට මේ සංකල්ප වලට ඔච්චම්කරන එක ගැන අපි කථාකරන්නේ

නැහැ.එනිසා දැනුමෙන් සන්නද්දවෙලා කළමණාකරණයෙන් සන්නද්ධවෙලා යායුතුයි. එනිසා හුවට හුකියන්න යන්නැ අපි හා කියන්නයි තියෙන්නේ කියලා කියමු. ඔබතුමාගේ මේ සංකල්පය සංශෝදන සහිතව ඉදිරියට කරන් යන්න අපිට පුලුවන් ශක්තිය ලබාදෙන බවට සදහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි සන්තෝශ වෙනවා අපි ප්‍රසාදය පලකරනවා මහජන අවශයතාවයක් පදනම් කරගෙන මේ සභාවට අයත් නොවන පළාත් පාලන පනතෙන් අපිට සතුකර ඇති බලයට ඔබ්බෙන් විෂයක් පිළිබදව මහජනයාගේ අවශ්‍යතාවය පදනම්කරගෙන මෙවන් සාකච්චාවක් සංවාදයක් ගොඩනගන්න ඉඩකඩ නිර්මාණය වීම පිළිබදව අපි සතුටුවෙනවා.ඒවගේම අප මේ සංවාදයේදි මන්ත්‍රිවරුන්ගේ අදහස් යෝජනා ඉදිරිපත් කරපු කරුණු ඉතාමත් හොදින් සාවදානව අහගෙන හිටියා.විශේෂයෙන් අපි සජිත් මන්ත්‍රිතුමා ඉතාමත් වැදගත් ලෙස කාරණාවන් පිළිබදව ඔහු සැලකිය යුතු දැනුමක් අවබෝධයක් තියෙන මේ ක්ෂෙත්‍රයේ මන්ත්‍රිවරයෙක්. එහිදි අපි බාධාකිරීම් කරන කොට අන්න අපිට දැනෙනවා අවංකව මේ යෝජනාව ඉදිරිපත්කරන උවමනාව තිබෙන ආණ්ඩු පක්ෂය එය ක්‍රියාවට නැගීම සදහා අවශ්‍ය කරන විපක්ෂයේ එ කරුණු කාරණාවලට සවන්දෙනවාද එහෙම නැත්නම් එවා කොලොප්පමට විහිලුවට ලක්කිරීම ඇතුලේ හැල්ලුකරන්නේ විපක්ෂයේ මන්ත්‍රිවරයාද යෝජනාවද ගරු නගරාධිපතිතුමණි අපි කවුරුත් දන්නවා මේ වේලාවේ රටක් විදියට අපි විශාල අර්බුද ගණනාවක ඉන්නේ.එක අර්බුදයක් විදුලි අර්බුදය එ විදුලි අර්බුදය ඇතුලේ අපි දිනපතා අහනවා ඔබේ මන්ත්‍රිවරුන් කිව්වා විශාල මාෆියාවන් ගැන අහනවා කොයි කවුරුත් පිළිගන්නවා විදුලිය හා බැදිච්ච දිර්ඝ කාලයක් තිස්සේ එන මාෆියාවන් තියෙනවා.ඊළගට අපි දන්නවා අපේ බලාගාර අක්‍රිය වෙනවා.ආපදාවට ලක්වෙනවා කැඩෙනවා ඊළගට මේ වෙලාවේ ඉන්ධන නැති නිසා වහන්න සිද්ධවෙනවා.සපුගස්කන්ද වගේම මුලු ඉතිහාසයම නොනිමි මෙහෙවරක් කරපු තැන් පහුගිය කාලේ නිවා දැම්මට සිද්ධවෙනවා.ඒ අපට තිබෙන ඉන්ධන ප්‍රශ්ණය නිසා ඒනිසා රටක් විදියට ජාතික වශයෙන් අපි විදුලිය පැත්තෙන් විශාල අර්බුදයකට ගිහිල්ලා ඉන්න වේලාවක ඊට වගකියන ඇමතිවරු මාධ්‍ය හමු තියලා එ එ ආමාත්‍යංශවල විදුලි ඇමති එක පැත්තක තෙල් ඇමති එක පැත්තක එ මාධ්‍ය හමුව ඇතුලේ අපි දකින්නේ ඇත්තටම විකට රංගනද කියලා හිතෙන තරමට එක ඇමතිවරයෙක් තවත් ඇමතිවරයෙක්ට දොස් කියනවා. ඒ ඇමති මේයාට දොස් කියනවා. එවා හරියට සම රිසි භූමිකාවක ගොරනාඩු දැන් රටත් ජනතාවත් ඒ ඕනැවට වැඩිය එ කොලොප්පම් විගඩම් බලන වේලාව නමුත් අපි කවුරුත් දන්නවා මේ ඇමතිවරු එක කැබිනට් එකේ ඉදගෙන ඉන්න ඇමතිවරු. ඔවුන් සංවාද කරලා සාකච්ඡා කරලා එකගතාවයක් හදාගෙන එක මතයකට ඇවිල්ලා පිළිතුරු දෙනවා වෙනුවට ඔවුන් විසින් හදාගන්න මම නිවැරදි මම හරි කියන තැන ඉදලා සංවාද කරන වෙලාවක අපි කවුරුත් දන්නවා අපි මේ ගැටලු විසදාගත යුත්තේ සාමුහික මැදිහත් විමෙන් මේවා වියුක්තව අරගෙන මේවාට සාර්ථක පිළිතුරු හොයන්න බැහැ.ඒනිසා සාමුහික මැදිහත් විමක් ඕන.ඒවැනි වේලාවක පළාත් පාලන ආයතනයක මේ යෝජනාව මම ගෙනාවනම් ඔබ දාන්නේ නැහැ.එහෙම තමයි මේ ආයතන වල ස්භාවය.එක අපේ සීමාවට අයිති නැහැ කියලා. හැබැයි මේක ඔබ ගෙනාපු එක වැදගත් මොකද ඔබ ගෙනාපු එක අනිවාර්යෙන්ම සංවාදයට ලක්වෙනවා.සාකච්ඡාවට ලක්වෙනවා.අපි නොදන්න කරුණු ඉගෙන ගන්නවා.මොකද මම මේ යෝජනාව ගැන මම අධ්‍යයනය කරලා ආපු අදහස නෙමෙයි දැන් මගේ කටින් පිටවෙන්නේ.මම ආවේ මේ වචන කියන්න නෙමෙයි.හැබැයි මේ මන්ත්‍රිවරු ඉදිරිපත් කරපු කාරණා සැලකිය යුතු ලෙස මගේ තිබිච්ච අවබෝධය වෙනස් කලා.ගරු නගරාධිපතිතුමණි යෝජනාව දැක්කාම ප්‍රශ්ණයක් තියෙනවා අපේ ලිහිණි මන්ත්‍රිතුමිය කිව්වා.මේකත් ගම්‍යවෙන්නේ මේ වචන ඇතුලේ තව අර්බුදයක් එතකොට අපිට ප්‍රශ්ණයක් තියෙනවා මොකද ආණ්ඩුවේ බලධාරින් සමහර ප්‍රශ්ණවලට විසදුම් සොයන විට එ විසදුම් ක්‍රියාවට නගන විට තව ප්‍රශ්ණ ගොඩක්. එනිසා ප්‍රශ්ණයකට විසදුම් දෙන්න යනවිට එ විසදුම පෙරලා ප්‍රශ්ණයක් නොවෙන විදියට කොහොමද කටයුතු කරන්නේ කියන සංවාදෙත් අපිට ඕන.එ නිසා ගරු නගරාධිපතිතුමණි දැන් අපි

පළමුකොට දැන් මේ සූර්ය විදුලි බල උත්පාදනය අපිට ඕන මේරට අර්බුදයකට ගෙනියන්නද ඉතිහාසය පුරාම මුලු මානවයාම ප්‍රශ්ණයක් ආපුවාම විසඳුම් හෙව්වා ඉතිහාසය ප්‍රශ්ණ හදන්නේ නැහැ උත්තර නැතිව ඕනැම ප්‍රශ්ණයක් හදන්නේ උත්තරයක් එක්ක. ඒක හොයාගන්න එක තමයි අමාරුකම. දේශපාලන කෝනවලින් බලලා ප්‍රශ්ණවලට උත්තර හොයන්න බැහැ.දැන් මේ තියෙන්නේ අන්න අර දේශපාලන කෝණවලින් තම තමන්ට එකිනෙකාගේ කාල වකවානු ප්‍රශ්ණකරන එක.එක දාමු පැත්තකින් අපි කවුරුත් පිළිගමු ඉතිහාසේ ඉදලා අනුගමනය කරපු වැරදි ආර්ථික ප්‍රතිපත්තිය ඇතුලේ ගොඩනැගිච්ච වැරදි දේශපාලන සංස්කෘතිය විසින් අපිව විශාල අර්බුදයකට ස්භාවික ප්‍රශ්ණ තියෙනවා තමයි හැබැයි මේ තියෙන්නේ ස්භාවික ප්‍රශ්ණයක් නෙමෙයි මිනිසුන් ඉතාම සුලු පිරිසක් විසින් ගත්තු වැරදි තින්දු තිරණ නිසා සිදුවෙමින් තියෙන අපරාධයක්.මේ අපරාධයක් සිදුවෙමින් තියෙන්නේ.එනිසා එ අපරාධය ඇතුලේ පළාත් පාළන ආයතනයක නගරාධිපතිතුමා සහ මන්තිවරු කණ්ඩායම තමන්ගේ භූමිය තුල හරි අර එක මන්ත්‍රිවරයෙක් කිව්වා එක් පහනක් හො දැල්වීම අපිට පුලුවන්නම් අප එය කලයුතුයි.හැබැයි මේ විදුලි අර්බුදයට දැන් අපි හදන්නේ විදුලි උත්පාදනය කරන තාක්ෂණික ක්‍රමවේදයක් හදුන්වලා දෙන්නනම් ගරු නගරාධිපතිතුමණි මට තියෙන ගැටලුව අපි ජනතාවගේ ඉදිකිරීම් අනුමැතිය හා අනුකුලතා සහතිකය මේ ඇතුලට ඔබ්බනකොට ආන්න අරවගේ ගැටලුවක් එනවා. ඔබේ චේතනාව යහපත්වෙන්න පුලුවන් හැබැයි අරක පෙනකොට හිතෙනවා දැන් අනුකුලතා සහතිකයක් ගන්න එකත් ලෙසි නැහැනේ. අපිඅහනවානේ සැහෙන ගෙවීම් කරනවා කියලා අත්දැකීම් අපිට තියෙනවානේ එවැනි තත්වයක් ඇතුලේ අනුකුලතා සහතිකයේ මේ සූර්ය කෝෂවලටත් හිරවුනොත් ආයි ප්‍රශ්නයට උත්තර දෙන්න ගිහිල්ලා මිනිස්සු හිරවෙන්න පුලුවන් කියන සැකය එනවානේ.එක සාධාරණ සැකයක්නේ.එනිසා අපි ඔබ ප්‍රාර්ථනා කරන්නේ මේ විදුලි අර්බුදයේදි මොරටු ජනයාට තාක්ෂණික මෙවලම් හරහා ඔවුන්ට විදුලිය උත්පාදනය කරන එක රටටත් යම් දායකත්වයක් සපයන්න පුලුවන් තැනකට ගෙනිය ගන්නනම් එයට කාටවත් විරුද්ධවෙන්න බැහැ.ජනතාව උනන්දුකරන්න ඕනෙත් නැහැ.කරුවලේ ඉන්න මිනිස්සු මේ රටේ පාලකයෝ හෙට දවසේ දෙනවානම් සැබෑ විසඳුමක් උනන්දුකරන්න දෙයක් නැහැ පොලබවන්න දෙයක් නැහැ කරුවලේ ඉන්න කවුරුත් කැමති නැහැ.තමන් සුදානම් එකට අනුගතවෙන්න.

ගරු නගරාධිපතිතුමණි, ඕනැම වැඩ පිළිවෙලකට අවතිරන වෙනකොට අපිට කෙටිකාලින මැදිකාලින දිර්ඝ කාලින ඉතාමත් නිරවුල් පැහැදිලි සැලැස්මක් අවශ්‍යයි.නිවැරදි සැලසුම් නොමැතිකමේ විපාකය අද අපි විදින්නේ.ඉතාම බරපතල විදියට විදින්නේ නිවැරදි සැලසුම් නොමැතිකම් එ නිසා පලමුව ඔබ ඔබේ අවංක උවමනාවත් ඉතා අවංකනම් ඔබේ හදවත පතුලෙන්ම නම් මේ පැනනගින්නේ මුලින්ම අපි විශාල විදුලියක් මේ වෙනකොටත් නාස්තිකරනවා මේ විදුලි ලයිට් සිස්ටම් එක ඇතුලේ පොදු ලයිට් අපි පලමුවෙන්ම යමු සෝලාපවර් එ ලයිට් සිස්ටම් එකකට දැන් පළාත් පාලන ආයතන බොහෝමයක් එතනට යමින් තිබෙනවා.පලවෙනියෙන්ම අපි එතනට යමු.දෙවනුව අපි හදුනගන්නවා අපේ භූමියේ තිබෙන ඉතාම ඉක්මණින් මේ කටයුත්තට කරගන්න පුලුවන් සැලකිය යුතු ව්‍යාපාරික ප්‍රජාවක් ඔවුන් ඉන්න ස්ථානයෙ දෙවනුව අපි එතනට යන් ඊලගට අපිට පුලුවන් ඔබ මේ ණයක් ගැන කිව්වාට මේ ණය කොහෙන්ද? ගන්නේ කාගෙන්ද? මේක හම්බවෙන්නේ මොකක්වත් දන්නේ නැහැ. මට හිතුණා දැන් හොයලා තියෙන සල්ලි ටිකෙන් ණය දෙන්න හදනවාද කියලා ඒ නිසා දැන් ගරු නගරාධිපතිතුමණි රජයටනේ යෝජනාකරන්න වෙන්නේ ණය ක්‍රමයක් හදන්න කියලා බැංකුවලට මම හිතන්නේ එහෙම එකක් දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ.එතකොට අපි පළාත් පාලන ආයතනයක් විදියට යෝජනා කරමු විදුලි බල අමාත්‍යාංශයට නැත්නම් මධයම ආණ්ඩුවේ අදාල මුදල් ඇමතිතුමාට අපට හදලාදෙන්න ඇත්තටම මුලික වියදම ලක්ෂ 3 කට වැඩියෙන් යනවා.මම දන්න විදියට.එ නිසා ලක්ෂ 3ක් මේවෙලාවේ එකවර පාවිච්චිකරලා මේ වැඩේ කරගන්න බැරි ජනතාව වැඩි ප්‍රමාණයක් ඉන්නේ එනිසා අන්න ඔවුන්ටයි මේ ණය සහන ක්‍රමයක් ඇතුලේ දෙන්න ඕන එහෙම කරමු.අපි මේ කියන දේට කැමති ජනයා ඉන්නත් පුලුවන් අකමැති

ජනයා ඉන්නත් පුලුවන්.හැබැයි කැමති අකමැති අදාල නැහැ. ඔවුන්ගේ ඉදිකිරීම් අනුමැතිය සහ අනුකූලතා සහතිකය ඔවුන් සූර්ය බල ක්‍රමයට එකට එකග වෙන්නත් පුලුවන් එකගනොවෙන්නත් පුලුවන් හැබැයි අපි බැදිලා ඉන්නවා ඔහුගේ ඉදිකිරීමේ එ සැලැස්මට අනුමැතිය දෙන්න සහ ඔහු එ සැලැස්මට අනුව ඉදිකරාට පස්සේ පදිංචිවීමේ අනුකූලතා සහතිකය දෙන්න. ඒ කිසිවිටකත් ප්‍රශ්ණවිය යුතු නැහැ. මේ සූර්යබල විදුලි ක්‍රියාවලියට අදාල ප්‍රශ්ණකරගන්න අපිට අයිතියක් නැහැ.එනිසා ප්‍රධාන කොටම ගරු නගරාධිපතිතුමණි ජනයා නිවැරදි දැනුවත් කිරිමකට ජනයා නිවැරදි අවබෝධයකට යන්න වැඩ පිළිවෙලක් පලවෙනියෙන්ම ආරම්භකලයුතුයි.පලවෙනියෙන්ම ජනතාව හොදින් දැනුවත් කිරිම මොකද ජනතාව විශාල ලෙස මේ කරුණු කාරණා පිළිබදව දන්නේ නැහැ.ඊළගට අපි ආදර්ශයක් සැපයිය යුතුයි. අපේ ගොඩනැගිලි අපි ලොකු කාලයක් කථාකරනවා මට මතකයි මම සූර්යකෝෂ කථාකරන වේලාවේ කිව්වා ගොඩනැගිලි ඔක්කොටම සූර්ය කෝෂ දෙනවා කියලා.මම ඇහුවත් එක්ක ඒනිසා එකක් අපෙ ගොඩනැගිලි දැනටත් අපේ බොහෝ ගෙඩනැගිලිවල විදුලි නාස්තියක් සිද්ධවෙනවා.ඒ නිසා අපේ ආයතනයේ සේවය කරන හැම කෙනාටම ස්වෙච්ඡාවෙන් මේ විදුලිය නාස්තිවිම වළක්වන්න එ ආකල්පමය අරගලයකුත් මේ සභාවට තියෙන්න ඕන.එනවා ෆෑන් එකදානවා ලයිට් එක දානවා යනවා.යනකොට ඕනවෙලාවක ලයිට් දාලා ෆෑන් දාලා.පිරිස නැහැ.අර දිනපොලට ගියාම අපිට පෙනවා දිගටම දාලා තියෙනවා ලයිට් ටික.ඉතින් එනිසා එවැනි නාස්තිකාර තත්වයක් තියෙනවා අපි ඉස්සේල්ලා එය වළක්වගන්න මැදැහත්වෙමු.අපේ උවමනාව අවංකනම් මුලසිට අපි සැහෙන අරගලයක් කලයුතුව තිබෙනවා.ඔබේ අදහස හොදයි ඒ අදහස වඩාත් හොද විදියට ක්‍රියාත්මක කිරිම සදහා ඔබ මැදිහත් වෙනවා නම් අපි ඊට උදව් කරනවා.විදුලි අර්බුදයට විසදුමක් ඕන.ජාතික මට්ටමෙන් විසදුමක් ඕන ජාතික මට්ටමෙන් එන විසදුම බලා නොසිට අපේ හැකියාව පාවිච්චිකරලා අපි ජනයා උනන්දු කරලා මොරටුවේ ජනතාවට හරි මේ විසදුම දෙන්න අපිට පුලුවන්නම් එ හොද වැඩක්.ජනතාවිමුක්ති පෙරමුණේ අපි එකට එකගයි.ඒ නිසා මේ යෝජනාව බැලූ බැල්මට කියවා ගැනිමේදි ඇතිවෙන්නේ විවිධ අදහස් ඒ නිසා මේක සංශෝදනය කරන්න පුලුවන්නම් මේක ඒ කියන්නේ අපේ විදුලි උත්පාදනය වැඩිකර ගැනිම සදහා ජනතාව උනන්දුකරන එක නම් මේකේ අරමුණ ණයකුත් දිලා ජනතාවට සහනයක් ලෙස ණයකුත් දිලා ඔවුන්ට ඒ සූර්ය බල තාක්ෂණික මෙවලම් සවිකරගැනිම සදහා අපි උත්සාහ කරන්නේ විදුලිය ප්‍රවර්ධනය කරන්න වැඩිකරන්න නම් අර අනුකූලතා සහතික නිවාස ඉදිකිරීම්වල සහතික පිළිබදව පොඩ්ඩක් පැත්තකින් තියලා නිවස අනුමත කරත් නැතත් අනුකූලතා සහතික ලැබුණත් නැතත් ඊට විශාල නිවාස ප්‍රමාණයක් මුකුත් සහතික නැතිව ඉන්නවා.අපෙන් ඉදිකිරීම් සහතික ප්ලෑන් දාලා අනුමත කරපුවා නෙමෙයි විශාල ප්‍රමාණයක් මොරටුවේ හැබැයි එ හැමෝම කැමතියි තමන්ට ඉතා හොදින් විදුලිය පවත්වගැනිම සදහා ක්‍රමවේදයක් හැදෙනවා.ඒ නිසා අපි මහජන නියෝජිතයෝ ලෙස අපිට ඕන හැමදෙනාම.මේ ප්‍රශ්නයට මුහුණ දෙන හැමදෙනාටම කොහොමද අපි මේ විසදුම අරගෙන යන්නේ.එක පියවරින් පියවරට ගෙනිය ගැනිම සදහා වූ සැලසුමක් හදලා එ සැලසුමට අනුව අරගෙන යන්න උත්සාහ කරමු කියන ප්‍රකාශය කරමින් මේ සභාව දිර්ඝ කාලයකට පස්සේ මෙවැනි වැදගත් සාකච්ඡාවකට අවස්ථාව ඉඩ විවරවිම පිළිබදව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.එනිසා මේ යෝජනාවට අප එකගවන්නේ අඩුම තරමේ අන්න අරවැනි තියෙන අපේ හිතේ තියෙනවා මෙහෙම එකක් ඉතිහාසයේ මෙහෙම ඔබ එක විටක රේස් බයි වලට අදාලව ගෙනාපු එක අත්ඉස්සුවා. හැබැයි රේස් බයි දුවනවා අද බද්ද නැහැ.එවා අපි අත්උස්සලා තියෙන්නේ බද්ද අයින් කරන්න බද්ද නැහැ අද රේස් බයිවලට රේස් බයි යනවා.අපිත් වැරදිකාරයෝ.හැබැයි අපි කියපු කරපු දෙවලට අනුව සිද්ධවුනේ නැහැ.එනිසා මේ යෝජනාවෙත් ඔන්න ඔය සැකය තියෙනවා නිසා අවිශ්වාසය

තියෙන නිසා ඔබේ චේතනාව හොඳවෙන්න පුලුවන් නමුත් මේ යෝජනා ක්‍රියාත්මක කරන කොට ඒ යෝජනාවේ අන්තර්ගතවෙලා තියෙන වචන ඇතුල තියෙන දේ අපිට එකගවිය නොහැකිනම් කරුණාකරලා සංශෝධනයක් ගෙන්න අත්දෙකම උත්සනවා හිරකරන්නේ නැත්නම් අනුකූලතා සහතික වලට සැලසුම් අනුමැතියට හිර නොකොට ජනයාට විදුලි කෝෂ ලබා දීමට කුමණ හෝ ණය සිස්ටම් එකක් හදලා මේ ව්‍යාපෘතිය සාර්ථක කරගන්න අවංකව ඔබලා මැදිහත් වෙනවානම් අපි අපේ අත් දෙකම උත්සලා පක්ෂවෙනවා

__නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා__

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, විශේෂයෙන්ම පුදුමාකාර තත්වයක් නිර්මාණය වෙලා තියෙන්නේ. යෝජනාවත් සමගම අද මේ ඇතිවුනාවූ තත්වය සමගම කණගාටුව ප්‍රකාශ කරනවා.විශේෂයෙන්ම මේ යෝජනාවේ හරය පිළිබඳව වටිනාකම පිළිබඳව කථාකිරිම තුල මතුවුනාවූ කරුණු කිහිපයක් තියෙනවා.විශේෂයෙන්ම මේ යෝජනාවේ මා අදහස් කරලා තියෙනදේ පැහැදිලිවම ලියවිලා තියෙනවා.මේ කියලා තියෙන්නේ පැහැදිලිවම ගොඩනැගිලි සැලසුම් සඳහා අනුකූලතා සහතිකය ලබාදිමට පෙර එම ගොඩනැගිලි සඳහා සූර්යය විදුලි බල පද්ධතිය සවිකිරිමට එම අයදුම්කරුවන් උනන්දුකරවිම සඳහා ඔවුන්වෙත සහනදායි පොලි අනුපාතයක් මත ණය යෝජනා ක්‍රමයක් යටතේ විදුලි උත්පාදනය ඉහල නැංවිමට කටයුතු කිරිම සුදුසු බව කියලා තමයි තියෙන්නේ.දැන් ඇත්තටම සමහර අය කියනවා සමහර මන්ත්‍රීවරුන්ගෙන් මට ඇහුණා. ලිහිණි මන්ත්‍රීතුමියත් විශේෂයෙන් මේක කිව්වා. මේ තත්වය තුල ණය පදනම යටතේ තමන්ගේ නිවස තමන්ගේ ව්‍යාපාරික ස්ථානය ආරම්භකරන කෙනෙකුට මෙමඟින් ඇති වෙන්නාවූ වාසිය සාමාන්‍ය කෙනෙකුට වඩා වැඩියි.හේතුව තමයි අපි මෙයින් යොජනා කරන්න යන්නේ රජයට අපි මේ බලපෑම කරන්න යන්නේ එසේ කරන අය ඉන්නවා නම් සමහරවිට ඔහුගේ නිවසට දෙන ණය වාරිකයට එකතු වෙන්නාවූ පොලිය නැත්නම් ණයට එකතු වෙන්නාවූ පොලියට වඩා සහනදායි පොලියක් මත මේ සඳහා ණය වාරිකයක් නිකුත් කරනවා නම් ඔවුන්ට පුලුවන් වෙනවා අනිවාර්යෙන්ම තමන්ගේ ගොඩනැගිලි අනුකූල සහතිකය ලබාදිමේදිම එම කටයුතු කරන්න.

ගරු මන්ත්‍රීවරුනි, රවි මන්ත්‍රීතුමා කථාකරපු එක සර්ව සාධාරණයි මේ වෙලාවේ. හේතුව අනුකූල සහතිකයක් ලබාගැනිමට හදන ඔබතුමන්ලාට එ අවබෝධය නැතිවුනාට මේ මොරටුවේ දැනට සියයක් කියලා අපි ගණනය කලෝත් ගොඩනැගිලි අයදුම්පත් අනුමත කරන 20 කටවත් අනුකූලතා සහතිකය ගන්නේ නැහැ.ගන්න පුලුවන් විදියට ඔවුන් නිර්මාණය කරන්නේ නැහැ.හැබැයි අපිට පුලුවන්කම තියෙනවා ණය වාරිකය ලබාගන්නා අය අද උපක්‍රමශිලිව උපායමාර්ගතුල සියයට විස්ස ලබාගැනිම සඳහා තමන්ට අදාල වෙන්නේ ලක්ෂ 100 නම් 120කට ඇස්තමේනතු හදලා ණය වාරිකය 100 යට අවසාන විස්ස ලබාදිමට වෙන්නාවූ එ අනුකූලතා සහතිකය ලබාගැනිමේන් තොරව තමන්ට අදාලවෙන්නාවූ ලක්ෂ 100ම ලබාගැනිමේ උපක්‍රමශිලි උපායමාර්ග ක්‍රියාත්මක වෙනවා.එක දවසකට සතියකට ප්ලෑන් 50ක් 100ක් විතර බලන මම ප්‍රායෝගිකව අවුරුදු 16ක් ඉන්න නගරාධිපතිවරයෙක් හැටියට ඔබට වඩා එක මම දන්නවා.මට ඒ පිළිබඳව අවබෝධයක් තියෙනවා.එනිසාම විශේෂයෙන්ම මේ යෝජනාවේ අරමුණ බවට පත්වෙලා තියෙන්නේ වෙන මුකුත්ම නෙමෙයි අනුකූල සහතිකයක් ලබාගැනිමට ණය වාරික පදනම් කරගෙනම යම් කෙනෙක් ගෙයක් හදන්න හෝ ව්‍යාපාරික ස්ථානයක් ආරම්භ කිරිමට යන අතරතුරේදි ඔවුන්ට පුලුවන් වෙනවා අනිවාර්යෙන්ම තමන්ගේ ණයවාරිකය ගන්න පොලියට

වඩා අඩු පොලියකින් මම ගණන් බැලුවාම සියයට දශම 4 කට වඩා අඩු මුදලක් තමයි තමන්ගේ ණය වාරිකයට එකතුකරගන්න වෙන්නේ.මේ සූර්යය කෝෂවලින් පද්ධතියට එකතුකරගන්න යුනිට් ප්‍රමාණයක් හදාගන්න පුලුවන් වෙන්නේ.බර ගැන ප්‍රශ්ණයක් කිව්වා අපේ ප්‍රදිප් ශියන්ත මන්ත්‍රිතුමා එ බර වලට බරෙන්ම උත්තරයක් දුන්නා.නමුත් මේතුමිය නොදන්නවා ඇති සමහරවිට මගේ ගරු මන්ත්‍රිතුමත් මේක නොදන්නවා ඇති එදා පැනල් එකක තිබුණු බරයි අද පැනල් එකක තියෙන බරයි හාත්පසින්ම වෙනස්.මම මුලින්ම එකතු කරනකොට පැනල් එකක තිබුණු කිලෝ ප්‍රමාණය නෙමෙයි අද තියෙන්නේ එකෙන් හරියටම අඩයි.සමහර එවා අඩකටත් අඩුයි.අද තත්වය එදා තිබුණු ප්‍රමාණයෙන් අඩකටත් අඩු කරලා බර ප්‍රමාණය විතරක් නෙමෙයි එහි නිෂ්පාදනය වන ප්‍රමාණය වැඩිකරලා අද පැනල් හදලා තියෙන්නේ තාක්ෂණයට එතුමිය නොදන්නකමට කියනවා ඇති නමුත් අද එන්න එන්නම දියුණුවෙලා. සමහර විට මෙය එදා අඩි දෙකාමාරයි අඩි පහේ කැල්ල අඩියේ අඩියේ ප්‍රමාණයටත් තාක්ෂණය දැනුමත් එක්ක ඉස්සරහට එයි.ගරු මන්ත්‍රිවරුනි නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා හරි සුභවාදි තැනකට ආවා

මම හිතන්නේ විශේෂයෙන්ම අනෙක් පළාත් පාලන ආයතන එකතුවෙන්න ඉස්සේල්ලා එකතුවෙච්ච ආයතනයක්.ගරු රවිනාත් ජේ ගුණසේකර මැතිතුමාගේ කාලේ ඉදලා අපිට තියෙනවා අපේ මාර්ගවල දාන බල්බ්වල අපි මුලින්ම දැම්මේ මකරි එකට 125 ක් සම්පූර්ණ වැය වෙනවා. ඊට පස්සේ ඒක අපි ගෙනාවා සි එෆ් එල් බල්බ් වලට දැන් එක 20 බවට පරිවර්තනය වෙලා තියෙනවා.එ එළියම 20 ගිහිල්ලා.දැන් අපි ඊටත් එහාට යන්න හදනවා.අපි මේකට ආඩම්බර විදියට එකතුවෙච්ච සභාවක්. එ නිසා මම හිතනවා මට මතකයි පාඨලි චම්පික ඇමතිතුමාගේ එතුමා විදුලි බල ඇමතිවෙලා හිටියා කාලයක්.අපේ නිශාන්ත ප්‍රදිනාන්දු ඇමතිතුමා කිව්වා හරි එතුමා අපිව ගෙන්නලා කිව්වා මීටරය අනුව ඔබට ගෙවන්න වෙනවා ලක්ෂ 5ක් එනිසා කරුණාකරලා ලක්ෂ 5 ගෙවන්න.ඒ වෙනකොට ඇවිල්ලා තිබුණා අපිට බිල් එවලා තිබුණා 4ක්.ලක්ෂ 20ක හැබැයි රැස්විමට ගියවෙලාවේ එකපාරටම අර නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුමා කිව්වා වගේ මේ ලොකු ලයිට් ප්‍රමාණයක්.මේ ලොකු ෆැන් ප්‍රමාණයක් මේ තියෙනවා.එතකොට මම එතුමාට කිව්වා දැන් මම ආවේ විදුලි සෝපානයේ.ඔබතුමා ආපුගමන් ලයිට් දැම්මා 35ක් විතර ඔබතුමා AC දැම්මා.දාලා ඔබතුමා කියනවා මේක අපිට ප්‍රශ්ණයක් වෙලා තියෙනවා එකනිසා මේක අපි වැය වෙන ප්‍රමාණයන් අඩු කරන්න ඕන මම කිව්වා ඇයි ඔබතුමා මේක කියන්නේ ඔබතුමා ආණ්ඩුවට යෝජනා කරන්න.නාගරික සංවර්ධන අධිකාරියට යෝජනා කරන්න.රජයේ ආයතනවල ගොඩනැගිලි හදද්දි සූර්ය එළිය එන විදියට දවල්ට ලයිට් නොදා වාතාශය එනවිදියට එ සි නොදා ඔබතුමා යොජනාවක් ගෙන්න.කරුණාකරලා මට ඔය ලක්ෂ 5 ගෙවන්න බැහැ.මම මේ දිලා තියෙන්නේ අපේ මොරටුව මහා නගර සභාවට දිලා තියෙන දශම දෙකාමාරක වෙන්නාවූ විදුලි පද්ධතියේ අපට දිලා තියෙන පමාණයෙන් තමයි මේක කරලා තියෙන්නේ දැන් එක ඊටත් වඩා ගුණයකින් අපි ලයිට් ප්‍රමාණය වැඩිකරන්න පුලුවන් සි එෆ් එල් බල්බ් වලට අපි ඇවිල්ලා තියෙන්නේ.එතුමා එක පිලිඅරගෙන සම්පූර්ණයෙන්ම මේක ඉවත්කරා.මම බැලුවා කල්පනා කරලා එතුමා ඊට පස්සේ නාගරික සංවර්ධන අමාත්‍යාංශයට ගියාට පස්සේ මම කියපු දේ ඔලුවේ හරි තියලා එක කරයි කියලා.නමුත් එතුමාට අමතක විමක් වෙන්න ඇති එතුමා අර අපේ සජිත් දුමින්ද පිරිස් මන්ත්‍රිතුමා කිව්වා වගේ 2010ආරම්භ කරන කොට එතුමා සි එෆ් එල් බල්බ් මුලින්ම ගෙවල් ගානේ ගිහිල්ලා දුන්නා.එවා අමතක නැහැ අපිට.හැබැයි එක කරන්න පුලුවන් කම තිබුණා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේදි.හැබැයි යහපාලන ආණ්ඩුවට එනකොට

එතුමාගේ වැඩේ ක්‍රියාත්මක කරන්න දුන්නේ නැහැ.එතුමාට එතනින් එහාට බලාපොරෝත්තුවෙන ආකල්ප වලට යන්න හම්බවුනේ නැහැ.එකනිසා එක වෙනම කථාවක්.හැබැයි අපේ ලිහිණි මන්ත්‍රීතුමිය දිගින් දිගටම කියන්න ගත්තා පද්ධතියට මුකුත් එකතු කරලා නැහැ එකතු කරපු ඔක්කොම එකතු කරලා තියෙන්නේ මහින්ද මහත්තයාගේ ආණ්ඩු කාලේ.නොරෝච්චෝලේට ලොකු දැවැන්ත බලවේග ආවා නොරේච්චෝලේ හැදුවා.තව විදුලි පද්ධතියට සුළන් වලින් විදුලිය මේ ඔක්කොම කරේ මහින්ද මහත්තයාගේ කාලේ මිසක් යහපාලන කාලේ මම හිතන්නේ එක යුනිට් එකකවත් නිෂ්පාදනයක් ඒළියට ගත්තේ නැහැ.

ගරු නිශාන්ත ප්‍රදිනාන්දු මන්තිතුමා ඔබතුමා මට කිව්වා තමා ඔබතුමා මතක් කලා විශේෂයෙන්ම රේස් බයි රේස් මම ඒ සඳහා අදවෙනකම් ගන්නේ නැහැ. හේතුව අපේ කොවිඩ් එකත් එක්ක වරින් වර රේස් බයි වැහිම සිදු කලා.හෙට අනිද්දා වෙනකොට ආයිවහයිද දන්නේනැහැ.ඒ නිසා පූර්ණ වශයෙන් එකට මැදිහත්විමක් වෙන්නට වුවමනා තිබුනේ නැති කාලපරාසයක් අපි ගතකරා.අද මේ වෙනකොට යම්කිසි විදියකට පූර්ණ වශයෙන් මැදිහත්විම කරනකොට මට මේ වෙනකොට එක් ආයතනයක් හැර රේස් බයි ආයතන සියලුම දෙනා සතියකට දෙවතාවක් මට කථා කරනවා.කථා කරලා කියනවා ඔබතුමාගේ යේජනාව අයින්කර ගන්න කියලා.මම කිව්වා අයින් කර ගන්නේ නැහැ.මට ඔබතුමාලාගේ රු 5000 ක බද්දට වඩා මට කරන්න ලොකු සේවාවක් තියෙන නිසා මම අයින් කර ගන්නේ නැහැ.මට ඊට වඩා උඩන් කට්ටියත් කථාකරලා කිව්වා මේ යෝජනාව අයින් කර ගන්න කියලා.මම කිව්වා යෝජනාව අයින්කර ගන්නේ නැහැ.හේතුවක් තියෙනවා බලප්‍රදේශයක කරන්න පුලුවන්වෙන ව්‍යාපාර පිළිබඳවත් ව්‍යාපාර නැවැත්විම හා ව්‍යාපාර ගොඩනැගිම පිළිබඳවත් පළාත් පාලන ආයතනවලට තියෙන බලය කප්පාදු කිරිම සඳහා මට ඉහලින් ඉන්න ඕන කෙනෙකුට වඩා මට පහලින් ඉන්න මගේ වරිපණම් බදු ගෙවන ජනතාව ආරක්ෂා කර ගැනිම වගකිම තියෙන නිසා මම එකට ඉඩදිලා නැහැ.ඒක ඕන වෙලාවක ක්‍රියාත්මක වෙන්න පුලුවන් අවශ්‍ය විටදි ක්‍රියාත්මක කිරිම සඳහා එකට සියලු දේ කරමින් ඉන්නවා.අනුකුල සහතිකය අනිවාර්යයි ද කියලා පොඩි ප්‍රශ්ණයක් තියෙනවා මේකේ අනිවාරයය කමක් නැහැ.අපි ඔබ නොදන්නවා වුනාට අපි ලිපියක් නිකුත් කරා අයදුම්පතක් ගනිද්දි මේක ලංකාවේ කෙහේවත් නැහැ.කොම්පොස්ට් නැත්නම් තමන්ගේ දිරන ද්‍රව්‍ය දාන්න සැලසුමේ වේස්ට්වොටර් වලටයි සර්වරේජ් වලටයි වල් දෙකක් තියෙනවා වගේම මේකටත් ස්ථානයක් ස්ථාපනය කරන්න කියලා. එක ප්‍රායෝගිකව සිදුවෙනවා.අපි අනුකුල සහතිකයේදි බලනවා මෙය තියෙනවාද කියලා. එක අපි කලේ කසලවලට උත්තරයක් සපයන ආයතනයක් විදියට තවදුරට ජනතාවගෙන් සේවය ගන්න.ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම ගන්න. හැබැයි මොරටුවේ ජනතාව කවුරුවත් එකට විරුද්ධවුනේ නැහැ.දැන් අපිට පුලුවන්කම නැද්ද මොරටුවේ ජනතාවට කියනවානම් මේක සත්භාවයෙන් කරගන්න පුලුවන් අය එන තරම් ඇති හැබැයි එවගේම තමන්ට වුවමනාව තියෙනවා හැබැයි කරගන්න විදියක් නැහැ.අන්න ඒ අයට උදව්කිරිම තමයි මේකෙන් කරන්නේ.දැන් මේ යොජනාවෙන් පස්සේ මොරටුව මහ නගර සභාවට ගොඩනැගිලි අයදුම්පතක් ගන්න එන කෙනෙකුට අපි දෙනවා මුද්‍රණය කරලා ඔබ මේ විදියට සූර්ය කොෂවලින් විදුලිය ලබාගැනිමට අවශයනම් ඔබ එයත් අපිට සඳහන් කරලා එවන්න ගොඩනැගිලි සැලසුමේ. සඳහන් කරලා අපිමේ දෙන්නයන පහසුකම ඔහුට නොලැබෙනවානම් ඒ පහසුකම ඔහු ප්‍රතික්ෂේප කරනවා ඔහුගේ අනුකුලතා සහතිකය ලැබෙනවා.හැබැයි ඔහු කියනවානම් මම මේ පහසුකමට කැමතියි මට ණය වාරිකයක් දෙනවානම් කැමතියි කියලා අපි ඔහුගේ අනුකුල සහතිකයේදි සූර්ය

කෝෂ සවිකරලාද කියලා බලනවා. මෙකේ තියෙන වරද මොකක්ද?යම් කෙනෙකුට කැමැත්තක් තියෙනවානම් අනුකූල සහතිකය ලබා ගනිද්දි සූර්ය කෝෂ සවිකරන්න එ සඳහා ඔහුට අවශ්‍ය වෙන ණයවාරිකය හෝ නැත්නම් ඔහුට එ සඳහා අවශ්‍ය වෙන මුදල ඔහුම වියදම් කරලා දෙනවානම් එක සැලකිල්ලට ගන්න පුලුවන් එකට අයදුම් පත්‍රයේ එවිදියට සඳහන් කරන්න කවුරුහරි කියනවානම් අපිට ඕන නැහැ කියලා අපිට මේක බලෙන් දෙන්න ඕන නැහැ.මේක දිරිගැන්වීමක් විදියට උපායශිලිවිදියට මේක අනුයුක්ත කරගන්න පුලුවන්වෙනවානම් එ අනුයුක්ත කිරිම කරගන්න පුලුවන් වෙනවා අපිට මේකෙන්.මෙහෙම දෙයක්වත් නොකර හිටියොත් අනුකූල සහතිකයක් ලබාගැනිමට පෙර හැකියාව ඇති අය හෝ හැකියාව නැතත් වාරික වලින් ණය මුදල ලබා ගෙන කරන්න අය ඉන්නවානම් මෙහෙම දෙයක් යොජනා නොකිරිම තුල ඔවුන් දිරිමත්වෙන්නේ නැහැ.ඔවුන් එ සඳහා එකතුවෙන්නේ නැහැ.එනිසා මේ සඳහා එකතුවිම කරගන්න පුලුවන් වෙනවා යෝජනාවෙන් පස්සෙ.මේ තමයි මගේ අදහස මගේ යෝජනාව මේ සඳහායි.එ ඇරෙන්න මෙතන ඇවිල්ලා කවුරුහරි කියනවානම් අපිට මෙහෙම දෙයක් අවශ්‍ය නැහැ කියලා.එත් එ පරිදිම අනුකූල සහකිකය ලැබෙයි.හැබැයි ඔහුට විශ්වාසයක් තියෙනවානම් මොරටුව මහ නගර සභාව මැදිහත්වෙලා බැංකුවට දැනට ජාතික ඉතිරි කිරිමේ බැංකුව, මහජන බැංකුව ණය වාරික ලබා දෙනවා.මමත් ණයවාරික පදනම්ව ගත්ත කෙනෙක් තමයි සූර්යකෝෂ.දැන් දෙනවා.එක මිට වඩා අඩු පොලියකට ලබාදිමේ කටයුත්ත කරනවා එකට එකගයිනම් එ එකගතාවය දිලා තියෙනවානම් අන්න එතකොට අපි බලනවා අනුකූල සහතිකය ලබාගැනිමේදි ඔහුගේ එකගතාවය මත ඔහු සවිකරලා තියෙනවාද කියලා මොකක්ද මේකේ තියෙන වරද මේක තමයි දිරිගැන්විමක් විදියට කරන්නට ගිය දේ.එ නිසා මම හිතනවා එහිදි යම් යම් විදියට එක එක කාරණා මුල්කරගෙන වචන කියපු දේවල්වල මම හිතනවා මේ කථාවත් එක්ක යම් කිසි තුලනය විමක් සිදුවෙයි කියලා.

ගරු මන්ත්‍රිවරුනි, අපේ සජිත් දුමින්ද පිරිස් මන්ත්‍රිතුමා තියෙන අත්දැකිම් එක්ක එතුමා කථාකරා විදුලි බලාගාර සම්බන්ධයෙන් පාඨලී ඇමතිතුමාට තිබ්බ තත්වයත් එක්ක එතුමාට සමහර තැන්වලදි එතුමා ලොක් වුනා සමහර දේවල් කරන්න ගිහිල්ලා.කසල නැතිව කසල වැඩේ කරගන්න බැරිව රෝසි සේනානායක මහත්මියට නිවැරදි විදියට කසල දෙන්න බැරුව එතුමියත් එක්ක ගිවිසුමක් ගහලා අප මේ තුන්පාරක්ම අපි යනකොට එහෙට එහේ පද්ධතිය කැඩිලා.අපි එවා රිටන් කරලා මෙහෙට එවුවා. එ නිසා එවා කලයුතු දේ කලයුතු තැනත් ඒකක කරන්නේ නැතුව හුටපට වෙච්චඑවා අපි අත්දැකිම්වලින් දන්නවානේ. කෙරවල පිටියේ යනකොට කෙරවල පිටියේ තියෙන තත්වය මොකක්ද කියලා අපි දන්නවානේ. දැන් මේ වෙනකොට විදුලිය නිෂ්පාදනය කරනවාද ඔහුට සල්ලිගෙවන්න වෙයිද දන්නේත් නැහැ.නියමිත පරිදි දෙන්නාවූ කසල නොදිම තුල.එහෙම තත්වයක් දැන් නිර්මාණය වෙලා ඉවරයි.ඔහු බලාපොරෝත්තුවුනා ටොන් 500යි 800යි අතර එ 500 යි 800 යි යන්නේ නැහැ විදුලිය උත්පාදනය කරන්න පුලුවන්වෙන තෙතමනය අඩු කසල යන්නේ නැහැ.තෙතමනය අඩු කසල යන එකම ආයතනය බවට පත්වෙලා තියෙන්නේ මොරටුව මහ නගර සභාව.එ මහා නගර සභාවත් ගෙනියන කොට එතනින් එක මේ පද්ධතිය දැන් ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා මෙහෙට එවනවා.අපි හැමදාම ටොන් 4 ක්5ක් යවනවා ඔබතුමා දන්නවා ඇති හැමදාම අපි යවනවා.මට මතකයි ඉදවන්න තිබ්බ ආතගෙඩියක් එතකොට කොහු මෙට්ට තිබුනේ මගේ ඇදේ.මම කුප්පි ලාම්පුව අරගෙන ගිහිල්ලා, ආතගෙඩිය ගන්න ගිහිල්ලා මෙට්ටෙ ගිනිගත්තා. අපි කුප්පි ලාම්පුවෙනුත් පාඩම්කරා අපි විදුලිය ගන්න කොට නගර

සභාවෙන් විදුලිය ගත්තගෙයක් මගේ ගේ එ 1978 අපි විදුලිය ගත්තේ මොරටුව මහා නගර සභාවට රුපියල් 25 ක් ගෙවලා.එ අතිතය අපිට මතකයි.එ පද්ධතියත් එක්ක පෞද්ගලික අංශයට මේවා පැවරුවාට පස්සේ වේච්චාවු බාධක මිනිස්සුන්ට වේච්චාවු හානිය මිනිස්සුනට වෙච්චාවු අපහසුකම මේවා ඔක්කොම එකින් එක අපිට අත්දැකිම් තියෙනවා.මේතන ඉන්න ගෙවල් ප්‍රමාණයක කවුරු ජීවත්වුනත් එ ප්‍රමාණයෙන් කියෙන් කීදෙනාගෙද මොරටුව මහා නගර සභාවට රුපියල් 25 ක් දිලා විදුලිය අරගෙන තියෙන්නේ කියන එක මම හිතන්නේ මටත් ප්‍රශ්ණයක්.එහෙම අරගෙන තියෙන අය ඉන්නවානම් ගෙවල් එකක් හෝ දෙකක් තව ඇති.එතන ඉන්න කණ්ඩායමෙන් එ කණ්ඩායමෙනුත් එක්කෙනෙක් මම වෙලා තියෙනවා.එනිසාම මම හිතනවා අද අපිට විදුලි පද්ධතියට යම් දෙයක් එකතු කරන්න පුලුවන් ආඩම්භරකාර අපේ ගරු මන්ත්‍රිවරු ඉන්නවා.සමහරු කුලියට ගෙදරක පදිංචිවෙලා හිටියත් ණය වාරිකය අඩුනම් එ බිල ගෙවන්නේ කුලියට ගන්න කෙනානම් ණයවාරිකය දෙන ඔහුට පුලුවන් එ ගෙදරකින් වෙන ගෙදරකට යනකොට එ පද්ධතිය ගලවගෙන ගිහිල්ලා සවිකරගන්න.එහෙම ප්‍රශ්ණයක් මේකේ නැති එකක් නිසා මම හිතනවා මේ යෝජනාවේදි වඩාත්ම සැලකිලිමත් වුනේ අපේ ගරු සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රිතුමාත් සමහර මන්ත්‍රිවරුත් කිව්වා ණය වාරික මත නිවාස හැදිම එ අයට යම්කිසි විදියකට මේකේ හානියක් වෙයිද කියලා.මෙහි වැඩියෙන්ම වාසිය තියෙන්නේ ඔවුන්ට.එකට හේතුව තමයි ඔවුන් ණයක් ලබාගෙන ගෙයක් හදනකොට රජය පිළිඅරගෙන ඉවරයි මොහුට මුදල් නැතිනිසයි මුදල් ලබා ගන්නේ එහෙමනම් පද්ධතියට එකතුකිරිමේදි මොවුන්ට තමයි වැඩියෙන්ම අවස්ථාව දෙන්න ඕන කියන එක අපි ආණ්ඩුවට මතක් කරන්න ඕන.එකෙන් තමයි වැඩියෙන්ම වාසිගන්න පුලුවන් වෙන්නේ.එ නිසා මම හිතනවා මේ යෝජනාවේ අවසාන එක තමයි මේකට බලපෑමක් නැහැ හැබැයි ලබන සතියේ ඉදලා ගොඩනැගිලි අයදුම්පතක් ලබාගැනිමේදි එකට එකගතාවය තියෙන අයට අනිවාර්යෙන්ම රවි මන්ත්‍රිතුමා කිව්වා වගේ ඩිසයින් කරන්න වෙයි.මොකද ගමන් කිරිමේ මාර්ගයත් සමගම වැඩියෙන්ම යුන්ට් පමාණයක් නිෂ්පාදනය කරන්න පුලුවන් වෙන ආකාරයට සැලසුමක් හදන්න වෙයි.එ නැතත් දැන් තියෙනවා ඕන තරම් ක්‍රම කනු 4ක් 5ක් උඩ ගරාජ් පවත්වාගෙන යන්න මිනිස්සු අද පැනල් සවිකරලා එවා සිල් කරලා වතුර කාන්දු නොවෙන විදියට අද ගරාජ් පවත්වන තැන් ඕන තරම් තියෙනවා.අද වැවේ, ගගේ අද එ වතුර මට්ටමට උඩින් සූර්ය කෝෂ පද්ධති සවිකරන යුගයක මම හිතනවා මේ සදහා අපි කුමන හෝ රජයක් අපි සමහර සමහර තින්දු ගනිද්දි තිබුනේයහපාලන අණ්ඩුව.හැබැයි අපිට වුවමනාව තිබුනේ නැහැ යහපාලනයද එනිසා අපි මේවා කරන් ඕන නැද්ද කියලා අපිට තේරුනේ නැහැ.අපි කල්පනා කලේ මොරටුව මහා නගර සභා බලප්‍රදේශයේ ඉන්න ජනතාවට මෙයින් යමක් වෙනවානම් පාලකයෝ කවුරු වුනත් අපිට ප්‍රශණයක් නැහැ කියලා.නිශාන්ත ප්‍රදිනාන්දු මන්ත්‍රිතුම කිව්වා හරි එක කැබිනට් එකේ ඉදගෙන පුරසාරම් දොඩ දොඩ අපි දෙන්නේ නැහැ ඉන්ධන එනිසා විදුලිය කපන්න වෙයි කියලා යම් ඇමතිවරයෙක් කියනවා කොහොමහරි විදුලිය ලබාගන්න කියලා තව ඇමතිවරයෙක් කියන එක ජනතාවට පලක් නැහැ.එකනිසා අවශ්‍යතාවය වෙලා තියෙන්නේ පද්ධතියට එකතුකරන ප්‍රමාණය වැඩිකිරිම සදහා සාකච්ඡාවක් හදා ගැනිම.එ සාකච්ඡාව කැබිනට් එකෙන් තාම ආවේ නැහැ.එකනිසා මම හිතනවා එ සාකච්ඡාව ඉක්මණින් එන්න ඕනා.එ සාකච්ඡාව හැදිම සදහා මම හිතනවා මෙය හොද තොතැන්නක් වෙයි කියලා.එ කොතැන්නත් එක්කම මම හිතන්නේ ගරු මන්ත්‍රිවරුනේ අනුකුල සහතික ලබා දිමේදි ඔබට මම මේ කියන්නේ සමහර වෙලාවට ඔබ නොදන්නවා ඇති එය අනුකුලතා සහතිකය ලබාගන්න සමහරක් එවා පිළිබදව අපිට තියෙන්නේ පුදුමාකාරවු මානුෂිකත්වයෙන් කටයුතුකරන්න වෙලා

තියෙන තැන්වලදි අපි අනුකුලතා සහතිකය ලබා දුන්න එවායේ වැරදි තියෙන්න පුලුවන්.හැබැයි අපිට වුවමනා වෙලා තියෙන්නේ සමහර අය හිතනවා ගෙයක් කරලා අනුකුලතා සහතිකය ලබාගැනිමේදි අදහස්වෙන්නේ ඇත්තටම ඔහු අනුකුල සහතිකය ලබාගෙන එ ණය ගන්න යන්නේ මොකටද ගෙයකට ණයක් ගන්නවා කියලා කරන්න යන්නේ මොකටද බිම් කට්ටියක් අයදුම්පතක් අනුමතකරලා කරන්න යන්නේ මේ සියලු දේ ගෙයක් ගොඩනැගිමටම පමණක් නෙමෙයි.එනිසා එ පිළිබද අවබෝධය අපිට තියෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා මේකට පැහැදිලිකරගැනිමක් කරන්න. දැන් අපි සැලැස්ම ඉදිරිපත් කරනවානේ ඉදිරිපත් කරනකොට ඔය සැකැස්ම තියෙනවාද කියලා බලන එකත් වරදක් නැද්ද අනුකුලතා සහතිකය දෙන කොට ගේ හදලා ඉවරනේ එතකොට බිල්ඩින් ප්ලැන් එක සබ්මිට් කරන කොටම මේකේ වුවමනාව තියෙන මනුස්සයා හදුන ගත්තොත් තව මොටිවෙට් කරන්න පුලුවන්නේ.එතකොට කොහෙද හිටවන්නේ කියලා එකත් මම හිතන්නේ නිවැරදිවෙන්න ඕන කියන එක තමයි මගේ අදහස.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා නැහැ නැහැ මම කලින් කිව්වේ ප්ලැන් එකට ගොඩනැගිලි අයදුම්පත ගන්න තැන ඉදලා මේක නිවැරදි වෙන්න ඕනැ. ඒ කියන්නේ අපි දෙනවා පත්‍රිකාවක් මේවගේ දෙයකට ඔබ කැමතිනම් එකට සරිලන විදියට ඔබේ ප්ලැන් එක සකස් කරන්න.මම එක පැහැදිලි කරලා කිව්වා.එනිසා මම හිතනවා මේ යෝජනාවේ අවසානය බලාපොරෝත්තුවෙලා තියෙන්නේ විදුලි පද්ධතියට තමන්ට පුලුවන්වන ආකාරයෙන් මම එක කරපු කෙනෙක් විදියටත් මම හිතන්නේ ඔසද මන්ත්‍රිතුමා නිලංක මන්ත්‍රිතුමා එ ඇරෙන්න මේ මන්ත්‍රිවරුන්ගේ අතරත් ඇති සියලු දෙනාගේම අභිලාශයවෙලා තියෙන්නේ පද්ධතියට යම් දෙයක් එකතු කිරිම. එනිසා එ සතුට ලබන අය වගේම එ සතුටට කැමති බොහෝ පිරිස් ඉන්නවා.ඔවුන්ට අවස්ථානුකුලව අවස්ථාව ලබාදිම සදහා මේ යෝජනාවෙන් බලාපොරෝත්තුවෙනවා.

ගරු මන්ත්‍රිතුමා, මේ යෝජනාවේ විවිධ ප්‍රශ්ණ විවිධ ගැටලු මතුවෙයි කියලා හිතපුතැන් තියෙනවානම් එ තැන් සියලු දේ නිවැරදි කිරිමට යටත්ව එ කියන්නේ නිවැරදි කරගන්න ඕන කාරනා උදාහරණයකට ගත්තොත් දැනට අපේ කරලා තියෙන එවායේ ගෙවල් හදලා තියෙන එවට අනුකුලතා සහතිකය ලබා ගැනිම සදහා අපි අනිවාර්යෙන්ම දෙන්නේ නැහැ කියන තැන නෙමෙයි අපි අද ඉදලා යම් ගොඩනැගිල්ලක් ඉදිරිපත් කිරිම සදහා කරන දෙයකට ඇර මේක හෙටින් පස්සේ නැත්නම් ලබන සතියෙන් පස්සේ ඉදිරිපත් කරන එකකට ඔහුගේ එකගතාවය මත ඔහු කැමතිනම් එකගතාවය මත කරන්නට අපි එකගවෙනවා මොකද එ ඇරෙන්නට අපිට පුලුවන් කමක් නැහැ අකමැත්තේන් දෙයක් කෙනෙකුට දෙන්න.හැබැයි මම ඔබට මතක් කරන දෙයක් තියෙනවා මේන්න මේ දේ ඔබ කවුරු කොහොම කිවුවත් අපිට පුලුවන් කමක් නැහැ නාගරික සංවර්ධන අධිකාරියෙන් අපිට පනවලා තියෙනනිති රිති වලට අනුකුල නොවන විදියට ගෙවල් හදන්න උදාහරණයකට විවෘත ඉඩකඩ හැබැයි එතකොට කියන්න පුලුවන් මට එහෙම දෙයක් කරන්න බැහැ.මගේ ඉඩම පොඩි හැබැයි එත් අනුමත කරලා දෙන්න කියලා කියන්න බැහැ.හැබැයි මින්ස්සු නිතියට පුරුදුවෙන්නේ යම් දෙයක් ක්‍රියාවට නගන්න ගියොත් විතරයි.හෙල්මට් නැතිව අල්ලන්නේ නැත්නම් හෙල්මට් දාන්නේ නැහැ.හෙල්මට් දාන්නේ ජීවිත ආරක්ෂාකරගන්න මිසක් පාරේයන පොලිස්කාරයාට පෙන්න නෙමෙයි.එක නිසා මම හිතනවා විශේෂයෙන්ම මෙනන මේ කාරණය මුල්කරගෙන යම් දෙයක් ඉදිරිපත් කිරිම තුල එකට එකගවෙන්න පුලුවන්.එහෙම නැතිව දැන් UD එකේ එක එක සැලසුම් දැන් ලංකාවේම පර්චස් 02ටත් ගොඩනැගිලි අනුමත කරන්න පුලුවන් ආයතනය තියෙන්නේ මොරටුව මහා නගර සභාව

විතරයි.කොළඹටත් නැහැ.හැබැයි එවා නිකම්ම ආවේ නැහැ.එවා බොහෝම අමාරුවෙන් අමාරුවෙන් ගත්ත දෙවල් හැබැයි ඒ කියලා එදෙකේ නාගරික සංවර්ධන අධිකාරියට යටත්වෙන සැලසුමක් අපිට නිර්මාණය කරන්න බැහැ.ඒ නිසා නිතිය කියන්නේ එකක් එකට එකගවෙන්න හදන එක තව එකක්.එකනොවිකරන එක තව එකක් එනිසා මේ ඔක්කෝම එකකට එකක් ලිහිණි මන්ත්‍රිතුමිය කියනවා වගේ එකකට එකක් ගැලපෙන්නේ නැහැ නෙමෙයි ඔක්කොම ගැලපෙනවා.ලිහිණි මන්ත්‍රිතුමිය ගේ හදලා තියෙන්නේ ආණ්ඩුව දාලා තියෙන නිර්ණායක එක්ක කියලා මම විශ්වාස කරනවා.හැබැයි ලිහිණි මන්ත්‍රිතුමිය නීතිවිරෝධී ගොඩනැගිල්ලක් හැදුවානම් ඒ හදපු ගොඩනැගිල්ල අනුමත කරන්න පුලුවන් එකක් තිබුනොත් දඩයකට යටත්වෙලා අනුමත කරතැහැකි.එහෙම නැත්නම් අනුමත නොවු ගොඩනැගිල්ලක් විදියට එකට නිතිමය කටයුතු කරතැහැකි.සියලු දේ මේකේ ඇතුලේ තියෙනවා.ඒ සියලු දේ නැතිව නෙමෙයි.නමුත් අපිට වුවමනාවෙලා තියෙන්නේ අනුකුලතා සහතිකය ගත්තේ නැති ගේ හොයාගෙන යන්න නෙමෙයි.මේ යෝජනාවෙන් පස්සේ එන කෙනාට කැමැත්තක් තියෙනවානම් ඒ කැමැත්ත අනුව වැඩකිරිම තමයි මේ යෝජනාවේ අරමුණ. ඒ නිසා ඔබ සියලු දෙනාගේ ඡන්දය බලාපොරෝත්තු වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා යම් කිසි අදහසක් ප්‍රකාශකරන්න කැමතියි.මුලින් කිව්වා වගේ ඔබගේ පැහැදිලි කිරිමයි යෝජනාවයි අතර පරස්පරතාවයන් ගණනාවක් අපිට ගම්‍යවෙනවා.අනුකුලතා සහතිකය කියන එක මෙතනින් අයින් වෙන්න ඕන.අපි සංශෝදනයක් කරනවා මේ සංශෝදනය මෙන්න මේ ආකාරයට වෙන්න ඕන.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

මෙම යෝජනාවට පක්ෂ නැත්නම් ඔබතුමා විරුද්ධවෙන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අනුකුලතා සහතිකය අපි ගත්තානේ දැන් මෙතන තියෙන ප්‍රශ්ණය අනුකුලතා සහතිකය ඉල්ලනකොට හදිසියෙවත් මෙයා ඉන්ෆෝර්ම් කරලා නැත්නම් අනුකුලතා සහතිකය නොදෙන එකක් නැහැනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්තිතුමා, පැහැදිලි කරලා කිව්වානේ එක නිසා ඔබතුමාලා විරුද්ධ වෙනවානම් විරුද්ධ වෙන්න.

අංක 05(01) දරණ යෝජනාවට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | |
|---|---|---|
| 01. නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |

04. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
06. මහා නගර සභා මන්ත්‍රී - එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා
07. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
08. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා
09. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
15. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය
26. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
31. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශනි ප්‍රියන්ත්‍රිකා කුරේ මහත්මිය
32. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
33. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
34. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
35. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
36. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

අංක 05(01) දරණ යෝජනාවට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා

අංක 05(01) දරණ යෝජනාවට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය දීමෙන් වැළැකී සිටියහ.

01. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

02. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
03. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

**අංක 05(01) දරණ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(මෙම අවස්ථාවේදී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ.
01. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා)

06 **<u>2022 ජනවාරි මස ස්ථාවර කමිටු වාර්තාවේ තීරණයන් සලකා බැලීම.</u>**

06(01) 2022.01.10 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2022.01.10 දින පැවති ආයතන හා නිතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(02) 2022.01.11 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2022.01.11 දින පැවති ඉඩම් හා නගර සංවර්ධන පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(03) 2022.01.11 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන කමිටුවේ 3(3) කාරණය ගැන පොඩි අදහසක් තියෙන්නේ.මේ යෝජනාව ඉදිරිපත් කරලා මේවෙනකොට අවුරුද්දයි මාස02 කට වැඩි කාලයක් ගිහිල්ලා තියෙනවා.පුටු ලබාදෙන ලෙස තමයි මේ ඉල්ලිම කරලා තියෙන්නේ.හැබැයි අවුරුද්දකට වැඩිකාලයක් ගිහිල්ලත් තාමත් එ මට්ටමේමයි.එනිසා ඔබතුමාගෙන් මේ ඉල්ලිම කවදාවෙනකොට ඉවරකරගන්න පුලුවන් වෙයිද කියලා දැනගන්න කැමතියි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය මිලග කමිටුවට දිනය සමගම ඉදිරිපත් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මහජන උපයෝගිතා කමිටුවට ගිය වසරේදි යෝජනාවක් ඉදිරිපත් කරා කාන්තාවන් සම්බන්ධයෙන් යම්කිසි ව්‍යාපෘතියක් කරන්න එක අනුමතවෙලා එක මුදල් කමිටුවටත් ගියා.ඔබතුමාගෙන් දැනගන්න කැමතියි මේකට මුදලුත් අනුමත වෙලා තියෙන නිසා ක්‍රියාත්මක කිරිමට හැකියාවක් තියෙනවාද කියලා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමිය ක්‍රියාත්මක කරන්න ගිය ක්‍රමවේදයතුල ප්‍රශ්ණයක් මතුවෙලා තිබුණා. ආයේ එක අපි මේ අවුරුද්දේ සාකච්ඡා කරලා කමිටුවෙන් ක්‍රියාත්මක කරනවා.

2022.01.11 දින පැවති මහජන උපයෝගිතා ප්‍රජා සංවර්ධන ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(04) 2022.01.12 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2022.01.12 දින පැවති පරිසර, සෞඛ්‍ය සනිපාරක්ෂාව පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(05) 2022.01.12 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයක් සලකා බැලිම.

2022.01.12 දින පැවති ක්‍රිඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සහා සම්මත විය.

06(06) 2022.01.13 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

<u>මහා නගර සභා මන්ත්‍රි – එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි, කර්මාන්ත කමිටුවේ 05 (01) සිට 05 (13) දක්වා කරුණු වලට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. අනෙක් කරුණු වලට අපි එකගයි. අනුමැතියට යටත්ව කරලා තියෙන ව්‍යාපෘති සම්බන්ධව අපිට එකගවෙන්න බැහැ.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රිතුමා, එහෙම කරන්න ගියෝත් මට වෙන්නෙත් ආයේ ඔය පැත්තට එන්න. මේක කරන්න පුලුවන් දෙයක් නෙමෙයි. මොන සභාවක වුනත් මේ විදියට වැඩකරේ නැත්නම් වැඩකරන්න හම්බවෙන්නේ නැහැ. එක හොයලා බලන්න කරලා තියෙන එකේ වරදක් තියෙනවානම් එ වරදට විරුද්ධ වෙන්න. මෙයට විරුද්ධවෙලා වැඩක් නැහැ. මෙහි විරුද්ධ වෙන දිශාව හොයාගෙන විරුද්ධ වෙන්න. මේකට නෙමෙයි විරුද්ධ වෙන්න ඔන. ඔහොම ගියොත්

පළාත් පාළන ආයතනවලට වැඩකරන්න පුලුවන් කමක් හම්බවෙන්නෙ නැහැ. උදාරහණයකට අපි කියමුකො දෙසැම්බර් මාසෙ නැත්නම් ඔක්තොබර් මාසෙ මුදල් එවනවා. අපි හිතන්නෙ එවන්නේ සජිත් ප්‍රේමදාස ගරු මැතිතුමා ඔක්තොබර් මාසේට එවනවා මේක කරන්න කියලා.හරි ප්‍රොසිඩ් එකට යනකොට ඉස්සේල්ලාම ඇස්තමේන්තු හදන්න ඕන. ඇස්තමේන්තු අනුමතකරන්න ඕන. ඊට පස්සේ ඇස්තමේන්තුව ප්‍රධානය කරන්න ඕන. ගිවිසුම් අත්සන් කරන්න ඕනෑ. මේවාට මාස හතරක් පහක් යනවා. වැඩේ කරන්න හම්බවෙන්නේ නැහැ. දැන් ඔබතුමන්ලාගේ එකක් කරනවා අපි කියනවා ඔබතුමන්ලාගේ අය විරුද්ධ නිසා මේක කරන්න බැහැ කියලා. ඕක දෙපැත්තට දොලනය වෙනවා. අපි ඔය පැත්තේ හිටියාම අපි රවිනාත් මහත්තයාට සහයෝගය දිපු එවා තියෙනවා සහයෝගය නොදිපු එවා තියෙනවා. මේවා වැරදියි ක්‍රියාවන්.

2022.01.13 දින පැවති කර්මාන්ත හා ඉදිකිරිම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(07) 2022.01.13 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2022.01.13 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමණාකරනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(08) 2022.01.18 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

2022.01.18 දින පැවති ඵලදායිතාව සහ මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම තිරණයන් එකමතිකව සභා සම්මත විය.

06(09) 2022.01.18 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ තිරණයන් සලකා බැලිම.

**මහා නගර සභා මන්ත්‍රි - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි, ඇමුණුම අංක 02 අත්තිකාරම් විශ්ලේෂණය තියෙනවා සුළු මුදල් අත්තිකාරම් කියලා රු 25,000.00 ක් මම කාරුණිකව ඉල්ලා සිටිනවා මින් ඉදිරියට එක ඉදිරිපත් කරනකොට කාල සිමාව සඳහන් කරන්න කියලා. මොකද සුලු මුදල් ගොඩක් කාලේකට තියාගන්න බැහැ. අපි දන්නැහැ මේක කොපමණ කාලයක්ද කියලා. එ නිසා කාලය සඳහන් කරන්න. දෙවෙනි එක ඇමුණුම අංක 04 එකෙත් නිවැරදි කිරිමක් කරන්න තියෙනවා මේ දශම ගනන් බින්දුව එතන පොඩි වෙනසක් තියෙනවා. එක නිවැරදි කිරිම් කරන්න ඕන. මුලු එකතුව ඇවිල්ලා මිලියන එකයි.නමුත් මුලු වියදම කියලා දාලා තියෙනවා එකයි බින්දුවයි කමා දශම තිත මිලියන එක මිලියන 10 ක් වගේ පෙන්නුම් කරනවා. එක නිවැරදි කිරිමක් කරන්න ඕන. අනිත් එක අංක 36 එකේ ඇමුණුම අංක 18 මිලියන 17 ක් ඇස්තමේන්තු කරලා ට්‍රැක්ටර්වලට එතන

යුනිට් කියද කියලා සඳහන් කරලා නැහැ. ට්‍රැක්ටර් කොපමණද? තව කරත්ත වලට 25,0000.00ක් වෙන් කරලා තියෙනවා. එකත් යුනිට් ගාන දාලා නැහැ කොච්චර ගන්නවාද කියලා. නිකම් බ්ලැන්ක් තියෙන්නේ. අනික් එවල එකක ගණන් දාලා තියෙනවා. කොච්චර ගන්නවාද කියලා අපි සඳහන් කිරිමක් නැහැ.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමිය කියන එක අපි නිවැරදි කරන්නම්

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි, එවගේම අංක 37 ඇමුණුම අංක 19 එකෙත් තියෙනවා සඳහන් කරලා අපේ මන්ත්‍රිවරුන්ගේ විවේකාගාරයට අපි පුටු ගෙනල්ලා දෙනවා.එවගේම තව ශිතකරනයක් ගන්නවා. ටිවි එකක් ගන්නවා. එ ඔක්කොම සඳහන් කරලා තියෙනවා. අපි කැමතියි අපෙ මන්ත්‍රිවරුන්ට පහසුකම් ලබාදෙනවානම් මට දැනගන්න ඕන විවේකාගරය කියන්නේ අර කැන්ටිම උඩ තියෙන එකද නැත්නම් මේ කාර්යාලයද කියලා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය,කැන්ටිම උඩ තියෙන විවේකාගාරය.

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි, එතකොට අපි පල්ලේහා තියෙන ඔෆිස් දෙක ගැන ටිකක් අවධානය යොමු කරොත් හොදයි නේද? අපිට පල්ලේහා තියෙන කාර්යාල දෙකට පුටු ටිකක් ලබා දෙනවාද දැන් තියෙන තත්වය තමයි දෙන්නෙක් ආවොත් තව කෙනෙක් හිටගෙන ඉන්නවා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය,ඒ සඳහා අවශ්‍ය පුටු සපයා දෙන්නම්.

**මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමණි 07වෙනි කාරණාව සේවක ණය මේ සභාවේ තින්දුවකුත් තියෙනවා මාසිකව අපි කොපමණ මුදලක් ගෙවනවාද කියන කාරණාව දැන් නිකම් අපි මිලියන තුනක් සේවක ණය ආදායම් පැත්තට අරගෙන තියෙනවා.සේවක ණය කපා ගත්තොත් මිලියන 3.1 තියෙනවා.හැබැයි මිලියනයයි ගෙවන්නේ.ආපහු අපේ තින්දුව නොසලකා හරිමින් තමයි යන්නේ.සේවක ආපදා ගෙවිමේදි ඔබතුමා පවා මැදිහත්වෙලා අපි අඩුම තරමේ මිලියන දෙකයි දශම පහක් ලක්ෂ විසිපහක්වත් ගෙවන්න ඕන කියන තින්දුව ගත්තා.

**නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ලබන වර ඉදලා මේක නිවැරදි කරලා අපිට ලැබීමත් එක්කම ගෙවන ප්‍රමාණය හා සමානව ගෙවීමට කටයුතු කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මම කියන්නේ ඔක නැවත නැවතත් කියන්න ඔන නැහැ පරිපාලනයට 31 කපලා තියෙද්දි 10 ක් ගෙවන්න එපා.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අද පවතින තත්වයත් එක්ක මුදල් කමිටුවට වාර්තාවක් දෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමණි ඊට අමතරව පොදුවේ ගෙවීම් පළිබඳව තියෙන ගැටලු ගණනාවක් නිසා අපි මුදල් කමිටුවට විරුද්ධ වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මුදල් කමිටුවේ අංක 10(3) පොඩි වැරද්දක් තියෙනවා මසිනා මන්ත්‍රීතුමිය කිව්වා.එක නිවැරදි කරනවානම් එකට අපි එකගයි.ඊට අමතරව අංක 03, 10, 12(2) 21, 33(1), 33 (2) 36 37 අපි නිහඬයි 19(1) විරුද්ධයි.27 විරුද්ධයි.අනෙක් එවාට අපි එකගයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමණි මුදල් කමිටුවේ අංක 11 සම්බන්ධව අපේ විරෝධතාවයක් තියෙනවා.එක ආවරණ අනුමැතියට යටත්ව සිදුකරන ලද කාරණාවක් නිසා.අංක 12(1) ගිය සභාවන් ගණනාවක අපි කථාකරා ත්‍රිරෝද රථ සම්බන්ධව ආදායමේ ලොකු අඩුවැඩි වීම් වෙනස්වීම් පරස්පරතාවයන් තියෙනවා.ලැබීම් සම්බන්ධව සාර්ථකව අපිට දකින්න බැහැ.ඊට වඩා වැඩිමුදලක් සභාවට ලැබිය යුතුයි කියන මතයේ තමයි අපි ඉන්නේ.එනිසා 12(1) කාරණයට අපේ විරෝධය.එවගේම 14 (1)සිට(10) දක්වා එතනත් ආවරණ අනුමැතියට යටත්ව සිදුකරපු ගෙවීම් සම්බන්ධව අපිට එකග වෙන්න බැහැ.16(1) (6) එ ආකාරයෙමයි.19 (1) (2) නිතිමය කටයුතු සදහා ගෙවන ලද විශාල ප්‍රමාණයක් තියෙනවා එකට අපිට එකගතාවයක් දක්වන්න බැහැ.එවගේම 21 නගර සභාවේ බදු සම්බන්ධව සිස්ටම් එකෙන් අයින් කරලා තියෙනවා එනිසා අපිට එකටත් එකගවෙන්න බැහැ.විශේෂයෙන්ම 29 ආදායමක් උත්පාදනය කර ගැනිමක් ආදායම් උත්පාදනය කර ගන්න අපි කැමතියි.නමුත් එ ආදායම උත්පාදනය කරගැනිම සඳහා කඩ කාමර 41 ක් ලබා දිමේදි අයකලයුතු මුදල් ප්‍රමාණයක් සම්බන්ධව සභාවේ අනුමැතියක් මීට පෙර ලබාගෙන තිබුනේ නැහැ.එ කඩ 41 සම්බන්ධව අපේ නත්තල් උත්සවය හා අවුරුදු උත්සවය සමය වෙනුවෙන් එ වැඩ පිළිවෙල හොදයි ආදායම ලබා ගැනිම එ ප්‍රවනතාවය ගැන සතුටුයි.නමුත් එ ලබාගත්ත මුදල් සම්බන්ධව එකේ යම් එකගතාවයක් මේ සභාවේ තුල සාකච්ඡාකරලා මීට වඩා ක්‍රමවත්ව එක සිදුවුනානම් සහ අංක 29 යටතේ එ ලැබීම් සහ ගෙවීම් සම්බන්ධව නිසි සමාලෝචනයක් නැත්නම් එ ගෙවන සම්පුර්ණ විස්තරයක් නැතිනිසා 29 යට එකගවෙන්න බැහැ.එවගේම 33(1)(2)අපේ විරෝධතාවය අනෙක්වට අපි එකගයි.

<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා 19(1)(2) ගැන කථාකරා. මෙහි කථාකරන්නේ නගර සභාවේ සුරක්ෂිතභාවය හෝ නගර සභාවේ අයිතිය වෙනුවෙන් වියදම් කරන නිතිඥ ගාස්තු මේ ඊළග

එකතමයි ඔබතුමන්ලා දන්නවා ඔබතුමා එ වකවානුවෙත් හිටියා මේ නගර සභාවේ යම් අවස්ථාවකදි මේ මහ නගර සභාවේ යම් රියදුරේකුගේ වේච්චාවු වරදකදි එ රියදුරාට ගෙවන්න තියෙන වන්දියත් එක්ක අපි එක නොගෙවීම තුල ඔබතුමන්ලා දිගින් දිගටම අපේ ගිණුම පවා අත්හිටෙව්වා.අත්හිටෙව්වාට පස්සේ ගෙවන්න තියෙන මුදල වුනා එ රියදුරාට ලක්ෂ තිහකට වැඩි ප්‍රමාණයක්.ඔබතුමාලා ඔක්කොම එකතුවෙලා අපිත් එකතුවෙලා එක කරගන්න බැරි නිසා එක කපමු කියලත් කිව්වා.ඔඩිට් කුවරිත් ආවා එත් අපි එක ඔහුගෙන් අයින් කරා.හැබැයි එවට එකගයි.පාට බලන්න එපා එවට එකගයි ඔබතුමාලා විරුද්ධවේන්නේ සමන්ලාල්ගේ නඩුවට ගිහිල්ලා.එහෙම නැත්නම් රවිනාත් මහත්තයාගේ නියෝජ්‍ය නාගරික සමන්ත සිල්වා මැතිතුමගේ නඩුවට ගිහිල්ලා නෙමෙයි.මේ විරුද්ධවෙලා තියෙන්නේ මේ සභාවේ සභාවේ අයිතිය ආරක්ෂාකරන්න ගිය එවා ඔබතුමන්ලා ඕවට විරුද්ධවනකොට ඔබතුමන්ලා බලලා විරුද්ධවෙන්න.විරුද්ධවෙන්නම් වාලේ විරුද්ධවෙන්න එපා. ඔක්කොටම විරුද්ධවුනත් කමත් නැහැ.නම් කියලා කියන කොට19(1)ඇයි මේ විරුද්ධවෙන්නේ නිතිඥ මහත්තයා අපිට ගාන කිව්වාට පස්සේ අපිටත් කියක් හරි තියාගන්න කියලා ගාන වැඩිකරලා යැයි.විරුද්ධවෙන සාධක තියෙන්න ඕන.ඔබතුමාගේ විරුද්ධවීම පිළිගන්නම් හැබැයි මේක හොද නැහැ.මේ පුටුවලට කවදාහරි ඔබතුමන්ලා එන්න ඕන.

**<u>මහා නගර සභා මන්ත්‍රී – එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි දැන් ඔබතුමා පැහැදිලි කරා රියදුරු මහත්තයාගේ කාරණාව එක නඩුවලට යටත්වෙන්නේ නැහැනේ.

**<u>නගරාධිපති - ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, නඩුවකින් තමයි එයාගෙන් අයකරගන්න කියලා කිව්වේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී – එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමණි දැන් මෙතන නඩුව සම්බන්ධව විස්තරාත්මකව සදහන් විමක් නැහැ.නිතිමය ගාස්තු හැටියට තමයි යන්නේ.

2022.01.18 දින පැවති මුදල් පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු තිරණයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

| | | |
|---|---|---|
| 01. නගරාධිපති | - | ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු මහතා |
| 02. නියෝජ්‍ය නගරාධිපති | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 03. මහා නගර සභා මන්ත්‍රී | - | ජී.එම්.සුරංග නිශාන්ත අපෝන්සු මහතා |
| 04. මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 05. මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 06. මහා නගර සභා මන්ත්‍රී | - | එච්.ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු මහතා |
| 07. මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 08. මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා |
| 09. මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 10. මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ඩබ්.ඩී.රන්දු නිරෝෂණ මහතා |
| 11. මහා නගර සභා මන්ත්‍රී | - | එම්.නාලනී ප්‍රේමවතී ප්‍රනාන්දු මහත්මිය |
| 12. මහා නගර සභා මන්ත්‍රී | - | පී.අශෝක ඉන්ද්‍රතිලක ප්‍රනාන්දු මහතා |

13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.මහේෂ් රුක්මාල් ඩයස් මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී.යසන්ත රන්සිරි ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එස්.ඩබ්.එම්.නිෂා ඉරානි විජේවික්‍රම මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.අනුර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - යූ.ලලිත් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - එෆ්.බී.නිලංක සිල්වා මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - එම්.කේ.පී සුසන්ත පෙරේරා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ප්‍රිනිත් ක්‍රිෂාන්ත විජේරත්න මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - එම්.කුමාර රාජරත්න මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - එම්.ජයමාල් ශ්‍රියාරත්න මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.මල්ලිකා ජයවතී ප්‍රනාන්දු මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එච්. උජිත් ක්‍රිෂාන්ත කල්දේරා මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - ඒ.දීපා චාන්දනී ආරියවංශ මහත්මිය
27. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.මැක්සි ජේ ප්‍රනාන්දු මහතා

2022.01.18 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 19(1),27 ට තිරණයන්ට විරුද්ධවත්, අංක 03,10,12(2), 21,33(1), 33(2),36,37 යන කරුණු වලට නිහඬවත්, අනෙකුත් සියලු කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - රවිනාත් ජයශ්‍රී ගුණසේකර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍ර ගාමිණී පීරිස් මහතා
05. මහා නගර සභා මන්ත්‍රී - ආර්.එම්.ඒ.දෝන දිලාශිනී මහත්මිය
06. මහා නගර සභා මන්ත්‍රී - එම්.සුදර්ශණි පියන්තිකා කුරේ මහත්මිය
07. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසිනා බක්කර් මහත්මිය

2022.01.18 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 11, 12(1),14(01) සිට14 (10) දක්වා,16(01) සිට 16 (6) දක්වා,අංක 21,19(01), 19(02), 21, 29, 33(1), 33(2)ට තිරණයන්ට විරුද්ධවත් අනෙකුත් සියලු කමිටු තිරණයන්ට පක්ෂවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිසර රසාංජන මෙන්ඩිස් මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ජී.එම්.නිරෝෂන් රුවමාල් අපෝන්සු මහතා
03. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
04. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
05. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ශ්‍රියානි හේමලතා ප්‍රනාන්දු මහත්මිය

2022.01.18 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.

01. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.පී.ප්‍රභාෂනි වික්‍රමසිංහ මහත්මිය
03. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේෂ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
04. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා

2022.01.18 දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලු කමිටු තිරණයන් වැඩි ඡන්දෙන් සභා සම්මත විය.

## 07 ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තා

**ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

2021.01.18 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 04 යටතේ 2021 දෙසැම්බර් මාසයට අදාල මුල්‍ය වාර්තා ඇමුණුම -02 ලෙස ඉදිරිපත් කර ඇත.

## 08 පුද්ගලික ස්වභාවයේ කරුණු

**08 (01) නියෝජ්‍ය නගරාධිපති - ඩී.සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමණි ඉතාම සතුටින් අපි මතක් කරනවා මේ අවස්ථාවේ අපි ඇත්තටම ස්තුතිවන්ත වෙනවා ගරු ජනාධිපතිතුමාට ඒවගේම අග්‍රාමාත්‍යතුමා ඒවගේම මුදල් ඇමතිතුමා සහ මේ රජයට විශේෂයෙන්ම මොරටුව ජනතාව වෙනුවෙන් අපේ ගෞරවණිය ස්තුතිය පුදකරනවා. හෙට දින ආරම්භවන අයවැයෙන් වැඩ ලක්ෂයක් වැඩ සටහන මොරටුවේ ක්‍රියාත්මක වෙනවා හෙට උදැසන 8.52ට සුභ මොහොතින්. එසඳහා රු ලක්ෂ 5000 කට අධික මුදලක් මොරටුව ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් යොමුකරලා තියෙනවා. එනිසා අපි මේ රජයට මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාට අපේ ගෞරවණිය ස්තුතිය පුද කරනවා.එ සඳහා අපිට නායකත්වය ලබා දෙමින් කටයුතුකරන ඔබතුමා ඒවගේම ප්‍රේමනාත් සි දොලවත්ත සංවර්ධන කමිටු සභාපතිතුමාට පළාත් සභා මන්ත්‍රිවරු ඇතුලු අපේ නාගරික මන්ත්‍රිවරු සියලුදෙනාට මේ අවස්ථාවේ අපේ ගෞරවනිය ස්තුතිය පුදකර සිටිනවා.

**08 (02) මහා නගර සභා මන්ත්‍රී - එස්.බේසර රවීන්ද්‍ර ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමණි මොරටුව කියන්නේ පුරෝගාමීත්වයේ නගරය එකදි පසුගිය දිනයක එක්තරා පුද්ගලික මාධ්‍යයක රියලිටි ෂෝ එකක් පැවැත්වුනා.එකදි අපේ මොරටුවේ තරුණයෙක් ගායන අංශයෙන් තරග වැදුනා. මම හිතන්නේ එකෙදි කිසිම පක්ෂ පාට භේදයකින් තොරව ආගම් භේදයකින් තොරව මොරටුවේ ප්‍රධාන පුරවැසියා විදියට ඔබතුමාගෙන් එ තරුණයාට විශේෂ දායකත්වයක් ලබා දුන්නා. ඒ දායකත්වය මතම තරුණයා තුන්වෙනි ස්ථානය ලැබුවා. රජිත භානුක මොරටු පුරවැසියෙක් විදියට නාගරික මන්ත්‍රිවරයෙක් විදියට එ තරුණයාට සුභාශිංශන පුදකරනවා.එවගේම විශේෂයෙන් එ තරුණයා එ තත්වයට පත්කිරිම සම්බන්ධව නගරයේ ප්‍රධාන පුරවැසියා විදියට ඔබතුමාටත් ස්තුතිය පුදකරනවා.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමණි පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් කමිටු රැස්වීම් සූම් තාක්ෂණය ඔස්සේ තියන්න පුලුවන්ද කියලා අහන්න කැමතියි.

**ගරු නගරාධිපති - ඩබ්ලිව් .සමන්ලාල් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමිය කමිටුවලට එන්නේත් නැතිව සොයාගන්න පුලුවන්වෙයිද දන්නෙනැහැ.එක ප්‍රායෝගික නැහැ.අපිට අත්‍යාවශය වෙන්නාවූ කමිටු කිහිපයක් තියෙනවා සෞඛ්‍ය කමිටුවත්, කර්මාන්ත කමිටුවත්, මුදල් කමිටුවත් විතරක් අපි කරනවා.අනෙක් එවා පිළිබඳව එතනදි අදාල වෙන්නාවූ කාරණ සෞඛ්‍ය කමිටුවෙත් කර්මාන්ත කමිටුවෙත් මුදල් කමිටුවෙත් යොමු කරලා සභාවට එවනවා. අනෙක් කමිටු ඔක්කොම තියන්නේ නැහැ.

## 09 වෙනත් කරුණු නැත.

සභාවේ වැඩ කටයුතු මෙතනින් අවසන් විය.

අ.කලේ/ ඩබ්.සමන්ලාල් ප්‍රනාන්දු
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2022.02.02 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදිය.